# 12 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2017 වසරේ සිට ක්‍රියාත්මක වේ.)




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ජාතික අධ්‍යාපන ආයතනය**

මහරගම, ශ්‍රී ලංකාව

**Web**| www.nie.lk **Email**| info@nie.lk

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපෑල : info@nie.lk

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)


ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

බුද්ධ ධර්මය

12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

C ජාතික අධ්‍යාපන ආයතනය

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන්ගේ හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දත ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **විෂය සම්බන්ධීකරණය** | : | පූජ්‍ය උඩුගම සුදස්සී හිමි,<br>දෙපාර්තමේන්තු ප්‍රධාන,<br>ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**විෂය විශේෂඥ උපදෙස් :**

| | |
|---|---|
| **අතිපූජ්‍ය ගන්තුනේ අස්සජී මහානායක මාහිමිපාණන් වහන්සේ** | - විශ්‍රාමික කථිකාචාර්ය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය. |
| **මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි** | - විශ්‍රාමික මහාචාර්ය,<br>කැලණිය විශ්වවිද්‍යාලයය. |

**ලේඛක මණ්ඩලය :**

| | |
|---|---|
| **පූජ්‍ය නාඔටුන්නේ විමලඥාණ හිමි** | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>කැලණිය විශ්වවිද්‍යාලයය. |
| **පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** | - දෙපාර්තමේන්තු ප්‍රධාන,<br>ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපා.<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **පූජ්‍ය මඩාටුගම සුරක්ඛිත හිමි** | - ගුරු සේවය,<br>ශ්‍රී පේමානන්ද විද්‍යායතන පිරිවෙන,<br>මඩාටුගම. |
| **උදිත ගරුසිංහ මහතා** | - මහාචාර්ය,<br>කැලණිය විශ්වවිද්‍යාලයය. |
| **පී.ඒ. සරත්කුමාර මහතා** | - ගුරු සේවය<br>තක්ෂිලා මහ පිරිවෙන, කඩුවෙල. |
| **ආර්.එම්.තිලක් තුෂාර රත්නායක මහතා** | - ගුරු සේවය,<br>ශ්‍රී විමලධර්ම මහ පිරිවෙන, දන්ගොල්ල,<br>මහනුවර. |

**විෂය සංස්කරණය :**

| | | |
|---|---|---|
| **පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** | - | දෙපාර්තමේන්තු ප්‍රධාන,<br>ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා** | - | අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,<br>බත්තරමුල්ල |

**භාෂා සංස්කරණය :**

| | | |
|---|---|---|
| **ශ්‍රීනාත් ගණේවත්ත මහතා** | - | භාෂා සංස්කාරක |

**පරිගණක වදන් සැකසුම :**

| | | |
|---|---|---|
| **මංගලිකා විජේරත්න මහත්මිය** | - | ජාතික අධ්‍යාපන ආයතනය |

**විවිධ සහය :**

| | | |
|---|---|---|
| **එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය** | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| **ඩයස් අමරසිංහ මහතා** | - | ජාතික අධ්‍යාපන ආයතනය |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කාලීන අවශ්‍යතා පදනම් කොට 2009 වසරේ දී අ.පො.ස. (උ.පෙළ) පන්තිවල අදාළ විෂයමාලා වෙනස්කම්වලට අනුකූල ව තව දුරටත් නවීකරණයට භාජනය කරමින් 2017 වර්ෂයේ සිට පද්ධතිය තුළ ක්‍රියාත්මක වන 12 ශ්‍රේණිය සඳහා වූ විෂයමාලා වෙනස් වීම් සහිත මෙම ගුරු මාර්ගෝපදේශය ඔබ අතට පත් වනු ඇත.

නව සහස්‍රයේ අභියෝග ජය ගැනීමට වැර දරන ගුරු පරපුරට සාර්ථක ජීවන ගමනක් සඳහා මඟපෙන්වීම උදෙසා සිසුන් තුළ ප්‍රගුණ කළ යුතු නිපුණතා හා නිපුණතා මට්ටම් නිවැරදි පෙළ ගැස්වීමකට හා සවිස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීමකට මෙම ගුරු මාර්ගෝපදේශය භාජනය කොට තිබේ. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදක ව ඉටු කිරීම සඳහා ප්‍රබලතාවකින් යුතු ව පෙර අත්දැකීම් ද සැලකිල්ලට ගෙන මෙම ගුරු මාර්ගෝපදේශය විෂයමාලා සම්පාදකවරුන් විසින් ඔබ වෙත සංග්‍රහ කරනු ලැබ ඇත. මෙම විෂයධාරාවට අදාළ ව ගුරු භවතුන්ගේ නව නිර්මාණාත්මක හැකියාව එක් කොට ගනිමින් අනුමත කොට ඇති විෂය නිර්දේශය නිපුණතා පාදක ව අනාගත අපේක්ෂණ කරා දරුවන් පෙළ ගැස්වීමට ඉගෙනුම් - ඉගැන්වීම් කාර්ය සඳහා යොදා ගැනීම ගුරු භවතුන්ගේ කාර්යයකි.

මෙය ඔබ අතට පත් වූ වහා ම මෙහි ඇති විෂය නිර්දේශයෙහි වැදගත්කම හා පෙළ ගැස්ම පළමු ව මනා ව වටහා ගත යුතු ය. අනුමත කාලච්ඡේද සියල්ල සැලැකිල්ලට ගෙන වාරයට නියමිත විෂය කොටස් හඳුනා ගනිමින් වාර සටහන් හා දින සටහන් ක්‍රමානුකූල ව නිවැරදි ව සකස් කර ගැනීමට වගබලා ගැනීම ඔබ සතු යුතුකමක් බව සිහිපත් කරමි.

පැවති ගුරු මාර්ගෝපදේශය හා සැසඳීමේ දී සැම නිපුණතා මට්ටමක් ම ඉටු කර ගැනීම සඳහා අදාළ ඉගෙනුම් පල හඳුන්වා දී ඇත. මෙය මෙම විෂය නිර්දේශයට නව ප්‍රවණතාවකින් යුතු එක් කිරීමක් ලෙස හඳුන්වා දිය හැකි ය. එම ඉගෙනුම් පල ඉටුවන ලෙසත් ඒ මඟින් නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගත හැකි ලෙසත් ඇවැසි පහසුව සැලසීම උදෙසා උපදෙස් ලබා දී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය භාවිතයේ දී ගුරු භවතුන්ට තම අභිමතය පරිදි නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීම සඳහා නිපුණතා පාදක ක්‍රමවේදයට ගැළපෙන නිදහස් විකල්ප ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීමට අවස්ථාව සැලසේ. ඔබ විසින් යොදා ගන්නා ඉගෙනුම් ප්‍රවේශය සිසු මනසට ගැළැපෙන, කුතුහලය උපදවන පෙර අත්දැකීම් ද සැලකිල්ලට ගත් සතුටුදායක කාර්යක්ෂම ක්‍රමවේදයක් වීම ඉතා වැදගත් වේ.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා ලබා දී ඇති උපදෙස් අනිවාර්ය වූවක් නොවන අතර අදාළ කටයුත්ත නිසි පරිදි ඉටු වේ යැයි මැන බලා ගැනීම සඳහා ඔබේ අභිමතය පරිදි වෙනස්කම්

සිදු කර ගැනීමට අවකාශ සැලසේ. එසේ වුව ද නිපුණතාව හා නිපුණතා මට්ටම් පිළිබඳ ව දක්වන සැලැකිල්ල වෙනස් නොවිය යුතු ය. සැම නිපුණතාවක් අවසානයේ දී ම ලබා දී ඇති පරිශීලනයන් පිළිබඳ ව මනා මඟපෙන්වීමක් සිසුන් වෙත දැක්වීම අතිශයින් වැදගත් වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදක ව සිදු කිරීම සඳහා අත්පොතක් වේවා යි ප්‍රාර්ථනා කරන අතර, නව සහස්‍රය ජය ගැනීමට දරුවාගේ මනස නිවැරදි ම මාවතට යොමු කිරීම සඳහා මඟපෙන්වන ධාර්මික අත්වැලක් වේවා යි ප්‍රාර්ථනා කරමි.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය උඩුගම සුදස්සී හිමි,**
**දෙපාර්තමේන්තු ප්‍රධාන,**
**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව.**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | v |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | viii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1- 68 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම | 69-70 |
| ඇගයීම | 71-79 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

අධ්‍යාපන සංවර්ධනයේ දී විෂයමාලාවට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. ජාතික අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් විෂයමාලා සැකසීම කාලීන අවශ්‍යතාවකි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6-11 ශ්‍රේණිවල සිසුන්ට 2015 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූ බුද්ධ ධර්මය නව විෂය නිර්දේශය මඟින් බුදුදහමේ ප්‍රධාන ඉගැන්වීම්, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය යටතේ අදාළ ශ්‍රේණිවලට ප්‍රමාණවත් වන පරිදි කරුණු හැදෑරීමට අවස්ථාව සලසන ලදි. එය නිපුණතා පාදක ව සිදු විණි.

එම අරමුණු ඉටු කර ගනිමින් අ.පො.ස. (සා. පෙළ) කඩඉම පසු කර උසස් පෙළට පිවිසෙන ශිෂ්‍යයා මෙම විෂය හැදෑරීමෙන් බුද්ධ කාලීන භාරතීය ආගමික චින්තා මෙන් ම ඊට සාපේක්ෂ ව බෞද්ධ ඉගැන්වීමේ අර්ථාන්විත බව ද, ත්‍රිවිධ රත්නය, බුදු දහමේ මූලික ඉගැන්වීම්, බෞද්ධ ආචාර ධර්ම, ශාසන ඉතිහාසය, බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය ආදි ක්ෂේත්‍ර පිළිබඳ විස්තරාත්මක, විචාරාත්මක හා තුලනාත්මක ගවේෂණයට යොමු කරවනු ලැබේ.

බුද්ධ ධර්මය විෂය නිර්දේශය හුදෙක් තද් විෂයයේ මූලධර්ම හා න්‍යායාත්මක කරුණු අධ්‍යයනයකට වඩා, ප්‍රායෝගික ජීවන දර්ශනයක් වශයෙන් මෙන් ම විමුක්ති මාර්ගයක් වශයෙන් තම දැනුම ඵලදායක ව උපයෝග කරගත හැකි අයුරින් සකස් කොට ඇත. තව ද විද්‍යාර්ථියා තුළ විචාරශීලීත්වය, ස්වාධීනත්වය හා නිර්මාණශීලී භාවිතය වැඩි දියුණු වන අයුරින් විෂය අන්තර්ගතය සකස් කොට තිබේ.

අසා දැන ගැනීමට වඩා, තමා විසින් ම කරුණු එක්රැස් කිරීම, ඒවා බෙදා විග්‍රහ කිරීම, එම කරුණුවල අන්තර්ගතය භාවිතයට ගැනීම පිළිබඳ අවබෝධය ශිෂ්‍යයා තුළ වැඩි දියුණු වන පරිදි විෂය නිර්දේශයේ කරුණු ක්‍රියාවට නැඟිය යුතු වේ.

නිපුණතා සියල්ල සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය විෂය දැනුමෙන්, ආකල්පවලින්, කුසලතාවන්ගෙන් හා ජීවන යහපුරුදුවලින් පිරිපුන් බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ මනා පෞරුෂයකින් හෙබි ඉගෙනුම් ලාභියෙකුගේ බිහි වීම බලාපොරොත්තු වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

# විෂය අරමුණු

මිනිසා අවිද්‍යාවෙන් විද්‍යාවටත්, අන්ධකාරයෙන් ආලෝකයටත්, පරාධීනත්වයෙන් ස්වාධීනත්වයටත්, දීන මානසිකත්වයෙන් අභිමානයටත් පත් කොට මෙලොව හා පරලොව වශයෙන් භෞතික හා ආධ්‍යාත්මික උභයාර්ථ සාධනය වෙත යොමු කිරීමත්, ස්වාර්ථය හා පරාර්ථය සම ව සිතන, මානව වර්ගයාට පමණක් නොව සමස්ත සත්ත්ව ප්‍රජාවට මෙන් ම, පරිසරයට ද හිතකාමී සත්පුරුෂ පුද්ගලයකු බවට පත් කිරීමත් බුද්ධ ධර්මය විෂයයෙහි අපේක්ෂාව වේ. එම අපේක්ෂාවත් සාක්ෂාත් කරගනු වස් පහත දැක්වෙන විෂය අරමුණු පිළිබඳ මනා අවධානයකින් ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම ඵලදායක ය.

1. බුදු සිරිතින් සහ පරමාදර්ශී ශ්‍රාවක- ශ්‍රාවිකා චරිතවලින් ප්‍රකට වන විශිෂ්ට ගුණ චරිතායනය කරමින් තෙරුවන් ගුණ ඇසුරෙන් පෞරුෂය ගොඩනඟා ගැනීම.
2. සමකාලීන සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ව හා විචාරාත්මක ව අධ්‍යයනය කරමින් නිදහස්, නොවහල්, විචාරශීලී මනසකින් යුතු ව කටයුතු කිරීම.
3. බුදු සමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මක ව අධ්‍යයනය කර සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවදිකමෙන් යුතු, ලෝක ධර්මතා හමුවේ නොසැලෙන ප්‍රායෝගික ජීවන දර්ශනයක් ගොඩනඟා ගැනීම.
4. කර්මය, පුනර්භවය හා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතු සදාචාර සම්පන්න චරිතයක් ගොඩනඟා ගැනීම.
5. බෞද්ධ ඉතිහාසය පිළිබඳ ගවේෂණශීලී ව අතීත ශ්‍රාවක- ශ්‍රාවිකාවන්ගේ උදාර කැප වීම අගයමින් ශාසන සංරක්ෂණයට දායක වීම.
6. සිය යුතුකම් හා වගකීම් මැනවින් දැන හඳුනාගෙන මනා සමාජ සම්බන්ධතා ජාලයක් සහිත පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.
7. කරුණාව, දයාව, මෛත්‍රිය හා ශ්‍රද්ධාව වැනි භාවාත්මක ගුණවලින් පෝෂිත ව, මිනිසා හා පරිසරය පිළිබඳ සංවේදී ව එළඹ සිටි සිහියෙන් හා ප්‍රඥාවෙන් කටයුතු කිරීම.

# විෂය නිර්දේශය
## 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0<br>ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායයේ එන සිද්ධාර්ථ ගෞතම සම්බුද්ධ චරිතය විමර්ශනාත්මක ව අධ්‍යයනය කරමින් චරිතායනය කරයි. | 1.1<br>බුදු රජාණන් වහන්සේගේ අසමසම වූ ආධ්‍යාත්මික ගුණ හඳුනාගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | • නව අරහාදි බුදු ගුණ<br>• මහා කරුණාව<br>• මහා ප්‍රඥාව<br>• ත්‍රිවිද්‍යාව<br>• ඉද්ධිවිධ, දිබ්බසොත, චේතෝපරිය ඥාන<br>• දශබල ඥානය<br>• චතුර්වෛශාරද්‍ය ඥාන<br>• අකම්පන ඥාන<br>• බුදු රජාණන් වහන්සේගේ ඓතිහාසිකත්වය හා ආශ්චර්යවත් මනුෂ්‍යත්වය<br>• බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය හා නායකත්වය<br>• බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට දේශනා විලාස හා ඉගැන්වීම් ක්‍රම | • බුදු රජාණන් වහන්සේගේ අසමසම ගුණ හැඳින ගනියි.<br>• නව අරහාදි බුදුගුණ හා බුද්ධඥාන අසමසම බව පිළිගනියි.<br>• බුදු ගුණ දැන බුදු රජාණන් වහන්සේ පුදයි.<br>• සාමූහික ව ආමිස ප්‍රතිපත්ති පූජාවේ යෙදෙයි. | 30 |
| | 1.2<br>බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශනය කරයි. | • චින්තන නිදහස අගය කිරීම<br>• සමානාත්මතාව, සහජීවනය හා ආගමික සහනශීලීත්වය<br>• යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ගුණය<br>• තාදි ගුණය හා පද්මාකාර ජීවිතය<br>• බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව සමකාලීනයන්ගේ ඇගයීම් | • බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ හඳුනා ගනියි.<br>• බුදු රජාණන් වහන්සේ මානව ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයා බව පිළිගනියි.<br>• බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශනය කරයි.<br>• සමානාත්මතාවෙන් හා සහජීවනයෙන් දිවි ගෙවයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0<br>පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හා සද්ධර්මයෙහි සුවිශේෂතා හැඳින ධර්මගරුක ජීවිතයක් ගත කරමින් ධර්ම සංරක්ෂණ-යට කටයුතු කරයි. | 2.1<br>පාලි ත්‍රිපිටකයේ ව්‍යූහය අධ්‍යයනය කර එහි අන්තර්ගතය සැකෙවින් පැහැදිලි කරයි. | • පිටකත්‍රයය හැඳින්වීම<br>• පිටකත්‍රයයේ සැකැස්ම | • සූත්‍ර, විනය සහ අභිධර්ම යන පද පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරයි.<br>• ත්‍රිපිටකයේ සැකැස්ම පිළිබඳ ව වැඩිදුර හැදෑරීමට පෙලැඹෙයි.<br>• ත්‍රිපිටකයේ ව්‍යූහය පිළිබඳ ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරයි.<br>• මතු පරපුර සඳහා ත්‍රිපිටක ග්‍රන්ථ ආරක්ෂා කරයි. | 12 |
| | 2.2<br>බුද්ධ ධර්මයේ අනන්‍යතාව හැඳින ධර්ම ගෞරවය ඇති කර ගනියි. | • ස්වාක්ඛාතාදි සවැදෑරුම් දහම් ගුණ<br>• බුදු දහම දේව අනාවරණයක් නොවීම<br>• ආත්මවාදයක් නොවීම<br>• සිතා විමසා පසක් කළ යුතු දහමක් වීම<br>• විශ්ව සාධාරණ බව | • බුද්ධ ධර්මයේ සුවිශේෂතා හඳුනා ගනියි.<br>• ධර්මය පිළිබඳ ගෞරවය ඇති කර ගනියි.<br>• ධර්ම පත්‍රිකා මුද්‍රණය කර බෙදා හරියි.<br>• සැම විට ම විමර්ශනශීලී ව කටයුතු කරයි. | 22 |
| | 2.3<br>බෞද්ධ ඉගැන්වීම් ප්‍රගුණ කරමින් උභයාර්ථ සාධනයෙහි යෙදෙයි. | • උභයාර්ථ සාධනය<br>- මෙලොව පරලොව<br>- ස්වාර්ථ පරාර්ථ<br>• ප්‍රායෝගික ජීවන දර්ශනයක් ලෙස බුදු දහම<br>• බුදු දහම විමුක්ති මාර්ගයක් ලෙස | • උභයාර්ථ සාධනය පිණිස ධර්මයේ උපයෝගිතාව පැහැදිලි කරයි.<br>• බුදු දහම ප්‍රායෝගික ජීවන දර්ශනයක් බව පිළිගනියි.<br>• පාසල තුළ බෞද්ධ සංගමයක් පිහිටුවයි.<br>• සමාජ සුභසාධන කටයුතුවල නිරත වෙයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 03.<br>සංඝ සමාජයේ පරමාර්ථ සහ ප්‍රතිපත්ති විමර්ශනය කර, එහි චිරස්ථිතියට යහ ආකල්පවලින් යුක්ත ව දායක වෙයි. | 3.1<br>සංඝ සමාජයේ ප්‍රභවය, විකාශය හා පරමාර්ථ අධ්‍යයනය කර සාමූහික ව ක්‍රියා කරයි. | • බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ සමාජය<br>• භික්ඛු සංඝ සමාජයේ ප්‍රභවය<br>• භික්ඛුණී සංඝ සමාජයේ ප්‍රභවය<br>• පැවිද්ද හා උපසම්පදාව<br>• උපසම්පදා ක්‍රම<br>• සතර පාරාජිකා සහ නිස්සය ධර්ම<br>• ශික්ෂාපද පැනවීමේ පරමාර්ථ<br>• වස් විසීම හා පවාරණය<br>• සාංඝික ක්‍රමය | • සංඝ සමාජයේ ප්‍රභවය, විකාශය හා පරමාර්ථ අධ්‍යයනය කරයි.<br>• පැවිද්ද හා උපසම්පදාව ක්‍රමික ව විකාශය වූ බව පෙන්වා දෙයි.<br>• සංඝ සමාජය ආදර්ශනය කරයි.<br>• පොදු සම්පත් ආරක්ෂා කරයි. | 42 |
| | 3.2<br>සඟ ගුණ පිළිබඳ සැදැහැ සිතින් සංඝ සමාජයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශ කර ගනියි. | • ගුරු ශිෂ්‍ය සම්බන්ධය<br>• සුපටිපන්නාදි නව වැදෑරුම් සඟගුණ<br>• බ්‍රහ්මචර්යාව හා අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා ගුණ<br>• අත්තහිත පරහිත බව | • සඟගුණ විස්තර කරයි.<br>• සාමූහික සහජීවනය අගයයි.<br>• විහාර කාර්ය සාධක සමිතියක් පිහිටුවීමට දායක වෙයි.<br>• සංඝ සමාජයේ චිරපැවැත්මට කටයුතු කරයි. | 43 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 04.<br>පුද්ගලයා හා සමාජය පිළිබඳ බුද්ධ කාලීන ආගමික චින්තා තුලනාත්මක ව හා විචාරාත්මක ව අධ්‍යයනය කර යථාර්ථවාදී ව කටයුතු කරයි. | 4.1<br>පුද්ගලයාගේ ස්වාමිත්වය හා ශක්‍යතාව පිළිබඳ විමර්ශනය කරයි. | • පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම්<br>- ඊශ්වර නිර්මාණ වාදය<br>- ඒ පිළිබඳ බෞද්ධ විචාරය | • පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් විචාරය කරයි.<br>• නිර්මාණවාදී සංකල්පවල නිසරු බව වටහා ගනියි.<br>• ශිෂ්‍ය සමිතියේ දී සමානාත්මතාව අගය කරමින් කතාවක් පවත්වයි.<br>• උස්මිටිකම් නොතකා ක්‍රියා කරයි. | 15 |
| | 4.2<br>ෂට් ශාස්තෘ ඉගැන්වීම් අධ්‍යයනය කරමින් ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය පරීක්ෂා කරයි. | • ෂට් ශාස්තෘවරු<br>- අකිරිය වාදය<br>- නාස්තික වාදය<br>- නියති වාදය (අහේතුඅප්පච්චය වාදය අධිච්චසමුප්පන්න වාදය)<br>- අමරාවික්ඛේප වාදය<br>- සප්තපදාර්ථ වාදය<br>- පුබ්බේකතහේතු වාදය<br>- ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ විචාරය | • ෂට් ශාස්තෘ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ ආකල්පය විස්තර කරයි.<br>• ෂට් ශාස්තෘ ඉගැන්වීම්වල ඌනතා ඇති බව පිළිගනියි.<br>• සදාචාර විරෝධී ක්‍රියා බැහැර කර දෛනික කටයුතුවල යෙදෙයි.<br>• සමාජ සාරධර්ම ස්ථාපනය කිරීමට දායක වෙයි. | 28 |
| | 4.3<br>සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි බුද්ධි ගෝචර බව පිළිගනියි. | • සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්<br>- සමාජ සංස්ථාවල ප්‍රභවය හා විකාශය | • සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විවරණය කරයි.<br>• සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි බුද්ධි ගෝචර බව අගය කරයි.<br>• මනුෂ්‍යත්වය අගය කරමින් ජීවත් වෙයි.<br>• වාද භේද බැහැර කර සහයෝගයෙන් කටයුතු කරයි. | 26 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 05.<br>බුදු රජාණන් වහන්සේ සහ භාරතීය භික්ෂූන් වහන්සේ විසින් ධර්ම විනයේ ආරක්ෂාව සඳහා යොදන ලද විධිවිධාන අධ්‍යයනය කරමින් ශාසනික උන්නතියට හා ආරක්ෂාවට කැප වෙයි. | 5.1<br>ධර්ම විනයේ ආරක්ෂාව හා චිර පැවැත්ම පිණිස බුදු රදුන් විසින් යොදන ලද විධිවිධාන හඳුනා ගනියි. | • ශික්ෂාපද හා විනය නීති පැනවීම<br>• ශ්‍රාවක- ශ්‍රාවිකාවන් ධර්මදූත කාර්යයෙහි යෙදවීම<br>• තනතුරු පිරිනැමීම<br>- අග තනතුරු<br>- වෙනත් විශේෂ තනතුරු<br>• ගිහි ශ්‍රාවක- ශ්‍රාවිකා අනුග්‍රහය | • ධර්ම විනයේ ආරක්ෂාව හා චිර පැවැත්ම පිණිස බුදු රජාණන් වහන්සේ විසින් යොදන ලද ක්‍රියාමාර්ග අධ්‍යයනය කරයි.<br>• බුදු සසුනේ චිර පැවැත්මට අදාළ ක්‍රියාමාර්ග අගයයි.<br>• ධර්ම විනයේ චිර පැවැත්මට දායක වෙයි.<br>• නූතන තාක්ෂණය භාවිත කරමින් ධර්ම සන්නිවේදනයේ යෙදෙයි. | 20 |
| | 5.2<br>බෞද්ධ චින්තනයේ පෝෂණයට හා ව්‍යාප්තියට ධර්ම සංගායනාවලින් සැලසුණු සේවය අධ්‍යයනය කර ශාසන චිරස්ථිතියට ක්‍රියා කරයි. | • ථේරීය සංගායනා<br>- පළමු සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල<br>- ධර්ම විනය පිටක වශයෙන් බෙදීම<br>- භාණක ක්‍රමය හා ධර්ම විනය සංරක්ෂණය<br>- බුද්ධානුබුද්දක ශික්ෂාපද විනිශ්චය<br>- දෙවන සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල<br>- තෙවන සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල | • ථෙරවාදී සංගායනාවල පසුබිම හා ප්‍රතිඵල අධ්‍යයනය කරයි.<br>• අභියෝග හමුවේ ධර්ම විනය සංරක්ෂණය කළ යුතු ආකාරය පෙන්වා දෙයි.<br>• ශාසනය වෙනුවෙන් ඉටු කළ යුතු කාර්ය භාරය මැනවින් ඉටු කරයි.<br>• සාමූහික තීරණ ක්‍රියාත්මක කරයි. | 26 |

# ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායයේ එන සිද්ධාර්ථ ගෞතම සම්බුද්ධ චරිතය විමර්ශනාත්මක ව අධ්‍යයනය කරමින් චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : බුදු රජාණන් වහන්සේගේ අසමසම වූ ආධ්‍යාත්මික ගුණ හඳුනාගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 30 යි.

**ඉගෙනුම් පල** :

- බුදු රජාණන් වහන්සේගේ අසමසම ගුණ හැඳින ගනියි.
- නව අරහාදි බුදුගුණ හා බුද්ධඥාන අසමසම බව පිළිගනියි.
- බුදුගුණ දන බුදු රජාණන් වහන්සේ පුදයි.
- සාමූහික ව ආමිෂ ප්‍රතිපත්ති පූජාවේ යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු රජාණන් වහන්සේගේ ගුණ කාය හා ඥාන කාය හැඳින, අවබෝධයෙන් ආමිෂ හා ප්‍රතිපත්ති පූජාවෙහි යෙදීමට මඟපෙන්වීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**නව අරහාදි බුදුගුණ**

'' සො භගවා අරහං සම්මාසම්බුද්ධො
විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ
අනුත්තරො පුරිසදම්මසාරථී
සත්ථා දේව මනුස්සානං බුද්ධො භගවා''

- යනුවෙන් බුද්ධකාලීන භාරතීය සමාජයෙහි බුදුරජාණන් වහන්සේ පිළිබඳ මහත් වූ කීර්ති රාවයක් පැතිර ගිය බව. (සාමඤ්ඤඵල සූත්‍රය -දී.නි.)
- සූත්‍ර පිටකයේ සූත්‍ර ගණනාවක ඇතුළත් මෙම සුවිශේෂ ගුණ නව අරහාදි බුදුගුණ ලෙස ව්‍යවහාරයට පැමිණ ඇති බව.
- අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණසම්පන්න, සුගත, ලොකවිදූ, අනුත්තර පුරිසදම්මසාරථී, සත්ථා දෙවමනුස්සානං, බුද්ධ, භගවා යනු ඒ බුදුගුණ නවය බව.
- සියලු කෙලෙස්වලින් දුරු වූ බැවින් ද සංසාර චක්‍රයේ අර සිඳලූ බැවින් ද කෙලෙස් සතුරන් නැසූ බැවින් ද රහස් නොමැති බැවින් ද (න රහං යස්ස සො අරහං) එනම් රහසින් හෝ පව් නොකරන බැවින් ද සියලු පූජාවන්ට සුදුසු හෙයින් ද බුදු රජාණන් වහන්සේ 'අරහං' යනුවෙන් හඳුන්වනු ලබන බව.

රහසත් පව් නො කොට
කෙලෙස්'රයනුත් දුරු කොට
නිසි වූයෙන් පුදට
අරහ යැ යි නම කියති මුනිඳුට

(බුදුගුණ අලංකාරය)

යනුවෙන් මෙම බුදුගුණය විස්තර වන බව.

- චතුරාර්ය සත්‍යය තත් වූ පරිදි තමා විසින් ම අවබෝධ කළ බැවින් සම්මා සම්බුද්ධ නම් වන බව
- සියලු සංඛත ධර්මය අවබෝධ කළේ ය, අවබෝධ කරයි, අවබෝධ කරන්නේය. (සබ්බේ සංඛතා සංඛත ධම්මේ අබුජ්ඣි, බුජ්ඣති බුජ්ඣිස්සතීති බුද්ධො) යන අරුතින් බුද්ධ නම් වන බවත් හා එය තමා විසින් මැනවින් සිදු කළ බැවින් සම්මා සම්බුද්ධ නම් වන බව. (නමක්කාර පාලි - නමක්කාර ටීකා)
- අවබෝධ කළ යුතු සියලු ධර්ම අවබෝධ කළ බැවින් ද සාක්ෂාත් කළ යුතු සියලු ධර්ම සාක්ෂාත් කළ බැවින් ද වැඩිය යුතු සියලු ධර්ම වැඩූ බැවින් ද ප්‍රහීණ කළ යුතු සියලු ධර්ම ප්‍රහීණ කළ බැවින් ද 'බුද්ධ' නම් වන බව හා ඒවා තමා විසින් ම සිදු කරන ලද බැවින් සම්මාසම්බුද්ධ නම් වන බව.

තුන් කල්හි ම පැවැති
පදරුත් සියල් ලොව ඇති
අතැඹුල සෙ දන ගති
එයින් සම්මා සම්බුදුනැ යෙති

(බුදුගුණ අලංකාරය)

- අෂ්ට විද්‍යාවෙන් ද පසළොස් චරණ ධර්මයෙන් ද යුක්ත වූ බැවින් බුදු රජාණන් වහන්සේ 'විජ්ජාචරණ සම්පන්න' නාමයෙන් හඳුන්වනු ලබන බව.

අෂ්ට විද්‍යා යනු

විපස්සනාඥාණය
මනොමයඉද්ධිඥාණය
ඉද්ධිවිධඥාණය
දිබ්බසෝතඥාණය
පරචිත්තවිජානනඥාණය
පුබ්බේනිවාසානුස්සතිඥාණය
දිබ්බචක්ඛුඥාණය
ආසවක්ඛයඥාණය

ලෙස දක්වා ඇති බව

(අම්බට්ඨ සූත්‍රය, දී.නි.)

පසළොස් චරණ යනු

සීල සම්පන්න වීම
සංවර වූ ඉන්ද්‍රිය ඇති බව
භෝජනයෙහි පමණ දැනීම
නිදි වැරීමෙහි යෙදීම
ශ්‍රද්ධාව
හිරි
ඔත්තප්ප
බහුශ්‍රැත බව
වීර්යය
සිහි ඇති බව
ප්‍රඥාව (උදයත්ථගාමිනි පඤ්ඤා)
ප්‍රථමධ්‍යානය
ද්විතීයධ්‍යානය
තෘතීයධ්‍යානය
චතුර්ථධ්‍යානය බව (සේඛ සූත්‍රය ම.නි.)

විද්දෑ නැණ අට ද
පසළොස් සරණ ගුණය ද
ඇතියෙන් එ මුනි සඳ
පිරුණු විජ්ජාචරණ නම් ලද

(බුදුගුණ අලංකාරය)

- බුදු රජාණන් වහන්සේ අන්තද්වය ට නොපැමිණ සුන්දර වූ නිවනට ගිය බැවින් ද එම නිවනට යහපත් ආකාරයෙන් ගිය බැවින් ද සුදුසු වචන සුදුසු තන්හි යහපත් ව කියන බැවින් ද උන් වහන්සේ 'සුගත' නාමයෙන් හැඳින්වෙන බව.

යහපත් කොට යෙතැ යි
සුන්දර තැනට සැපතැ යි
සොඳුරු බස් කියතැ යි
කියති ඒ මුනි රජුට සුගතැ යි

(බුදුගුණ අලංකාරය)

- බුදු රජාණන් වහන්සේ ලෝකය ස්වභාව වශයෙන් ද ලෝක සමුදය වශයෙන් ද ලෝක නිරෝධ වශයෙන් ද නිරෝධය පිණිස උපාය වශයෙන් ද (මාර්ගය වශයෙන්) යන සියලු ආකාරයෙන් ලෝකය දන්නා බැවින්, අවබෝධ කළ බැවින් 'ලෝකවිදූ' නම් වන බව. තව ද සංඛාර ලෝක, සත්තලෝක, ඔකාසලෝක යන තුන්ලෝකය සැම අයුරින් ම මැනවින් දන්නා බැවින් 'ලෝකවිදූ' වන බව.

තුන් ලොව තතු ලෙසට
දැනගෙන නොදත් මෙ ලොවට
දෙසුයෙන් නියම කොට
ලෝකවිදූ යැ යි කියති මුනිඳුට

(බුදුගුණ අලංකාරය)

- අනුත්තර පුරිසදම්මසාරථී බුදුගුණය ඇතැම් පොත්වල අනුත්තර වෙනත් බුදුගුණයක් ලෙස ද, පුරිසදම්මසාරථී තවත් බුදුගුණයක් ලෙස ද විස්තර වන බව.
- බුදු රජාණන් වහන්සේට වඩා උසස් කෙනකු නැති බැවින් සියල්ලන්ට ම වඩා ශ්‍රේෂ්ඨ යන අරුතින් ද එයට වඩා වැඩි දෙයක් නැති උසස් ම වූ නිවන අවබෝධ කළ හෙයින්, ශ්‍රේෂ්ඨ අසදෘශ වූ යන අර්ථයෙන් ද පසේබුදු අරහත් ආදි කිසිවකුට සාධාරණ නොවන බැවින් ද, බුදු රජාණන් වහන්සේ 'අනුත්තර' නම් වන බව.

හැම ගුණයෙන් නඳා
සම වැඩි සතකු හැම දා
දියතෙහි නැති සඳා
අනුත්තර යැ යි කියති මුනිඳා

(බුදුගුණ අලංකාරය)

- දමනය නොවූ, නොහික්මුණා වූ පුරුෂයන් එනම් තිරිසන් වුවද, මනුෂ්‍ය වුවද, අමනුෂ්‍ය වුවද සත්ත්වයන් දමනය කිරීමෙහි හැකියාව පුරිසදම්මසාරථී බුදුගුණයෙන් කියැවෙන බව.
- බුදු රජාණන් වහන්සේ නොදැමුණු පුරුෂයන් දමනයේ දී විවිධ උපාය, උපක්‍රම භාවිත කළ බව.
- තුන් බෑ ජටිලයන්, සච්චක, සෝණදණ්ඩ, අක්කෝසක වැනි මිනිස් පුරුෂයන් ද, ආලවක, සුචිරෝම, බරරෝම ආදි අමනුෂ්‍ය පුරුෂයන් ද, නාලාගිරි, අග්ගිසිඛ, ධූමසිඛ, අපලාලනාගරාජ ආදි තිරිසන් ගත පුරුෂයන් ද වශයෙන් මෙසේ විශාල පිරිසක් දමනය කර ඇති බව.
- නොදැමුණු විවිධ පුද්ගලයන් දමනය කිරීමට බුදු රජාණන් වහන්සේට තිබූ අසමසම හැකියාව නිසා උන් වහන්සේ 'අනුත්තර පුරිසදම්මසාරථී' යනුවෙන් හැඳින්වෙන බව.

බඹ සුර යකුන් තද
දමනය කර තමන් ලද
සෙත් දී මුනිඳු සඳ
පුරිසදම් සාරතී නම් ලද

(බුදුගුණ අලංකාරය)

- දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් ද (සදෙවකං ලොකං සාසතීති සත්‍ථා) දෙව් මිනිසුන්ට ශාස්තෲවරයා මෙන් ම ගුරුවරයා වන බැවින් ද බුදු රජාණන් වහන්සේ 'සත්ථා' (සත්ථාදෙවමනුස්සානං) යනුවෙන් හැඳින්වෙන බව. (සද්දනීති පකරණ - ධාතුමාලා))

| | |
|---|---|
| බව කතරින් | එතෙර |
| ලනුයෙන් සතන් හැම | වර |
| තිලෝගුරු | මුනිවර |
| වී ය සත්තා නමින් | පුවතර |

(බුදුගුණ අලංකාරය)

- සියලු සංඛත ධර්ම හා අසංඛත ධර්ම අවබෝධ කළේ ය, අවබෝධ කරයි, අවබෝධ කරන්නේ ය, යන අර්ථයෙන් බුදු රජාණන් වහන්සේ 'බුද්ධ' යනුවෙන් හඳුන්වනු ලබන බව. (සබ්බේ සංඛතාසංඛත ධම්මෙ අබුජ්ඣි, බුජ්ඣති, බුජ්ඣිස්සතීති බුද්ධො) නමක්කාර පාලි -නමක්කාර ටීකා
- දත යුතු සියල්ල අවබෝධ කළ බැවින් ද චතුරාර්ය සත්‍යය තමන් වහන්සේ ම අවබෝධ කොට අන්‍යයන්ට ද අවබෝධ කරවන බැවින් ද උන් වහන්සේ 'බුද්ධ' නම් වන බව.
- සියල්ල දන්නා බැවින් ද සර්වඥ බැවින් ද වෙනෙකකු විසින් අවබෝධ නො කරවිය යුතු බැවින් ද ක්ෂීණාශ්‍රව බැවින් ද වීතරාගී බැවින් ද ආදි බොහෝ කරුණු නිසා 'බුද්ධ ' නම් වන බව. (චුල්ලනිද්දේසපාළි)

| | |
|---|---|
| සිවු සස් සිය | නැණින් |
| දූන දූන්වී ය | කුලුණින් |
| දුරලයි | අනුවණින් |
| එ බුදු නම් වී ය නැණ | පමණින් |

(බුදුගුණ අලංකාරය)

- භගවා යන බුදුගුණය ''භග සංඛාතා ධම්මා අස්ස සන්තීති භගවා'' යනුවෙන් අටුවාවේ දැක්වෙන බව. (දීඝ නිකාය ටීකාව)
- 'භග ' ලක්ෂණය හෙවත් භාග්‍යවත් බව, සමෘද්ධිය, කීර්තිය යනාදි ගුණ දරන තැනැත්තා 'භගවා' නම් වන බව.

භගී භජී භාගී විභත්තවා ඉති
අකාසි භග්ගන්ති ගරූති භාග්‍යවා
බහූහි ඤායෙහි සුභාවිතත්තතො
භවන්තගො සො භගවාති වුච්චති

(ඛුද්දක නිකායට්ඨකථා)

- භග ධර්ම ඇත්තේ ය, පනවන ලද සේනාසනාදිය භජනය කළේ ය, අර්ථ, ධර්ම, විමුක්ති, රස භාග ඇත්තේ ය, ධර්මය විභාග විශ්ලේෂණය කළේ ය, රාගාදි කෙලෙස් බිඳ දැමුවේ ය, භාග්‍ය ඇත්තේ ය, භාවනාවෙන් වඩනා ලද සිත් ඇත්තේ ය, භවයෙහි අන්තයට ගියේ ය, යන අරුතින් ද 'භගවා' නම් වන බව.
- භගවා යනු ශ්‍රේෂ්ඨ නාමයක් බැවින් ද, එය උතුම් නාමයක් බැවින් ද, උන් වහන්සේ ගරු ගෞරවයෙන් යුක්ත වන බැවින් ද 'භගවා' නම් වන්නේ යැයි විශුද්ධි මාර්ගයේ සඳහන් වන බව.

''භගවාති වචනං සෙට්ඨං - භගවාති වචනමුත්තමං
ගරුගාරවයුත්තොසො - භගවාතෙන වුච්චතී'' තී'' (විශුද්ධි මාර්ගය)

බෙදුයෙන් දහම් කඳ
බජනය කෙළෙන් ගුණ කඳ
බග දහමින් සසඳ
බැවින් බගවත් වී ය මුනි සඳ

(බුදුගුණ අලංකාරය)

**මහා කරුණාව**

- ''පරදුක්ඛෙ සති සාධුනං කම්පනං හදය බෙදං කරොතීති කරුණා'' යනුවෙන් දැක්වෙන පරිදි අනුන්ගේ දුක දැක සාධු ජනයාගේ සිතේ ඇතිවන කම්පාව කරුණාව'' බව. අනුන්ගේ දුක දැක එම දුක විනාශ කරයි, නැති කරයි යන අර්ථයෙන් ''කරුණා'' නම් වන බව. (මජ්ඣිම නිකාය ටීකාව)
- මිනිසා තුළ අඩු වැඩි වශයෙන් මෙම කරුණාව සීමිත පිරිසක් සඳහා ඇති වුව ද බුදු රජාණන් වහන්සේගේ කරුණාව අසීමිත සත්ත්ව ප්‍රජාව කෙරෙහි අසීමිත ව පවත්නා ගුණයක් බැවින් එය 'මහා කරුණාව' ද වන බව.
- බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව උස් - පහත්, මිතුරු - හතුරු, මිනිස් - තිරිසන් ආදි කිසිදු භේදයකින් තොරව සමස්ත සත්ත්ව ප්‍රජාවට ම සමාන වූවක් බව.
- ''මහන්තො කාරුණිකො මහාකාරුණිකො'' යනුවෙන් දැක්වෙන පරිදි බුදු රජාණන් වහන්සේ මහත් වූ කරුණාවෙන් යුතු බැවින් මහාකාරුණික නම් වන බව. (ඛුද්දක නිකාය - ටීකාව)
- ''ලෝකයේ සත්ත්වයන්ගේ විසීම වනාහි රාගාදියෙන් ගිනි ගෙන දිලෙන්නාක් වැනි යැයි දන්නා බුදු රජාණන් වහන්සේ තුළ සත්ත්ව ප්‍රජාව කෙරෙහි මහා කරුණාව ඇති වෙයි'', ආදි ලෙස බුදු රජාණන් වහන්සේ තුළ කරුණාව අසූනව අයුරකින් ඇති වන්නේ යැ යි පටිසම්භිදාමග්ගයේ දැක්වෙන බව.
- ''ඒකාන්තයෙන් මම තරණය කළෙමි තරණය කරවන්නට, මිදුණෙමි මුදවන්නට, දැමුණෙමි දමනය කරවන්නට, ශාන්ත වූයෙමි ශාන්ත කරවන්නට, අස්වැසුණෙමි අස්වසන්නට, පිරිනිවියෙමි පිරිනිවාලන්නට සමත් වෙමි'' යි. දන්නා බුදු රජාණන් වහන්සේ තුළ මහා කරුණාව ඇති වන බව. (පහෝම ධිවාහං තිණ්ණො තාරෙතුං, මුත්තො මෝචෙතුං, දන්තො දමේතුං, සන්තො සමෙතුං, අස්සත්ථො අස්සාසෙතුං, පරිනිබ්බුතො පරෙච පරිනිබ්බාපෙතුන්ති, පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහා කරුණා ඔක්කමති). පටිසම්භිදා මග්ගපාලි
- සුනීත, සෝපාක, අංගුලිමාල, රජ්ජුමාලා, පුක්කුසාති, පටාචාරා, කිසාගෝතමී, පූතිගත්තතිස්ස හිමි ආදි බොහෝ චරිතවලින් මෙන් ම හදුවතිකා, නාලාගිරි ආදි තිරිසන් සතුන් පිළිබඳ සිදු වීම්වලින් ද බුදු රජාණන් වහන්සේගේ මහා කරුණාව ප්‍රකට වන බව.

මහා ප්‍රඥාව

- මහත් වූ ප්‍රඥාව ඇත්තේ යමකුට ද හේ '' මහාපඤ්ඤො'' නම් වන බව. එවැනි මහත් වූ ප්‍රඥාවක් බුදු රදුන් තුළ පැවති බව.
- ආත්මය (තමා) ශූන්‍ය ලෙස දැකීම, එම දැකීම මුහුකුරා යාමෙන්, එම දැකීම මහත් බවට පැමිණීමෙන්, මහා ප්‍රඥාව පූරණය වන බව. එසේ වෘද්ධියට, මහත් බවට පැමිණි ප්‍රඥාව මහා ප්‍රඥාව වන බව. (සාවුද්ධිපත්තත්තා මහති ච සා පඤ්ඤා චාති මහාපඤ්ඤා) පටිසම්භිදාමග්ග අටුවාව
- ඇඳක තබාගෙන ඔසවාගෙන යන තරමට බුද්ධ ශරීරය දුර්වල වුව ද, උන් වහන්සේගේ ප්‍රඥා ශක්තියෙහි වෙනසක් සිදු නොවන්නේ යැ යි උන් වහන්සේ විසින් ම දේශනා කරනු ලැබ ඇති බව.
- ඕනෑ ම ප්‍රශ්නයකට ඕනෑ ම අවස්ථාවක නිවැරැදි ම පිළිතුර සැපයුවේ මහා ප්‍රඥාව නිසා බව
- සබ්බඤ්ඤුතඤාණ ආදි බුදුසිරිතෙන් ප්‍රකට වන විවිධ ඤාණ විශේෂ මඟින් බුදු රජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව ප්‍රකට වන බව.
- පුබ්බෙනිවාසානුස්සතිඤාණය, චුතූපපාතඤාණය හා ආසවක්ඛයඤාණය බුදු රජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යාව වන බව. (තෙවිජ්ජ සූත්‍රය දී.නි.)

බුද්ධඥාන

- බුදු රජාණන් වහන්සේ විසින් උපදවා ගන්නා ලද ඤාණාධිගමයන් මහාසීහනාද සූත්‍රයේ දක්වා ඇති බව හා බුද්ධ ඤාණ පිළිබඳ වෙනත් තොරතුරු ද මූලාශ්‍රයයන්හි ඇතුළත් බව.
- පොළොවෙහි කිමිදීම, අහසෙහි සහ ජලයෙහි ඇවිදීම ආදි ඍද්ධිප්‍රාතිහාර්ය පෑමේ බලය ඇති ඤාණය බුදු රදුන්ගේ ''ඉද්ධිවිධ ඤාණය '' බව.
- මිනිසුන් මෙන් ම දෙවියන් පිළිබඳව ද දුර හා සමීප වශයෙන් ද්විවිධ ශබ්දයන් ඇසීමේ හැකියාව ඇති ඤාණය බුදු රජාණන් වහන්සේගේ දිබ්බසොත ඤාණය බව.
- අන්‍ය සත්ත්වයන්ගේ සහ අන්‍ය පුද්ගලයන්ගේ සිත සිය සිතින් පිරිසිඳ දන්නා ඤාණය බුදු රජාණන් වහන්සේගේ චෙතොපරියඤාණය හෙවත් පරචිත්තවිජානනඤාණය බව.
- බුදු රජාණන් වහන්සේ පහත සඳහන් දසබල ඤාණයෙන් ද යුතු බව.
  1. කාරණය, කාරණය වශයෙන් ද, අකාරණය, අකාරණය වශයෙන් ද තතු ලෙස දන්නා 'ඨානඅට්ඨානඤාණය'
  2. අතීත, අනාගත සහ වර්තමාන කර්ම සමාදානයන්ගේ විපාක ප්‍රත්‍ය වශයෙන්, හේතු වශයෙන් තත් වූ පරිදි දන්නා 'කම්මවිපාකඤාණය'
  3. නිරයාදී හැම තැන්හිම යන්නා වූ සර්වත්‍රගාමිණී ප්‍රතිපදාව තතුසේ දන්නා 'සබ්බත්ථගාමිනීපටිපදාඤාණය'
  4. නොයෙක් ධාතු, නොයෙක් ධාතු ලෝක තතු සේ දන්නා 'අනේක ධාතු නානා ලෝකධාතු ඤාණය'
  5. සත්ත්වයන්ගේ නොයෙක් ප්‍රාර්ථනා හෙවත් අධිමුක්තීන් තතු සේ දන්නා 'නානාධිමුත්තිකතාඤාණය'

6. සත්ත්වයන්ගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්හි වෘද්ධිය හා හානිය තතු සේ දන්නා 'ඉන්ද්‍රියපරෝපරියත්තඤාණය'
7. ධ්‍යාන විමෝක්ෂ, සමාධි, සමාපත්තීන්ගේ කෙලෙසීම, පිරිසිදු වීම, නැඟී සිටීම තතු සේ දන්නා (ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති ) 'ඣානාදි සංකිලේසඤාණය'
8. නොයෙක් ආකාර වූ කල්ප ගණන් දුර පූර්වජාති සිහි කිරීම නම් වූ 'පුබ්බෙනිවාසානුස්සතිඤාණය '
9. කාය, වාක්, මනෝ දුශ්චරිතයෙන් යුතු සත්ත්වයන් මරණයෙන් පසු දුගතියට යාමත්, කාය, වාක්, මනෝ, සුචරිතවත් සත්ත්වයන් මරණයෙන් පසු සුගතියට යාමත් යනාදි වශයෙන් මැරෙන, උපදින, හීනප්‍රණීත, සුගතිගාමී දුගතිගාමී, සත්ත්වයන් දැන හඳුනාගන්නා වූ මිනිස් ඇස ඉක්මවා සිටින 'දිබ්බචක්ඛු ඤාණය හෙවත් චුතුපපාතඤාණය'
10. ආශ්‍රවයන් ක්ෂය වීමෙන් ආශ්‍රව නැති චේතෝවිමුක්තියත්, ප්‍රඥාවිමුක්තියත් මෙලොව දී ම තමා ම දැන ප්‍රත්‍යක්ෂ කළ 'ආසවක්ඛයඤාණය'.

- මෙම දසබල ඤාණයන්හි ඇතුළත් පුබ්බෙනිවාසානුස්සති, චුතුපපාත හා ආසවක්ඛය යන තෙවැදෑරුම් ඤාණ ත්‍රිවිද්‍යා (තෙවිජ්ජා) නාමයෙන් හඳුන්වන බව.

### චතුර් වෛශාරi ඤාණ

- බුදු රජාණන් වහන්සේ පහත සඳහන් චතුර්වෛශාරද්‍යඤාණයෙන් යුතු බව.
  1. ''සම්මා සම්බුද්ධ වෙමි යි ප්‍රතිඥා කරන්නා වූ තොප විසින් මෙ නම් ධර්මයෝ අවබෝධ නො කරන ලද්දාහු යයි ද
  2. ක්ෂීණාශ්‍රව වෙමි යි ප්‍රතිඥා කරන්නා වූ තොප විසින් මේ ආශ්‍රවයෝ ක්ෂය නොකරන ලදහ යයි ද
  3. මාර්ගඵලයන්ට අන්තරායකර යයි තොප විසින් ප්‍රකාශ කරන ලද ධර්මයන්, සේවනය කරන්නාට එය අන්තරායකර නොවේ යයි ද
  4. දුක් කෙළවර කිරීම පිණිස තොප විසින් ප්‍රකාශ කරන ලද ධර්මය පිළිපදින්නා වූ තැනැත්තාට දුක් කෙළවර වීම පිණිස හේතු නොවේ යයි ද සහේතුක ව චෝදනා කිරීමට සමත් ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ දෙවියකු හෝ මාරයකු හෝ බ්‍රහ්මයකු හෝ අන් කිසිවකු හෝ ලෝකයෙහි නො සිටිනා බව දන්නා බුදු රජාණන් වහන්සේ නිර්භය ව, විශාරද ව වාසය කරති යන චතුර්විධ විශාරද භාවය චතුර්වෛශාරද්‍යඤාණය බව.

### අකම්පන ඤාණ

- බුදු රජාණන් වහන්සේ ක්ෂත්‍රිය පිරිස, බ්‍රාහ්මණ පිරිස, ගෘහපති පිරිස, ශ්‍රමණ පිරිස, චාතුම්මහාරාජික පිරිස, තාවතිංස පිරිස, මාර පිරිස, බ්‍රහ්ම පිරිස යන අට පිරිස් මැදට භයක්, තැති ගැන්මක් නො මැති ව නිර්භය ව, විශාරද ව එළඹීම 'අට්ඨසු පරිසාසු අකම්පනඤාණ' යනුවෙන් හඳුන්වන බව.
- ඉහත කී ඤාණයන්ට අමතර ව බුදු රජාණන් වහන්සේ තුළ පැවති ඤාණ 73ක් පිළිබඳ ව පටිසම්භිදා මග්ගයේ දැක්වෙන අතර, එම ඤාණ අතුරෙන් 6ක් ෂඩ් අසාධාරණ ඤාණ ලෙස හඳුන්වන බව.

**බුදු රජාණන් වහන්සේගේ ඓතිහාසිකත්වය හා ආශ්චර්යවත් මනුෂ්‍යත්වය**

- බුදු රජාණන් වහන්සේ යනු දෙවියකු, බ්‍රහ්මයකු හෝ දේව අවතාරයක් හෝ නොව සැබෑ ලෝකයේ ජීවත් වූ ඓතිහාසික මනුෂ්‍යයකු ලෙස විද්‍යාත්මක ව සනාථ වී ඇති බව.
- මව, පියා, ඇසුරු කළ පිරිස් ආදීන් පිළිබඳ අව්‍යාජ තොරතුරු හා වාසය කළ ස්ථාන ආදිය පුරාවිද්‍යාත්මක සාධක මෙන් ම පිටක ග්‍රන්ථ හා වෙනත් කෘති හා විවිධ වාර්තා මඟින් ද සනාථ වී ඇති බව.
- බෝසතාණන් වහන්සේ හිමවත පෙනෙන මානයේ කොසොල් නිකේතනයෙහි (කිඹුල්වතෙහි) ආර්‍ය්‍ය වූ ආදිච්ච ගෝත්‍රයෙහි ශාක්‍ය කුලයෙහි ඉපිද පැවිදි වූ බව.

(පබ්බජ්ජා සූත්‍රය - සුත්ත නිපාත)

- බුදු රජාණන් වහන්සේගේ ඓතිහාසික මනුෂ්‍ය ස්වභාවය සනාථ කරන සාධක මහාපරිනිර්වාණ, ධාතුවිභංග, චූළගෝසිංහ, සතිපට්ඨාන, පබ්බජ්ජා, අරියපරියේසන ආදි විවිධ සූත්‍රයන්හි විසිරී ඇති බව.
- මනුෂ්‍යයකු වශයෙන් ඉපදුණ ද, බුදු රජාණන් වහන්සේ මෙලොව වෙනත් කිසිවෙකුට සමාන කළ නො හැකි අනුත්තර ශ්‍රේෂ්ඨ මිනිසකු බව.
- බුදු රජාණන් වහන්සේ දේව, ගන්ධබ්බ, යක්ඛ, මනුස්ස ආදි සීමා ඉක්මවා ගිය ලෝකෝත්තර උතුමකු බව.
- 'බුද්ධ' යනු බුදු රජාණන් වහන්සේ හැඳින්වීමට සුදුසු ම නාමය වන්නේ යයි උන් වහන්සේ විසින් ම ප්‍රකාශ කරනු ලැබ ඇති බව. (ද්‍රෝණ සූත්‍රය - ස.නි.)
- අහං පනානන්ද එතරහි ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො ආසීතිකො මෙ වයො වත්තති ......'' යනාදි වශයෙන් සූත්‍ර ගණනාවක ඇති විවිධ තොරතුරුවලින් බුදු රජාණන් වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවය පැහැදිලි වන බව.

(මහාපරිනිබ්බාණ සූත්‍රය - දී.නි.)

**බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය හා නායකත්වය**

**විශිෂ්ට ශාස්තෘත්වය**

- බුදු රජාණන් වහන්සේ ලෝකයෙහි පහළ වූ විශිෂ්ටතම ශාස්තෘවරයා බව.
- බුදු රජාණන් වහන්සේ මිනිසුන්ට මෙන් ම දෙවියන්ට ද ශාස්තෘවරයා මෙන් ම ගුරුවරයා ද වන බැවින් 'සත්ථා' (ශාස්තෘවරයා) 'තිලෝගුරු' (තුන්ලොවෙහි ගුරුවරයා) යන නම්වලින් හැඳින්වෙන බව.
- ශ්‍රාවක - ශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම්, මනෝභාවයන්, ඔවුන්ගේ සමාජ, ආර්ථික, දේශපාලන, පරිසරය, ඔවුන්ගේ ආගමික, දාර්ශනික පිළිගැනීම් ආදිය සැලකිල්ලට ගනිමින් උපාය කෞශල්‍යයෙන් යුතු ව ශ්‍රාවකයන්ට මඟපෙන්වමින් විශිෂ්ට ශාස්තෘත්වයක් ප්‍රකට කළ බව.
- ස්වාධීන චින්තනය, විමංසනය, විචාරය, ප්‍රශ්න කිරීම, සැක දුරු කරගැනීම ආදිය සඳහා කිසි දු බාධාවක් නො කිරීම විශිෂ්ට ශාස්තෘ ලක්ෂණයක් වූ බව.
- උන් වහන්සේ ගුරුවරයකු, ශාස්තෘවරයකු සතු විය යුතු ශ්‍රාවකයන්ට සවන් දීම, ඉවසීම, නම්‍යශීලී බව අවස්ථානුකූල ව කටයුතු කිරීම, කරුණාව, මෛත්‍රිය, දයානුකම්පාව ආදි සියලු ගුණවල ප්‍රතිමූර්තියක් වූ බව.

- බුදු රජාණන් වහන්සේ විවිධ නයින් දහම් දෙසීමෙහි, මඟ පෙන්වීමෙහි, අභිමත අරමුණ පිණිස යොමු කොට පෙලඹවීමෙහි අපූර්ව හැකියාවෙන් යුතු බව.
- බුදු රජාණන් වහන්සේ පුබ්බභසිත, පුබ්බභාසිත ආදි ගුණවලින් යුතු බව.
- ශ්‍රාවකයන්ට අවශ්‍ය සියලු දේ ගුරුමුෂ්ටි රහිත ව ඉගැන්වූ බව.

(මහාපරිනිබ්බාණ සූත්‍රය- දී.නි.)

- නීතිරීති මඟින් සිය ශ්‍රාවකයන් පාලනය කිරීමට උත්සාහ නො කළ බුදු රජාණන් වහන්සේ ප්‍රථමාභිසම්බෝධි විසි වස තුළ ඔවාදපාතිමොක්ඛයෙන් පමණක් ශ්‍රාවකයන්ට මඟපෙන් වූ බව.
- අවශ්‍යතාවක් පැන නැඟුණු විට පමණක් සංඝ සමාජයේ යහපැවැත්ම පිණිස විනය නීති පැනවූ බව.
- පිරිනිවන් පානා ලෙසට මාරයාගෙන් ලැබුණු ආරාධනය හමුවෙහි, 'භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා' යන සිවුවණක් පිරිස, විශාරදයන්, බහුශ්‍රැතයන්, ධර්මධරයන් නො වන්නාහු ද ස්වකීය ආචාර්යවාදය ඉගෙන පරවාද කරුණු සහිත ව මැඩලා නෛර්යාණික කොට දහම් නො දෙසන්නාහු ද, ඒ තාක් පිරිනිවන් නො පාන්නෙමි'' යි මාරයාට ප්‍රකාශ කිරීමෙන් බුදු රජාණන් වහන්සේගේ ශාස්තෘත්වයේ විශිෂ්ටත්වය හෙළි වන බව.

(මහාපරිනිබ්බාණ සූත්‍රය- දී. නි.)

- පිරිනිවන් පෑමට සුළු මොහොතකට පෙර භික්ෂූන් අමතා ''කිසියම් භික්ෂුවකට බුදුන්, දහම්, සඟුන් පිළිබඳ ව හෝ මාර්ගය පිළිබඳ ව හෝ නිර්වාණගාමී ප්‍රතිපදාව පිළිබඳ ව හෝ යම් සැකයක් විමතියක් ඇත් නම් විමසන්නයි ද, නො විචාරා පසු ව පසුතැවිලි නොවන්නයි ද', තෙවරක් ම ප්‍රකාශ කොට, 'බුදු රදුන් පිළිබඳ ව ඇති ගෞරවය නිසා යමෙක් එසේ නො විචාරන්නේ නම් යහළුවකු ලවා හෝ විමසා දැනගන්නැයි' ද ප්‍රකාශ කිරීමෙන් බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය පැහැදිලි වන බව. (මහාපරිනිබ්බාණ සූත්‍රය -දී.නි.)
- ''මහණෙනි ; මම දැන් ඔබ අමතමි, සියලු සංස්කාර නැසෙන සුළු ය. අප්‍රමාදී ව කටයුතු කරන්න'' යන අන්තිම බුද්ධ වචනයෙහි, පන්සාලිස් වසක් මුළුල්ලේ දේශනා කරන ලද සමස්ත දේශනාව හා ප්‍රතිපදාව වචන හතරකට (වයධම්මා සංඛාරා ; අප්පමාදේන සම්පාදේථ) කැටි කොට පෙන්වීමෙන් බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය ප්‍රකට වන බව.

(මහාපරිනිබ්බාණ සූත්‍රය -දී.නි.)

**නායකත්වය**

- ඉහතින් දක්වන ලද විශිෂ්ට ශාස්තෘ ලක්ෂණ බුදු රජාණන් වහන්සේගේ නායකත්ව ලක්ෂණ ලෙස ද හැඳින්විය හැකි බව.
- අරමුණ කරා සිය පිරිස නිසි ලෙස හික්මවමින් නිරුපද්‍රිත ව මෙහෙයවීම සැබෑ නායකයකු ලෙස බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසක් මුළුල්ලේ ම සිදු කළ බව.
- යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ගුණය මඟින් බුදු රදුන් විශිෂ්ට නායකත්ව ආදර්ශයක් සැපයූ බව.
- අභියෝගවලට නො බිය ව මුහුණ දීමේ අසමසම හැකියාව, උපාය කෞශල්‍යය, තර්කවිතර්ක හමුවේ යථාර්ථවාදී ව කටයුතු කිරීම, ඉතා නිරවුල් ව, නිවැරදි ව ව්‍යක්ත ලෙස බස හැසිරවීම, අනුගාමිකයන්ගේ විශ්වාසය උපරිමයෙන් දිනා ගැනීම, නිහතමානී බව, සරල දිවි පෙවෙත,

චින්තන නිදහස අගය කිරීම යනාදිය බුද්ධ චරිතයෙහි කැපී පෙනෙන නායකත්ව ලක්ෂණ බව.

**බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට දේශනා විලාස හා ඉගැන්වීම් ක්‍රම**

- බුදු රජාණන් වහන්සේ සිය ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ මානසික ස්වභාවය, තේරුම් ගැනීමේ හා දරා ගැනීමේ ප්‍රමාණය, ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්ව ආදිය තේරුම් ගෙන දහම් දෙසීමේ අසමසම හැකියාවෙන් යුතු ශ්‍රේෂ්ඨ ගුරුවරයකු බව.
- බුදු රජාණන් වහන්සේ ශාස්තෘවරයෙකු, ගුරුවරයකු හා දේශකයකු ලෙස උපරිම ඉගෙනුම් පල ශ්‍රාවකයන්ට හිමි කර දුන් බව.
- බුදු රජාණන් වහන්සේ අනුගමනය කළ දේශනා විලාස දෙකක් ලෙස ආනුපුබ්බීකථා (අනුපිළිවෙළ කථා) සහ සාමුක්කංසික දේශනා (තමා විසින් ම මතු කරගත් දේශනා) ලෙස දැක්විය හැකි බව.
- අත්තජ්ඣාසය (සිය අදහස අනුව) පරජ්ඣාසය (ශ්‍රාවකයන්ගේ අපේක්ෂාව අනුව) අට්ඨුප්පත්තික (සිද්ධියක් පදනම් කරගෙන පැහැදිලි කිරීම් වශයෙන්) පුච්ඡාවසික (ප්‍රශ්නවලට පිළිතුරු දීම් වශයෙන්) යන චතුර්විධ අවස්ථාවන් අනුව බුදු රජාණන් වහන්සේ දහම් දෙසූ බව. (මහාවග්ගපාළි)
- ඒකංස ව්‍යාකරණීය (සෘජු ව පිළිතුරු දීම)
  විභජ්ජ ව්‍යාකරණීය (කරුණු විශ්ලේෂණය කොට පිළිතුරු දීම)
  පටිපුච්ඡා ව්‍යාකරණීය (ප්‍රතිප්‍රශ්න නගමින් පිළිතුරු දීම)
  ඨපනීය (පිළිතුරු නොදී පසෙකින් තැබීම) යන සතරාකාරයෙන් තමන්වෙත පැමිණි ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ බව. (සංගීති සූත්‍රය, දී.නි.)
- දහම් දෙසීමෙහි ලා ඉහත කරුණුවලින් උපාය කෞශල්‍යය ප්‍රකට වන බව.
- සිය දේශනාවන්හිලා උපමා භාවිතය විශිෂ්ට ලෙස උපයෝගී කර ගනිමින් ඉතා ගැඹුරු දේශනා පවා සරල ව ඉදිරිපත් කළ බව.
- භාෂාව නිරවුල් ලෙස හා ව්‍යක්ත ලෙස උපයෝගී කරගත් බව.
- මිනිසුන්ට පමණක් නොව, දෙවියන්ට ද, දහම් දෙසීමෙහි අපූරු හැකියාවෙන් යුතු බැවින් ''තිලෝගුරු'' සහ ''සත්ථාදේවමනුස්සානං'' යනුවෙන් ද හඳුන්වන බව.
- දේශනා ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, සංවාද ක්‍රමය, ප්‍රශ්නෝත්තර ක්‍රමය, කතන්දර ක්‍රමය, පියවර ක්‍රමය, පැවරුම් ක්‍රමය, අනාවරණ ක්‍රමය, සූක්ෂ්ම ඉගැන්වීම්, ප්‍රතිකාර්ය ඉගැන්වීම හා සම්පත් භාවිතය ආදි නූතන අධ්‍යාපන විද්‍යාවෙහි භාවිත දියුණු ශිල්පීය ක්‍රම බුද්ධ දේශනා මඟින් මතු කොට ගත හැකි බව.
- බුදු රජාණන් වහන්සේගෙන් දහම් ඇසූ බොහෝ දෙනා බුද්ධ ශ්‍රාවකයන් වී කරන ලද උදාන වාක්‍යයන්ගෙන් උන් වහන්සේගේ විශිෂ්ට දේශනා විලාසය ප්‍රකට වන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. නව අරහාදි බුදුගුණ කියවෙන බුදුගුණ අලංකාරයෙහි එන කවි එකතු කොට පත්‍රිකාවක් සකසන්න.

2. මහාසීහනාද සූත්‍රාගත චතුර්වෛශාරද්‍ය ඥානය පිළිබඳ පැහැදිලි කෙරෙන පාඨ ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.
3. බුදු රජාණන් වහන්සේගේ ඓතිහාසිකත්වය ප්‍රකට වන මූලාශ්‍රයාගත තොරතුරු රැස් කරන්න.
4. ''නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීමෙහි ලා බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ'' යන මැයෙන් ශිෂ්‍ය සමිතියේ කතාවක් පවත්වන්න.
5. බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට දේශනා විලාස හා ඉගැන්වීම් ක්‍රම පැහැදිලි කෙරෙන ලිපියක් සකස් කරන්න.
6. අන්‍යාගමික මිත්‍රයකු සමඟ බුදු රජාණන් වහන්සේගේ ශාස්තෘත්වය හා නායකත්වය පැහැදිලි කෙරෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.

**නිපුණතාව 1.0 :** ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායයේ එන සිද්ධාර්ථ ගෞතම සම්බුද්ධ චරිතය විමර්ශනාත්මක ව අධ්‍යයනය කරමින් චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 1.2 :** බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 20 යි.

**ඉගෙනුම් පල :**

- බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ හඳුනාගනියි.
- බුදු රජාණන් වහන්සේ මානව ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයා බව පිළිගනියි.
- බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශනය කරයි.
- සමානාත්මතාවෙන් හා සහජීවනයෙන් දිවි ගෙවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු රජාණන් වහන්සේගේ විශිෂ්ට චරිත ලක්ෂණ ආදර්ශනය කරමින් සමානාත්මතාවෙන් හා සහජීවනයෙන් ක්‍රියා කිරීමට පෙලඹවීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

## චින්තන නිදහස අගය කිරීම

- බුදු රජාණන් වහන්සේ ඊශ්වරවාදී, නිර්මාණවාදී සංකල්ප පදනම් කර නොගැනීමත් උන් වහන්සේගේ ධර්මයට දිව්‍යමය ප්‍රභවයක් නොමැති වීමත් නිසා බුදුදහම දේව කේන්ද්‍රීය ඉගැන්වීමක් නොවන බව.
- බුදුදහම ගුණ නුවණින් අගතැන්පත් මිනිසකු වන බුදු රදුන් විසින් මිනිසුන් උදෙසා දේශනා කරන ලද මිනිස් ගැටලු විවරණය කොට විසඳුම් පෙන්වා දෙන මානව කේන්ද්‍රීය ධර්ම මාර්ගයක් බව.
- ඓතිහාසික ශාස්තෘවරයකු වූ බුදු රජාණන් වහන්සේ, ප්‍රායෝගික ජීවන දර්ශනයක් හා විමුක්ති මාර්ගයක් දේශනා කළ බව.
- මිනිසාගේ චින්තන නිදහස ඉහළින් ම අගය කළ බුදු රජාණන් වහන්සේ කිසි විටෙක කිසිවකුට සිය ධර්මය පිළිගැනීමට බල කිරීමක් නොකළ බව.
- ස්වච්ඡන්දතාව හෙවත් පාරභෞතික හා බාහිර බලපෑම්වලින් තොර ව නිදහස් ව සිතා නිදහස් ව තීරණ ගෙන, නිදහස් ව ක්‍රියා කිරීම පුද්ගලයාට ඇතැයි ඉගැන්වූ බව.
- අනුශ්‍රවය, පරම්පරාව, පිටක සම්ප්‍රදාය ආදි සාම්ප්‍රදායික ගතානුගතික දැනුම ප්‍රාමාණිකත්වයෙන් නොසැලකිය යුතු බවත්, ස්වාධීන චින්තනයට හා හෘදය සාක්ෂියයට අනුව කටයුතු කිරීම සුදුසු බවත් කාලාම, මහා පරිනිබ්බාණ, චූල්ලහත්ථිපදෝපම, වීමංසක, උපාලි ආදි සූත්‍රවල අවධාරණය කොට ඇති බව.
- බෞද්ධ ඉගැන්වීම්වල එන ඒහිපස්සික, සන්දිට්ඨික, අකාලික ගුණ ඕනෑ පුද්ගලයකුට අත්හදා බැලිය හැකි බව.

- නිවන වුව ද මෙලොව දී තමතමා විසින් වෙන වෙන ම අවබෝධ කොට, අත්විඳිය හැකි අනුභූතියක් බැවින් චින්තන නිදහසට බාධා වන කිසි දු ගුඪ සංකල්පයක් බෞද්ධ ඉගැන්වීම්වල ඇතුළත් නොවන බව.
- ගුඪාර්ථ ඇතුළත් නොවන බැවින් බෞද්ධ ඉගැන්වීම් විවෘත භාවය, විශ්ලේෂණය, විචාරය ඇති කල්හි වඩවඩාත් බැබළීමට ලක්වන බව. (විවටො විරොචති නො පටිච්ඡන්නො)
(පටිච්ඡන්න සූත්‍රය අ.නි.)
- බුදු රජාණන් වහන්සේ පිළිබඳ ව පවා වීමංසනය කළ යුතු යැයි අවධාරණය කරන බුද්ධ දේශනාව, අන්ධානුකරණය, භක්තිය, විචාරයෙන් තොර වූ අමූලිකා ශ්‍රද්ධාව බැහැර කරන බව.

**සමානාත්මතාව, සහජීවනය සහ ආගමික සහනශීලිත්වය**

- ජන්මීය සාධක හෝ සදාචාරමය නොවන වෙනත් කවර හෝ සාධකයක් හෝ මත පදනම් ව මානව වර්ගයා උස් පහත් ලෙසින් වර්ගීකරණය කිරීම බුදු රජාණන් වහන්සේ සපුරා ප්‍රතික්ෂේප කළ බව.
- ඒ අනුව බුදු රජාණන් වහන්සේ සියලු මිනිසුන් සමානාත්වෙන් සලකා කටයුතු කළ බව.
- සහජීවනයෙන් කටයුතු කිරීමට සිය ශ්‍රාවකයන්ට උපදෙස් දුන් බුදු රජාණන් වහන්සේ විවිධ ආගමික සහ සංස්කරණ, දාර්ශනික මතවාදවලින් සංකීර්ණ වූ භාරතීය සමාජයේ විවිධ පිරිස් සමඟ සහජීවනයෙන් හා ආගමික සහනශීලිත්වයෙන් ක්‍රියා කොට ආදර්ශ සැපයූ බව.
- බුදු රජාණන් වහන්සේ හා බුද්ධ ශ්‍රාවකයන් වෙනත් සම්ප්‍රදායවල මහණ බමුණන් වෙත ද, බොහෝ මහණ බමුණන් බුදු රදුන් හා ශ්‍රාවකයන් වෙත ද එළඹ සාකච්ඡා කොට සුහද ව විසූ බව.
- පුබ්බභසිත, පුබ්බභාසිත ගුණවලින් හෙබි බුදු රජාණන් වහන්සේ ඇසුරු කිරීමට, සාකච්ඡා කිරීමට බොහෝ දෙනා ප්‍රිය කළ බවට පෙළ සාහිත්‍යයෙන් නොයෙක් සාධක හමු වන බව.
- බුදු රජාණන් වහන්සේ විසින් ගොඩනගන ලද සංඝ සමාජය සමානාත්මතාව, සහජීවනය පිළිබඳ පරමාදර්ශ සපයන බව.
- විවිධ ආගමික මතවාද දරන කිසිවකු සමඟ වාදවිවාද කිරීමට යථාර්ථවාදී වූ බුදු රජාණන් වහන්සේට කිසි විටෙකත් අවශ්‍ය නොවූ අතර බොහෝ දෙනා උන් වහන්සේට වාදාරෝපණය කොට, උන් වහන්සේ සමඟ විවාද කොට බුද්ධ ශ්‍රාවකයන් වූ බව. (නාහං භික්ඛවේ ලොකේන විවදාමි. ලොකෝච භික්ඛවේ, මයා විවදති) (පුප්ඵ සූත්‍රය- ස.නි.)
- වෙනත් ආගමික මත දරන පුද්ගලයන්ට බුදු රජාණන් වහන්සේ මෛත්‍රියෙන් යුතු ව දහම් දෙසූයේ යථාර්ථය පැහැදිලි කරදීමට මිස ඔවුන් පරාජය කිරීමට නොවන බව.
- වෙනත් ආගමික මහණ බමුණන්ට දායකකාරකාදීන් විසින් දෙනු ලබන ප්‍රත්‍යය පහසුකම් වැළැක්වීමට කිසි විටෙකත් ක්‍රියා නොකළ බුදු රජාණන් වහන්සේ ඒවා එලෙසින් ම පැවැත්වීමට එම අනුගාමිකයන් උනන්දු කළ බව. (උපාලි සූත්‍රය - ම.නි.)

## යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ගුණය

- යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ගුණය බුදු රජාණන් වහන්සේ සතු ව පැවති විශේෂ ගුණයක් ලෙස මූලාශ්‍රයයන්හි විස්තර වන බව. (මහාගෝවින්ද සූත්‍රය -දී.නි.)
- ප්‍රකාශ කරන අයුරින් ම කටයුතු කරන, කටයුතු කරන අයුරින් ම ප්‍රකාශ කරන ගුණය ''යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ගුණය'' ලෙස හැඳින්වෙන බව.
- බුදු රජාණන් වහන්සේ හැම විට ම අවවාදය ආදර්ශයෙන් ප්‍රකට කළ ශාස්තෘවරයකු බව.
- ''යම් සේ වචනයෙන් කියයි ද එයට අනුව ම මොහුගේ කායකර්මය වෙයි. යම් සේ කයින් කර්ම කරයි ද එයට අනුව ම මොහුගේ වචීකර්මය වෙයි. කය වචනය නො ඉක්මවයි. වචනය කය නො ඉක්මවයි. වචනය කයටත් කය වචනයටත් සම වෙයි.'' යනුවෙන් මෙම ගුණය අටුවාවේ විස්තර වන බව. (දීඝනිකායට්ඨකතා )
- බුදු රජාණන් වහන්සේගේ ක්‍රියාව වචනයට සම වෙයි. වචනය ක්‍රියාවට සම වෙයි.'' මෙසේ උන් වහන්සේ යමක් ප්‍රකාශ කළේ ප්‍රත්‍යක්ෂ ඥානයෙන් අත්දැකීමෙන් අවබෝධ කරගෙන බව.
- 'මෙය තමාගේ අන්තිම උපත යැයි ද පුනර්භවයක් නැතැ යි ද, සම්‍යක්සම්බෝධිය අවබෝධ කළෙමි '' යැයි ද ප්‍රතිඥා කළේ සත්‍ය වශයෙන් ම එසේ කළ නිසා බව. (පඨම අස්සාද සූත්‍රය- සං.නි.)
- බුද්ධත්වයට පත් වූයේ යැයි ප්‍රකාශ කළ විට පස්වග මහණුන් විශ්වාස නොකළ විට 'තමා මීට පෙර එසේ කියා ඇත් දැයි' පස්වග මහණුන්ගෙන් ප්‍රශ්න කළ බව. (මහාවග්ගපාළිය)
- බුදු රජාණන් වහන්සේ අන් අයට නිර්වාණගාමී මාර්ගයේ ගමන් කරන ලෙස දේශනා කළේ තමා එම මඟ ගමන් කොට නිවන් පසක් කිරීමෙන් අනතුරු ව බව.
- ''පව් නොකරන්න '' යැයි බුදු රජාණන් වහන්සේ දේශනා කළේ තමා රහසින් වත් පව් නොකළ නිසා බව.
- පෙරබත පමණක් වළඳන ලෙස භික්ෂු -භික්ෂුණීන්ට විකාලභෝජන ශික්ෂාපදය පැනවූයේ තමා එකාසන භෝජනය වළඳමින් එහි ඇති අල්පාබාධ ආදි ගුණ අත්දැකීමෙන් ම විඳිමින් බව. (භද්දාලී සූත්‍රය-ම.නි.)

## තාදී ගුණය හා පද්මාකාර ජීවිතය

- ''තං සදිසො තාදි'' ''එසේ ම ය'' ''එකසමානය'' යන අර්ථයෙන් ''තාදි'' නම් වන බව.
- තථාගතයන් වහන්සේ ලාභයෙහි දී හා අලාභයෙහි දී ද, යසසේ දී හා අයසේ දී ද, නින්දාවේ දී හා ප්‍රශංසාවේ දී ද, සැපේ දී හා දුකේ දී ද යන අටලෝ දහමෙ හිදී ම නො වෙනස් ව සම ව එකසමාන ව සිටින බව.
- ඒ අනුව තථාගතයන් වහන්සේ අටලෝ දහමේ දී කම්පා නොවී සිටීම තාදි ගුණය වන බව.
- බුදු රජාණන් වහන්සේ අටලෝ දහමෙහි දී කෙතෙක් සම ව සිටිත් ද යත්, උන් වහන්සේගේ එක් බාහුවක් සුවඳ ගල්වන්නාහු නම් අනෙක් බාහුව වෑයෙකින් රහින්නා නම්, සුවඳ ගල්වන්නා කෙරෙහි සෙනෙහසක් ද වෑයෙන් රහින්නා කෙරෙහි කෝපයක් ද නැති ව දෙදෙනා කෙරෙහි ම සම සිත් පවත්වන බව.

- උපාලි ගෘහපති, සේල බමුණා ආදීන්ගේ ප්‍රශංසා හමුවේ මෙන් ම අක්කෝසක භාරද්වාජ, මාගන්ධියා, චිංචිමානවිකා, අග්ගිකභාරද්වාජ වැන්නවුන්ගේ නින්දා, ආක්‍රෝෂ පරිභව හමුවේ අකම්පිතව විසූ බව.
- කොසොල් රජුගේ අසදෘශ මහාදානයත්, යව සහලින් ගෙවූ වේරඤ්ජා වසත් සම සිතින් ඉවසූ බව.
- දෙව්දත් වැන්නවුන්ගේ සතුරු ක්‍රියා මෙන් ම, අනාථපිණ්ඩික, විශාඛා වැනි උවසු -උවැසියන්ගේ මිතුරු අනුග්‍රහයන් මඟින් ද කම්පාවට හෝ උද්දාමයට හෝ පත් නොවූ බව.

## පද්මාකාර ජීවිතය

- අටලෝ දහමින් කම්පා නොවූ බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයේ සිට පරිනිර්වාණය තෙක් ගෙවූ වීතරාගී පාරිශුද්ධ ජීවිතය පද්මාකාර ජීවිතයෙන් අර්ථවත් වන බව.
- දියෙහි ඉපිද, දියෙහි වැඩී, දියෙන් උඩට පැමිණ දිය හා නො ගැටී නො තැවරී සුවඳවත් ව, මනෝරම්‍ය ව විරාජමාන වන පුණ්ඩරීකයක් සේ, බුදු රජාණන් වහන්සේ මිනිස් ලොව කෙලෙස් ගහණ මිනිස් සමාජයේ ඉපිද, එහි නොතැවරී පවිත්‍ර ව සුවසේ දිවි ගෙවන බව.

  යථාහි උදකෙ ජාතං - පුණ්ඩරීකං පවඩ්ඪති
  නූපලිප්පති තොයෙන - සුචිගන්ධං මනොරමං
  තථෙව ලොකෙ සුජාතො - බුද්ධොලොකෙ විරජ්ජති
  නූපලිප්පති ලොකෙන - තොයෙන පදුමං යථා

  (නාග සූත්‍රය -අ.නි.)
- බුදු රජාණන් වහන්සේ කෙලෙස් ආතුරයන් අතර අනාතුර ව ද වෛර පුද්ගලයන් අතර අවෛරී ව ද වාසය කළ බව

## බුදු රජාණන් වහන්සේ පිළිබඳ සමකාලීනයන්ගේ ඇගයීම්

- බුදු රජාණන් වහන්සේගෙන් දහම් ඇසූ බොහෝ දෙනා දේශනාව අවසානයේ "අභික්කන්තං භෝ ගෝතම, අභික්කන්තං භෝ ගේතම ......... ආදි වශයෙන් උන් වහන්සේගේ දේශනාවෙහි විශිෂ්ටත්වය වර්ණනා කොට ඇති බව.
- සැරියුත් හිමියන් මෙන් ම බොහෝ ශ්‍රාවක ශ්‍රාවිකාවන් බුදු රජාණන් වහන්සේගේ ගුණ වර්ණනා කළ අවස්ථා කොතෙකුත් ඇති බව.
- කොසොල් රජු වැනි නරපතියන් ද, අනාථපිණ්ඩික වැනි සිටුවරුන් ද, උපාලි වැනි ගෘහපතියන් ද බුදු රජාණන් වහන්සේගේ ගුණ ගායනා කළ බව.
- සේල, වච්ඡගොත්ත, සෝණදණ්ඩ වැනි කීර්තිමත් උගත් බ්‍රාහ්මණ ආචාර්යවරුන් බුදු රජාණන් වහන්සේ පිළිබඳ ව නිර්ලෝභී ව ගුණ ගායනා කර ඇති බව.
- පොට්ඨපාද, සකුළුදායි, පිලෝතික වැනි පිරිවැජියන් ද බුදු රජාණන් වහන්සේගේ ගුණ වෙසෙසින් අගය කළ බව.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. බුදු රජාණන් වහන්සේ ධර්මය අවබෝධ කරවීමෙහි ලා භාවිත කළ විවිධ ක්‍රම ශිල්ප ලැයිස්තු ගත කරන්න.
2. බුද්ධ චරිතයෙන් පිළිබිඹු වන සුවිශේෂ ගුණාංග පිළිබඳ ක්ෂණික කථාවාරයක් සංවිධානය කරන්න.
3. නූතන ශිෂ්‍ය භූමිකාව අර්ථවත් කර ගැනීමෙහි ලා තාදි ගුණය අදාළ කරගත හැකි ආකාරය පිළිබඳව ශිෂ්‍ය සමිතියේ කථාවක් පවත්වන්න.
4. බුදු රජාණන් වහන්සේගේ නව අරහාදි ගුණ ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.
5. බුදු රජාණන් වහන්සේ චින්තන නිදහස අගය කළ අයුරු පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
6. බුදු රජාණන් වහන්සේගේ සමානාත්මතාව සහ සහජීවනය පිළිබඳ දේශනා ඇතුළත් ලිපියක් සකස් කරන්න.

පරිශීලනයට :

- මහාපරිනිබ්බාණ සූත්‍රය — දීඝ නිකාය
- අම්බට්ඨ සූත්‍රය — දීඝ නිකාය
- මහා ගෝවින්ද සූත්‍රය — දීඝ නිකාය
- තේවිජ්ජ සූත්‍රය — දීඝ නිකාය
- සේඛ සූත්‍රය — මජ්ඣිම නිකාය
- උපාලි සූත්‍රය — මජ්ඣිම නිකාය
- වීමංසක සූත්‍රය — මජ්ඣිම නිකාය
- ධාතුවිභංග සූත්‍රය — මජ්ඣිම නිකාය
- පඨම අස්සාද සූත්‍රය — සංයුක්ත නිකාය
- චූළනිද්දේස පාළි — සංයුක්ත නිකාය
- දෝණ සූත්‍රය — අංගුත්තර නිකාය
- කාලාම සූත්‍රය — අංගුත්තර නිකාය
- මහාවග්ගපාළිය — ඛුද්දක නිකාය
- දීඝනිකායට්ඨකථා

**නිපුණතාව 2.0** : පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හා සද්ධර්මයෙහි සුවිශේෂතා හැඳින ධර්මගරුක ජීවිතයක් ගත කරමින් ධර්ම සංරක්ෂණයට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.1** : පාලි ත්‍රිපිටකයේ ව්‍යූහය අධ්‍යයනය කර එහි අන්තර්ගතය සැකෙවින් පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 12 යි.

**ඉගෙනුම් පල** :

- සූත්‍ර, විනය සහ අභිධර්ම යන පද පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරයි.
- ත්‍රිපිටකයේ සැකැස්ම පිළිබඳ ව වැඩිදුර හැදෑරීමට පෙලඹෙයි.
- ත්‍රිපිටකයේ ව්‍යූහය පිළිබඳ ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරයි.
- මතු පරපුර සඳහා ත්‍රිපිටක ග්‍රන්ථ ආරක්ෂා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ත්‍රිපිටකයේ ව්‍යූහය හා අන්තර්ගතය පිළිබඳ දැනුමක් ලබාදීම, ත්‍රිපිටක ග්‍රන්ථ පරිශීලනයට පෙලඹවීම, මතු පරපුර සඳහා ඒවා සුරක්ෂිත කිරීමට යොමු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**ත්‍රිපිටකය හැඳින්වීම**

- විනය ආඥා දේශනාව ලෙස ද, සූත්‍ර සම්මුති දේශනාව ලෙස ද, අභිධර්මය පරමාර්ථ දේශනාව ලෙස ද හැඳින්වෙන බව.
- විවිධ වූ විශේෂ වූ පරියායෙන් ශ්‍රාවකයන්ගේ කය වචනය හික්මවනු ලබන බැවින් සංඝයාගේ ශික්ෂණය පිණිස බුදු රජාණන් වහන්සේ කළ පැනවීම් විනය යන නාමයෙන් හඳුන්වනු ලබන බව.
- සංඝයාගේ අධිශීල ශික්ෂාවට ප්‍රමුඛ වූ මුල් වූ යන අර්ථයෙන් විනය නීති ප්‍රාතිමෝක්ෂ නාමයෙන් හැඳින්වෙන බව.
- බ්‍රාහ්මණ සම්ප්‍රදායයෙහි අමුණන ලද නූල යන අර්ථයෙන් 'සූත්‍ර' යන පදයත්, මැනවින් කියන ලද යන අර්ථයෙන් 'සුත්ත' යන පදයත් භාවිත කොට ඇති බව.
- මේ පද දෙක ම බ්‍රාහ්මණ ඉගැන්වීම්, සංස්කෘත භාෂාවේ ව්‍යාකරණ නියමයන් ආදිය හැඳින්වීම සඳහා භාවිත කොට ඇති බව.
- පාලියෙහි 'සුත්ත' යන්න මැනවින් දේශනා කරන ලද, මැනවින් සංග්‍රහ කරන ලද, මැනවින් අර්ථ රසය ගලායන, අන්තර්ගතය මැනවින් ආරක්ෂා කරන ලද යනාදි අර්ථවලින් භාවිත කොට ඇති බව.
- බුදු රජාණන් වහන්සේ වදාළ ධර්ම - විනය අතුරින් ධර්මය පාලි භාෂාවේ සුත්ත යන පදයෙන් අදහස් කොට ඇති බව.
- ''ධම්ම'' යන පදයට ''අභි'' යන උපසර්ගය එක්වීමෙන් ''අභිධම්ම'' යන පදය නිර්මාණය වී ඇති බව.

- ''අභි'' යන උපසර්ගයෙන් ගැඹුරු ධර්මය, විශිෂ්ට ධර්මය, උත්තම ධර්මය, අතිරේක ධර්මය, විශේෂ ධර්මය ලෙස ''ධම්ම'' යන පදයේ අර්ථය උද්දීපනය වන බව.
- අභිධර්මය විශිෂ්ට, උත්තම හා විශේෂ යැයි සැලකෙන්නේ සත්ත්වයා හා ලෝකය ස්කන්ධ ධාතු ආයතන ආදි වශයෙන් විශ්ලේෂණ හා සංශ්ලේෂණ කෙරෙන නිසා බව.
- සූත්‍ර ධර්මයන්ට අමතර ව බුද්ධ වචනය නිප්පරියාය වශයෙන් ප්‍රකාශ කෙරෙන බැවින් එය අතිරේක ධර්මය වන බව.

**පිටකත්‍රයයේ සැකැස්ම :**

- බුදු රජාණන් වහන්සේ විසින් භික්ෂු, භික්ෂුණී උභතෝ සංඝයාගේ ශික්ෂණය හා යහපැවැත්ම පිණිස ප්‍රඥප්ත ශික්ෂා ඇතුළත් ග්‍රන්ථ සමූහය විනය පිටකය යනුවෙන් හැඳින්වෙන බව.
- විනය පිටකය පාරාජික, පාළි, පාචිත්තියපාළි, මහාවග්ගපාළි, චුල්ලවග්ගපාළි, පරිවාරපාළි යනුවෙන් ග්‍රන්ථ පහකින් සමන්විත වන බව.
- භික්ෂු විනය පාරාජිකා 4, සංඝාදිසේස 13, අනියත 02, නිස්සග්ගිය 30, පාචිත්තිය 92, පාටිදේසනීය 4, සේඛියා 75, අධිකරණ සමථ 07 යනුවෙන් ශික්ෂාපද දෙසිය විසිහතකින් (227) යුක්ත බව.
- භික්ෂුණී විනය පාරාජිකා 8, සංඝාදිසේස 17, නිස්සග්ගිය 30, පාචිත්තිය 166, පාටිදේසනීය 8, සේඛියා 75, අධිකරණ සමථ 7 යනුවෙන් ශික්ෂාපද තුන්සිය එකොළහකින් ද (311) සමන්විත බව.
- සුත්ත විභංග, ඛන්ධක, පරිවාර යනුවෙන් ද විනය පිටකය වර්ග කර ඇති බව.
- බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය සංග්‍රහ කොට ඇති ග්‍රන්ථ සමූහය සූත්‍ර පිටකය නමින් හැඳින්වෙන බව.
- සූත්‍ර පිටකය මූලික වශයෙන් දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය යනුවෙන් නිකාය ග්‍රන්ථ පහකට බෙදා දක්වා ඇති බව.

**දීඝ නිකාය**

| | |
|---|---|
| සීලක්ඛන්ධ වග්ගය | - බ්‍රහ්මජාලාදි සූත්‍ර 13කින් ද, |
| මහාවග්ගය | - මහාපදානාදි සූත්‍ර 10කින් ද, |
| පාටික වග්ගය | - පාටිකාදි සූත්‍ර 11කින් ද වශයෙන් මුළු සූත්‍ර 34කින් යුක්ත බව. |

**මජ්ඣිම නිකාය**

- මූල පණ්ණාසක, මජ්ඣිම පණ්ණාසක හා උපරි පණ්ණාසක යනුවෙන් ප්‍රධාන කොටස් තුනකින් යුක්ත බව. මූල පණ්ණාසකය, මූල පරියාය වග්ගය ආදි වග්ග පහකට ඇතුළත් සූත්‍ර පනහකින් ද, මජ්ඣිම පණ්ණාසකය, ගහපති වග්ගය ආදි වග්ග පහකින් සහ සූත්‍ර පනහකින් ද, උපරි පණ්ණාසකය දේවදහ වග්ගය ආදි වග්ග පහකින් සහ සූත්‍ර පනස් දෙකකින් ද යුක්ත බව
- සංයුක්ත නිකාය සගාථ වග්ගය ආදි වග්ග පහකට ඇතුළත් සූත්‍ර හත්දහස් හත්සිය හැට දෙකකින් යුක්ත යැයි සැලකෙන බව.

- අංගුත්තර නිකාය ඒකක, දුක, තික ආදි සංඛ්‍යා පිළිවෙළින් සැකසුණු නිපාත එකොළහකින් සහ වග්ග 184කින් ද, සූත්‍ර නවදහස් පන්සිය පනස්හතකින් ද යුක්ත යැයි සැලකෙන බව.
- ඉහත කී දීඝනිකාය ආදියට ඇතුළත් නොවූ බුද්ධ වචන ග්‍රන්ථ 15ක් ලෙස ඛුද්දකනිකායට ඇතුළත් බව.
- එම ග්‍රන්ථ පසළොස (15) ඛුද්දක පාඨ, ධම්ම පද, උදාන, ඉතිවුත්තක, ජාතක, ථෙරගාථා, ථෙරීගාථා, සුත්ත නිපාත, අපදාන, බුද්ධ වංස, චරියා පිටක, පටිසම්භිදාමග්ග, නිද්දේස, විමානවත්ථු, පේතවත්ථු වන බව.
- බුද්ධ භාෂිත මෙන් ම ශ්‍රාවක භාෂිත ද සූත්‍ර පිටකයට ඇතුළත් වන බව.
- සූත්‍ර පිටකයෙහි පටිච්ච සමුප්පාදය , චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, ත්‍රිලක්ෂණය, කර්මය, පුනර්භවය ආදි මූලික බෞද්ධ ඉගැන්වීම් විස්තර වන බව.
- අගාරික හා අනගාරික යන ප්‍රතිපදා දෙක ම සූත්‍ර පිටකයේ විස්තර වන බව.
- අභිධර්ම පිටකය ප්‍රකරණ සතකින් යුක්ත වන බව.
- ධම්ම සංගහ යනුවෙන් ද හඳුන්වන ධම්ම සංගණිය අභිධම්ම මාතිකා, සුත්තන්ත මාතිකා, රැසක් විවරණය කරන අතර පඤ්චස්කන්ධයට අයත් චිත්තාංග නම් වූ නාම ධර්ම ද, භූත රූප, උපාදාය රූප ද විස්තර කරන බව.
- සුත්තන්ත භාජනීය, අභිධම්ම භාජනීය, පඤ්හා පුච්ඡක යන ත්‍රිවිධ ක්‍රමයෙන් ඛන්ධාදි විභංග දහඅටක ධර්ම විභාග, විභංග ප්‍රකරණයෙහි ඇතුළත් බව.
- පඤ්චස්ඛන්ධ, ද්වාදසායතන ආදි අභ්‍යන්තර මාතිකවල එන එකසිය විසිපහක් පද මෙහි ඇතුළත් වන අතර, විභාග වන සියලු ධර්ම ස්වභාවාර්ථයෙන් ධාතු නම් වන බැවින් ධාතුකථාප්පකරණය යනුවෙන් හඳුන්වන බව.
- පුද්ගලයා යන පැනවීමෙහි ප්‍රභේද ප්‍රකාශ කිරීම ප්‍රමුඛ අරමුණ කරගත් පුද්ගල ප්‍රඥප්තිය, උද්දේස සහ නිද්දේස වශයෙන් දෙයාකාරයකින් යුක්ත වන බව.
- තුන්වැනි ධර්ම සංගායනාවසානයේ දී මොග්ගලිපුත්ත තිස්ස මහරහතන් වහන්සේ විසින් පරවාද 500ක් මර්ධනය කරමින් සකවාද 500ක් උද්දීපනය කරමින් කථාවත්ථුප්පකරණය රචනා කළ බව.
- මූලයමක, ඛන්ධයමක ආදි දස වැදෑරුම් යමකයන් මඟින් අනෙක් ප්‍රකරණයන්හි ඇතුළත් ධර්ම කාරණ විස්තර කිරීම යමකප්‍රකරණයෙන් සිදු කරෙන බව.
- හේතු ආරම්මණාදි කරුණු ආශ්‍රයයෙන් භවය හා නිවන පිළිබඳ ප්‍රත්‍යයය විස්තර කිරීම පට්ඨානප්පකරණයෙන් සිදු කෙරෙන බව.
- චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ යන සතර පරමාර්ථ ධර්මයන් අභිධර්මයෙහි ඇතුළත් බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. පුස්තකාලය පරිශීලනය කරමින් ත්‍රිපිටකය හඳුන්වන අටුවා පාඨ එක්රැස් කරන්න.
2. ත්‍රිපිටකයේ ව්‍යූහය හා සැකැස්ම පිළිබඳ සංකල්ප සිතියමක් නිර්මාණය කරන්න.
3. ත්‍රිපිටකයේ ඇතුළත් සංඛ්‍යා ධර්ම පිළිවෙළින් වැඩි වන ආකාරය දක්වෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.
4. එක් එක් නිකායයන්ට අයත් ග්‍රන්ථ නාමාවලියක් සකසන්න.
5. විනය පිටකයේ භික්ෂු-භික්ෂුණී උභතෝ විනය ශික්ෂාපද වෙන් වෙන් ව දක්වන්න.
6. අභිධර්ම පිටකය පිළිබඳ කරුණු හැදෑරීමෙන් තම ජීවිතය සාර්ථක වන ආකාරය දක්වෙන ලිපියක් ලියන්න.

**නිපුණතාව 2.0** : පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හා සද්ධර්මයෙහි සුවිශේෂතා හැඳින ධර්මගරුක ජීවිතයක් ගත කරමින් ධර්ම සංරක්ෂණයට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.2** : බුද්ධ ධර්මයේ අනන්‍යතාව හැඳින ධර්ම ගෞරවය ඇති කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 22 යි.

**ඉගෙනුම් පල** :

- බුද්ධ ධර්මයේ සුවිශේෂතා හඳුනාගනියි.
- ධර්මය පිළිබඳ ගෞරවය ඇති කරගනියි.
- ධර්ම පත්‍රිකා මුද්‍රණය කර බෙදා හරියි.
- සැම විට ම විමර්ශනශීලී ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුද්ධ භාෂිත සද්ධර්මයේ සුවිශේෂතා අධ්‍යයනය කර, විමර්ශනශීලී, විචාරපූර්වක සහ ධර්මානුකූල ජීවිතයක් ගොඩනගා ගැනීමට ශිෂ්‍යයාට මඟපෙන්වීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**ස්වාක්ඛාතාදි සවැදෑරුම් දහම් ගුණ**

- 'ස්වාක්ඛාතෝ' යන්නෙහි වචනාර්ථය මැනවින් ප්‍රකාශිත යන්න බව.
- වැරදි ලෙස ප්‍රකාශිත දහමක් ප්‍රගුණ කිරීමෙන් වෙහෙසට පත් වීම විනා අන් කිසි දු ප්‍රයෝජනයක් නොලැබෙන බව. (අචේල සූත්‍රය- ස.නි.)
- ස්වාක්ඛාත ධර්මයෙහි වීර්යාරම්භය ප්‍රතිඵලදායක බව.
- 'සන්දිට්ඨික' යනු ඇස් පනාපිට ම තමාට ම දූන දූක ප්‍රතිඵල උදා කර ගත හැකි දහමක් යන්න බව. (දුතිය සන්දිට්ඨික සූත්‍රය- අං. නි.)
- ''අකාලික'' යනු නිවැරදි ව පිළිපැදීමෙන් කල් නොයවා ඕනෑ ම කාලයක දී ප්‍රතිඵල අත්දැකිය හැකි දහමක් බව. (සම්බහුල සූත්‍රය, සං.නි. )
- 'ඒහි' යනු එන්න යන අර්ථය ද 'පස්සික' යනු බලව යන අර්ථය ද ගෙන දෙන අතර, 'ඒහිපස්සික' යන්නෙන් අන්ධ භක්තියෙන් නොපිළිගෙන පරීක්ෂා කර බලා පිළිගැනීමට පොලඹවන අර්ථවත් දහමක් කියැවෙන බව. (අචේල සූත්‍රය-සං. නි.)
- 'ඕපනයික' යන්නෙන් සමීපයට පමුණුවන්නේ ය යන වචනාර්ථය ගෙන දෙන අතර (උපනය) තමාගේ සිතට ම පමුණුවාගෙන අත්දැකිය යුතු දහමකැයි ඉන් කියවෙන බව. (දුතිය ගද්දුලබද්ධ සූත්‍රය- සං.නි.)
- 'පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි' යන්නෙන් නුවණැත්තන් විසින් තම තමන් වෙන් වෙන් වශයෙන් සිට අවබෝධ කළ යුතු දහමකැයි පැවසෙන බව. (ධම්මපද - මග්ගවග්ග 2-3 ගාථා)
- බුදුදහමේ සුවිශේෂ ප්‍රධාන ගුණ හය මෙම පාඨයෙන් ප්‍රකාශිත බව.

### බුදුදහම දේව අනාවරණයක් නොවීම

- මානව ඉතිහාසයේ පහළ වූ සැම ආගමක් ම දේවවාදී හෙවත් නිර්මාණවාදී සහ අදේවවාදී හෙවත් නිර්මාණවාදී නොවන වශයෙන් වර්ගීකරණය කළ හැකි බව.
- දේවවාදී ආගම්වල ඇතුළත් වන ඉගැන්වීම් දිව්‍යමය බලවේගයක් විසින් ලොවට හෙළි කරන ලද්දේ යැයි විශ්වාස කෙරෙන බව.
- අරිය පරියේසන සූත්‍රයට අනුව තමා විසින් ම කරන ලද ආර්ය පරියේෂණයේ ප්‍රතිඵලයක් ලෙස බුදු දහම අනාවරණය කර ගත් බව.
- පටිච්චසමුප්පාද න්‍යායය පදනම් කරගත් ප්‍රායෝගික විවරණයක් අනුව එම අනාවරණය ගොඩනැගී ඇති බව.
- ලොව පවතින යථාර්ථය වන ත්‍රිලක්ෂණය බුදු රජාණන් වහන්සේ විසින් ම ස්වප්‍රත්‍යක්ෂයෙන් දැන දැක ප්‍රකාශිත බව.
- චතුරාර්ය සත්‍යය, තිපරිවට්ට ද්වාදසාකාර වශයෙන් ඥානය ලබන තෙක් ම බුදු රජාණන් වහන්සේ පවා සම්මා සම්බුද්ධත්වය ප්‍රකාශ නො කළ බව.
- පළමු ධර්ම දේශනාවසානයේ දී දෙවියන් අතර ඇති වූ කතිකාවෙන් ද බුදුදහම දේව අනාවරණයක් නොවන්නේ යැයි තහවුරු වන බව.
- දැන දැක ප්‍රකාශ කරන දෙය ම සත්‍යානුරක්ෂණය මත පිහිටා කරන ප්‍රකාශයක් ලෙස දක්වන බව.
- බුදු රජාණන් වහන්සේ අවබෝධ කළ ධර්මය ඕන ම අයකුට අනුපූර්ව ප්‍රතිපදාව වශයෙන් ප්‍රගුණ කිරීම මඟින් ප්‍රතිවේධ කළ හැකි බව.

### බුදුදහම ආත්මවාදයක් නොවීම

- භාරතීය දර්ශනය නමැති ප්‍රාසාදය ගොඩනැගූ කුලුනු දෙක නම් ආත්මවාදය හා නිර්මාණවාදය යැයි රාධක්‍රිෂ්ණන් විසින් පෙන්වා දෙනු ලැබ ඇති බව.
- පාලි භාෂාවේ 'අත්ත' ශබ්දයෙන් ආත්මය, මට අයත්, නිත්‍ය, මම, තමා යන්න ගම්‍ය වන බව.
- මම දැන් සිටිමි, අතීතයේ ද සිටියෙමි, අනාගතයේ ද සිටින්නෙමි යන්න ආත්මවාදයේ පදනම බව.
- එවැනි ආත්මයක් පසෙකින් තැබීම අනාත්මවාදය වන බව.
- බුදුදහමේ සුවිශේෂත්වය වන්නේ ආත්මවාදය පසෙකින් තබා සත්ත්වයා හා ලෝකය පිළිබඳ ව විග්‍රහ කිරීම බව.
- සත්ත්වයා හා ලෝකය යනු ස්කන්ධ, ධාතු, ආයතන ආදි ධර්මයන්ගේ පටිච්චසමුප්පන්න ප්‍රවාහයක් බව.
- ආත්මයක් ඇත යන දෘෂ්ටිය පසෙකින් තැබීමේ වැදගත්කම බුදුසමය විවිධ ආකාරයෙන් සනාථ කරන බව.
- ආත්ම යනුවෙන් යම් අවිනශ්වර වූ පදාර්ථයක් වේ නම්, එය අප කැමති පරිදි හැසිරවීමට හැකි විය යුතු බව. (අනත්තලක්ඛණ සූත්‍රය-සං.නි. )

- අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අසුභ ලක්ෂණ සහිත ධර්මයන් නිත්‍ය, සුඛ, සුභ ආත්ම යැයි සත්ත්වයාට හැඟීමෙන් (සඤ්ඤා) දැකීමෙන් (දිට්ඨි) හා සිතීමෙන් (චිත්ත) විපල්ලාසයකට (විකෘතියකට) පැමිණෙන බව. (විපල්ලාස සූත්‍රය-අං.නි.)
- රූපාදි ස්කන්ධ නිත්‍ය නොවන බැවින් දුක් සහිත බව හා දුක් සහිත වන බැවින් නිත්‍ය, සුඛ, ආත්ම වශයෙන් ගත නොහැකි බව. (අනත්ත ලක්ඛණ සූත්‍රය-සං.නි.)
- රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ විෂයයෙහි ස්වාමිත්වයක් තමාට නැති බව හා තමා යටතේ සිටින අයකුට දඬුවම් කළ හැකි නමුත් පඤ්චස්කන්ධයට එසේ කළ නොහැකි බව හා එබැවින් එය ආත්ම වශයෙන් සැලකිය නොහැකි බව. (චූළසච්චක සූත්‍රය-ම.නි. )
- රූපාදි පංචස්කන්ධය පිළිබඳ තණ්හාව අතහැර, මගේ නොවේ, මානය අත්හැර, මම නො වෙමි, දෘෂ්ටිය අත්හැර, මගේ ආත්මය නොවේ යැයි මෙසේ මෙනෙහි කරන තැනැත්තාගේ සිත රූපාදි ස්කන්ධයන් කෙරෙහි කලකිරෙයි, කලකිරුණේ නො ඇලෙයි, නො ඇලීමෙන් අතහැර දමා මිදෙයි, මිදුණු කල්හි මිදුනේය යන ඥානය පහළ වෙයි ආදි වශයෙන් ආත්මදෘෂ්ටි ප්‍රහාණය නිවනට උපකාරී වන බව. (අලගද්දූපම ආදි බොහෝ සූත්‍ර)
- සත්ත්වයා හා ලෝකය යනු ස්කන්ධ, ධාතු, ආයතනාදීන්ගේ සංයෝගයකි. එනම් මූල සාධක, ශක්තිවල එකතුවකැ යි පඤ්චස්කන්ධ විභාග මඟින් විශ්ලේෂණාත්මක ව පෙන්වා දෙන බව.
- එම මූල සාධක කිසිවක් ස්වාධීන ව, ස්වතන්ත්‍ර ව, හුදෙකලා ව නො පවතින්නේ යැයි ද හේතුප්‍රත්‍යය වශයෙන් එකිනෙකට සාපේක්ෂ ව එකිනෙකට උපකාරී ව පවතින්නේ යැයි ද සංශ්ලේෂණාත්මක ව විස්තර කරන බව.
- ඉහත කී විශ්ලේෂණය හා සංශ්ලේෂණය මඟින් ආත්මවාදය පසෙක තබන බව.

**බුදුදහම සිතා විමසා පසක් කළ යුතු දහමක් වීම**

- දේව නිර්මාණවාදී චින්තනයේ දී ගවේෂණයට, විමර්ශනයට, ඉඩක් නොලැබෙන බව. (තේවිජ්ජ සූත්‍රය- දී.නි.)
- වඩාත් ප්‍රබුද්ධ නිදහස් චින්තනයක් බුදුසමයෙහි දක්නට ලැබෙන බව. (උපාලි සූත්‍රය- ම.නි.)
- බුදුසමයේ අවසාන පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට නිදහස් චින්තනය පූර්වංගම අවශ්‍යතාවක් ලෙස අවධාරිත බව.
- එය අනුස්සව ආදි කිසියම් ඥාණ මාර්ගයකින් පමණක් ම අවබෝධ කර ගත නො හැකි බව. (කාලාම සූත්‍රය- අ.නි.)
- එය ආචාරාත්මක පදනම නො ඉක්මවූවක් බව. (කාලාම සූත්‍රය- අ.නි.)
- බුදුසමය විසින් කිසිවක් සත්‍ය දැයි තම තමා විසින් ම සිතා විමසා බලා ක්‍රියා කිරීමේ අවශ්‍යතාව අවධාරිත බව. (කාලාම සූත්‍රය- අ.නි.)
- බුදු රජාණන් වහන්සේ පිළිබඳ ව වුව ද නිදහස් විමර්ශනයකට අවස්ථාව සලසා දී ඇති බව. (වීමංසක සූත්‍රය- ම.නි.)
- ධර්ම විනය බබළන්නේ ද එලෙස විවෘත වූ කල්හි බව. (පටිච්ඡන්න සූත්‍රය- අ.නි.)

- නිර්වාණාවබෝධය සඳහා 'පරතෝඝෝසය' උපකාරී වුවත් 'යෝනිසෝමනසිකාරයෙන්' තොර ව විමුක්තිය සාධනය නො කළ හැකි බව. (මහාවේදල්ල සූත්‍රය- ම.නි.)
- අන්ධානුකරණය බුදුසමය විසින් බැහැර කරන බව. (අන්ධූපම සූත්‍රය- අ.නි.)
- බුද්ධ ධර්මය සසර දුකින් එතෙර වීමට මඟපෙන්වන පහුරක් වැනි ය. එය දෘෂ්ටියක් ලෙස කර තබාගෙන යාමට නොවන බව. (අලගද්දූපම සූත්‍රය- ම.නි.)
- ධර්මය වුව ද දෘෂ්ටියක් සේ දැඩි ව ගැනීම සර්පයකු වරදවා ගැනීමක් වැනි බව. (අලගද්දූපම සූත්‍රය -ම.නි.)
- පටිච්චසමුප්පන්න වූ සත්‍යය සෙවීමට බුදුසමය මඟපෙන්වන බව. (පටිච්ඡන්න සූත්‍රය- ස.නි.)
- පර්යේෂණය ආර්ය - අනාර්ය වශයෙන් ද්විධ වන අතර බුදුසමය පළමු වැන්න අනුදක්නා බව. (අරියපරියේසන සූත්‍රය- ම.නි.)
- ඕන ම කරුණක් සම්බන්ධයෙන් අප විසින් විමර්ශනය කළ යුතු පැතිකඩ 5ක් වශයෙන් 1 සමුදය - හටගැනීම 2 අත්ථංගම - අභාවය 3 අස්සාද - ආශ්වාදය 4 ආදීනව - ප්‍රතිඵලය 5 නිස්සරණ - නැති කිරීම දක්වා ඇති බව. (බ්‍රහ්මජාල සූත්‍රය- දී.නි.)
- මෙය ම සත්‍ය ය අන් සියල්ල අසත්‍ය ය යන දෘෂ්ටිය ගත් තැනැත්තා ස්වමත සාධනයටත්, පරමත ඛණ්ඩනයටත් පෙලඹෙන අතර එය නිදහස් චින්තනයට බාධාවක් බව. (අග්ගිවච්චගොත්ත සූත්‍රය- ම.නි.)
- අනුපූර්ව ශික්ෂාව, අනුපූර්ව ක්‍රියාව, අනුපූර්ව ප්‍රතිපදාව බුදුසමය අනුදක්නා බව. (කීටාගිරි සූත්‍රය- ම.නි.)
- සතරමහාපදේස පිළිබඳ දේශනාවෙන් බුදුදහමේ එන සිතීමේ විමසීමේ නිදහස ප්‍රකට වන බව.

**බුදුදහම විශ්ව සාධාරණ ඉගැන්වීමක් බව**

- මානව ඉතිහාසයේ බිහි වූ සෑම ශාස්තෘවරයකු ම සිය ආගමික ඉගැන්වීම් විශ්ව සාධාරණ යැයි අවධාරණය කිරීමට උත්සාහ දරා ඇති බව.
- බුදුදහම විශ්ව සාධාරණ වන්නේ ප්‍රමුඛ වශයෙන් ම හේතුඵල දහමක් වන නිසා බව.
- බුදුදහම සමස්ත විශ්වයට ම සාධාරණ නියාමයන් ඉදිරිපත් කරන බව.
- සියල්ල පටිච්චසමුප්පන්න වූත් ස්වතන්ත්‍ර නො වූත් දේ බව.
- ඇත යන අන්තය නිසා ශාස්වතවාදයත්, නැත යන අන්තය නිසා උච්ඡේදවාදයත් බිහි වන අතර එම වාද දෙක ම පසෙකින් තබන බුදුදහම මධ්‍යම දේශනාවක් ලෙස පටිච්චසමුප්පාදය උගන්වන බව හා එසේ ම අත්තකිලමථානුයෝගයත්, කාමසුඛල්ලිකානුයෝගයත් පසෙකින් තබා මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය දේශනා කරන බව.
- චතුරාර්ය සත්‍යය, ත්‍රිලක්ෂණය, පටිච්චසමුප්පාදය, මධ්‍යම ප්‍රතිපදාව විශ්ව සාධාරණ ඉගැන්වීම් බව.
- බුදුදහමින් විශ්ව සාධාරණ සදාචාර දර්ශනයක් ඉගැන්වෙන බව.
- මානව ශක්‍යතාව හා ස්වාමිත්වය අගයන දහමක් වශයෙන් ද බුදුදහම විශ්ව සාධාරණ වන බව.
- සමස්ත බෞද්ධ ඉගැන්වීම් විශ්වයේ යථාර්ථය හා අනුරූප වන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. ස්වාක්ඛාතාදී දහම් ගුණ පිළිබඳ මූලාශ්‍රය භාවිත කරමින් අර්ථ විවරණ ඇතුළත් පත්‍රිකාවක් නිර්මාණය කරන්න.
2. ''දහම් ගුණ ජීවිතයේ ප්‍රගතියට අදාළ කරගත හැකි අයුරු'' යන මැයෙන් සාකච්ඡාවකට කරුණු පෙළ ගස්වන්න.
3. දහම් ගුණ මාතෘකා කොට ක්ෂණික කථාවාරයක් සංවිධානය කරන්න.
4. බෞද්ධ ඉගැන්වීම්වල ප්‍රායෝගික ලක්ෂණ තහවුරු කළ හැකි මූලාශ්‍රය සාධක ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.
5. ''බුදුදහම සිතීමේ හා විමසීමේ නිදහස තහවුරු කරයි.'' යන මාතෘකාව යටතේ කථික තරඟයක් පවත්වන්න.
6. බුදුදහම විශ්ව සාධාරණ දහමක් බව සනාථ කිරීමට අවශ්‍ය මූලාශ්‍රය ඇසුරින් කරුණු රැස් කරන්න.

**නිපුණතාව 2.0 :** පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හා සද්ධර්මයෙහි සුවිශේෂතා හැඳින ධර්මගරුක ජීවිතයක් ගත කරමින් ධර්ම සංරක්ෂණයට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.3 :** බෞද්ධ ඉගැන්වීම් ප්‍රගුණ කරමින් උභයාර්ථ සාධනයෙහි යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 16 යි.

**ඉගෙනුම් පල :**

- උභයාර්ථ සාධනය පිණිස ධර්මයේ උපයෝගිතාව පැහැදිලි කරයි.
- බුදුදහම ප්‍රායෝගික ජීවන දර්ශනයක් බව පිළිගනියි.
- පාසල තුළ බෞද්ධ සංගමයක් පිහිටුවයි.
- සමාජ සුභසාධන කටයුතුවල නිරත වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදුදහම උභයාර්ථ සාධනය පිණිස උපයෝගී කරගත හැකි ප්‍රායෝගික ජීවන දර්ශනයක් මෙන් ම, විමුක්ති මාර්ගයක් බව හඳුනාගෙන පුද්ගල- සමාජ සංවර්ධනය කෙරෙහි ශිෂ්‍යයා යොමු කරවීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**උභයාර්ථය හැඳින්වීම**

- අත්තහිත - පරහිත (ස්වාර්ථ - පරාර්ථ), මෙලොව- පරලොව, (ඓහලෞකික - පාරලෞකික) ලෞකික - ලෝකෝත්තර, පුද්ගල සමාජ ආදි වශයෙන් උභයාර්ථය හැඳින්විය හැකි බව.
- මංගල, මෙත්ත, ව්‍යග්ඝපජ්ජ ආදි සූත්‍රයන්හි දේශිත කරුණු පිළිපැදීමෙන් උභයාර්ථ සාධනය සිදු වන බව.
- සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන සදිසා නමස්කාරය මඟින් පුද්ගල - සමාජ සංවර්ධනය සිදු කරගත හැකි බව.
- පරාභව සූත්‍රයේ එන පරාභව කරුණු, වසල සූත්‍රයේ එන වසල කරණ ධර්ම, සිගාලෝවාද සූත්‍රයේ එන තුදුස් පාපධර්ම පුද්ගල - සමාජ පරිහානියට හේතු වන බව.

**බුදුදහම ප්‍රායෝගික ජීවන දර්ශනයක් ලෙසඃ**

- බුදුදහම ප්‍රායෝගික ව ප්‍රගුණ කළ යුතු දහමක් බව.
- චතුරාර්ය සත්‍යය, ත්‍රිලක්ෂණය, පටිච්ච සමුප්පාදය, පසක් කිරීම විමුක්ති ලාභයට අදාළ වන අතර එම ඉගැන්වීම් අනුසාරයෙන් සාර්ථක, ප්‍රායෝගික ජීවන දර්ශනයක් ද ගොඩනගා ගත හැකි බව.
- ලෝක යථාර්ථය පිළිබඳ අවදිකම ජීවන ගැටලු විසඳා ගැනීමට ප්‍රායෝගික ව භාවිත කළ හැකි බව.
- කායික - වාචසික සංවරය හෙවත් ශීලය යහපත් ජීවන දර්ශනයක පදනම වන බව.

- ශීලාදි ගුණ ධර්මවලින් තොර වූ තැනැත්තාට ජීවිකාව පැවැත්ම පිළිබඳ භය (ආජීවික භය), ගැරහුම්වලට බිය (අසිලෝක භය), පිරිස් මැද බිය (පරිසසාරජ්ජ භය), මරණයට බිය (මරණ භය), දුගතියට බිය (දුග්ගති භය), යන බිය ඇති වන්නේ යැයි සඳහන් වන බව.

(බල සූත්‍රය- අං.නි. 5.)

- නොඇලී (අගථිත), මූර්ඡා නොවී (අමුච්ඡිත), ආදීනව දකිමින් (ආදීනව දස්සාවි), නො ගැලී (අනජ්ඣාපන්න), අත්හළ යුතු බව දැන (නිස්සරණ පඤ්ඤා), පරිභෝජනයට පුහුණු වීම මගින් තෘප්තිමත් ප්‍රායෝගික ජීවිතයක් ගොඩනගා ගත හැකි බව. (රාසිය සූත්‍රය ස.නි. )
- පඤ්ච උපාදානස්කන්ධ හා පඤ්චකාම සම්පත්තිය ගැටලු උත්පාද කරන බව දැන හැඳින මනා සිහියෙන් කටයුතු කිරීමෙන් ගැටලු විරහිත ජීවන ප්‍රතිපදාවක් නිර්මාණය කරගත හැකි බව.
- සතර සංග්‍රහ වස්තු, සතර බ්‍රහ්ම විහරණ ආදි ඉගැන්වීම් යහපත් ජීවන චර්යාවක් හා දර්ශනයක් නිර්මාණයෙහි ලා උපයෝගී කරගත හැකි බව.

**බුදු දහම විමුක්ති මාර්ගයක් ලෙස :**

- මානව ඉතිහාසයේ බිහි වූ සැම ආගමක් ම කිසියම් විමුක්තියක් අරමුණු කරගෙන ඇති බව.
- දේවවාදී ආගම් තම විමුක්ති සාධනය පාරභෞතික බලවේගයකට පවරා දී ඇති බව.
- විමුක්ති මාර්ග ලෙස ඉදිරිපත් වුවත්, සමකාලීන ශ්‍රාමණික ඉගැන්වීම් ද පිරිපුන් බ්‍රහ්මචර්යාවක් ප්‍රකාශ නො කළ බව.
- සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ විසින් ස්වප්‍රත්‍යක්ෂයෙන් අනාවරණය කරන ලද විමුක්ති මාර්ගයක් බුදුසමය ඉදිරිපත් කරන බව. (අරියපරියේසන සූත්‍රය- ම.නි.)
- ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාව අනුපූර්ව ශික්ෂාවක්, අනුපූර්ව ක්‍රියාවක්, අනුපූර්ව ප්‍රතිපදාවක් ලෙස වර්ධනය කිරීම මගින් කෙනෙකුට විමුක්තිය පසක් කළ හැකි බව.

(කීටාගිරි සූත්‍රය- ම.නි.)

- චතුරාර්ය සත්‍යය, තිපරිවට්ට ද්වාදසාකාරයෙන් ප්‍රතිවේධ කිරීම මගින් විමුක්තිය සාධනය කළ හැකි බව. (ධම්මචක්කප්පවත්වන සූත්‍රය- ස.නි.)
- සත්තිස් බෝධිපාක්ෂික ධර්ම (සතර සතිපට්ඨාන, සතර ඍද්ධිපාද, සතර සම්‍යක්ප්‍රධාන, පඤ්ච ඉන්ද්‍රිය, පංච බල, සත්ත බොජ්ඣංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය) වැඩීමෙන් විමුක්තිය ලබා ගත හැකි බව.
- සාංසාරික ජීවිතයේ යථා ස්වභාවය දුක් සහිත බැවින් ඊට පිළිතුරු සෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ විමුක්ති මාර්ගය අනාවරණය වන බව (අරියපරියේසන සූත්‍රය- ම.නි.)
- විදර්ශනා ප්‍රඥාව වැඩීමෙන් විමුක්තිය සාධනය කර ගත හැකි බව.

(සාමඤ්ඤඵල සූත්‍රය- දී.නි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. උභයාර්ථ සාධනය පිණිස අදාළ කරගත හැකි දේශනා පාඨ ඇතුළත් අත්පත්‍රිකාවක් සකස් කරන්න.
2. සියලු සිසුන් සහභාගි කරවාගෙන සමාජ සුබසාධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න. (ශ්‍රමදාන, රෝගී උපස්ථාන, රෝහල් උපකාරක සේවා)
3. ''නූතන ජීවන ගැටලු විසඳා ගැනීමෙහි ලා බුදුදහමේ උපයෝගිතාව'' යන මැයෙන් ශිෂ්‍ය සමිතියේ කථාවක් පවත්වන්න.
4. '' බෞද්ධ ජීවන දර්ශනය '' යන තේමාව පාදක කර ගනිමින් පොත් පිංචක් නිර්මාණය කරන්න.
5. වෙනත් ආගම්වල විමුක්ති මාර්ග සහ බෞද්ධ විමුක්ති මාර්ගය අතර පවත්නා සම විෂමතා ඇතුළත් වගුවක් පිළියෙළ කරන්න.
6. සාංසාරික දුක පිළිබඳ ඥානය ගවේෂණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ විමුක්ති මාර්ගය අනාවරණය කරගත් අයුරු පිළිබඳ ව මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රය ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පරිශීලනයට :**

- තෙවිජ්ජ සූත්‍රය — දීඝ නිකාය
- බ්‍රහ්මජාල සූත්‍රය — දීඝ නිකාය
- අග්ගඤ්ඤ සූත්‍රය — දීඝ නිකාය
- සිගාල සූත්‍රය — දීඝ නිකාය
- සාමඤ්ඤඵල සූත්‍රය — දීඝ නිකාය
- අරියපරියේසන සූත්‍රය — මජ්ඣිම නිකාය
- චංකී සූත්‍රය — මජ්ඣිම නිකාය
- උපාලි සූත්‍රය — මජ්ඣිම නිකාය
- සච්චවිභංග සූත්‍රය — මජ්ඣිම නිකාය
- මහාචත්තාරීසක සූත්‍රය — මජ්ඣිම නිකාය
- වීමංසක සූත්‍රය — මජ්ඣිම නිකාය
- මහාවේදල්ල සූත්‍රය — මජ්ඣිම නිකාය
- බෝධිරාජකුමාර සූත්‍රය — මජ්ඣිම නිකාය
- චූල්ලහත්ථිපදෝපම සූත්‍රය — මජ්ඣිම නිකාය
- චූළසච්චක සූත්‍රය — මජ්ඣිම නිකාය
- අලගද්දූපම සූත්‍රය — මජ්ඣිම නිකාය
- කීටාගිරි සූත්‍රය — මජ්ඣිම නිකාය
- කෝසම්බිය සූත්‍රය — මජ්ඣිම නිකාය

| | |
|---|---|
| • නගර සූත්‍රය | සංයුක්ත නිකාය |
| • අචෙල සූත්‍රය | සංයුක්ත නිකාය |
| • වේළුද්වාර සූත්‍රය | සංයුක්ත නිකාය |
| • සම්බහුල සූත්‍රය | සංයුක්ත නිකාය |
| • වාසිජටොපම සූත්‍රය | සංයුක්ත නිකාය |
| • දුතිය ගද්දුලබද්ධ සූත්‍රය | සංයුක්ත නිකාය |
| • අනත්තලක්ඛණ සූත්‍රය | සංයුක්ත නිකාය |
| • ධම්මචක්කප්පවත්තන සූත්‍රය | සංයුක්ත නිකාය |
| • පරිවීමංසන සූත්‍රය | සංයුක්ත නිකාය |
| • අරහන්ත සූත්‍රය | සංයුක්ත නිකාය |
| • සන්තුට්ඨි සූත්‍රය | සංයුක්ත නිකාය |
| • දුතිය පුඤ්ඤාභිසන්ද සූත්‍රය | අංගුත්තර නිකාය |
| • කාලාම සූත්‍රය | අංගුත්තර නිකාය |
| • දුතිය සන්දිට්ඨික සූත්‍රය | අංගුත්තර නිකාය |
| • ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • අන්ධූපම සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • නීවරණ සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • ඡවාලාත සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • බල සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • මහානාම සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • පංචභයවෙර සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • පත්තකම්ම සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • මංගල සූත්‍රය, | අංගුත්තර නිකාය |
| • මෙත්ත සූත්‍රය, ඛුද්දක පාඨ, | අංගුත්තර නිකාය |
| • පරාභව සූත්‍රය, සුත්ත නිපාතය, | අංගුත්තර නිකාය |
| • වසල සූත්‍රය, සුත්ත නිපාත, | අංගුත්තර නිකාය |
| • ඛන්ධක විනය | හේන්පිටගෙදර ඥාණසීහ හිමි |
| • ප්‍රාතිමෝක්ෂ විවරණය | බූජ්ජම්පොල ධම්මපරායනතිස්ස හිමි |
| • පාලි සාහිත්‍යය | පොල්වත්තේ බුද්ධදත්ත මාහිමි (2007)<br>රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ |
| • ත්‍රිපිටක සූචිය | රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ |
| • සූත්‍ර ධර්ම නාමාවලිය | නිවන්දම ශ්‍රී ධර්ම කීර්ති හිමි (2008)<br>බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,<br>නැදිමාල, දෙහිවල. |
| • සූවිසි මහ ගුණය | රේරුකානේ චන්දවිමල හිමි (2014)<br>12 වන මුද්‍රණය<br>ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ<br>මණ්ඩලය, පොකුණුවිට |

**නිපුණතාව 3.0 :** සංඝ සමාජයේ පරමාර්ථ සහ ප්‍රතිපත්ති විමර්ශනය කර, එහි චිරස්ථිතියට යහ ආකල්පවලින් යුක්ත ව දායක වෙයි.

**නිපුණතා මට්ටම 3.1 :** සංඝ සමාජයේ ප්‍රභවය, විකාශය හා පරමාර්ථ අධ්‍යයනය කර සාමූහික ව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 42 යි.

**ඉගෙනුම් පල :**

- සංඝ සමාජයේ ප්‍රභවය, විකාශය හා පරමාර්ථ අධ්‍යයනය කරයි.
- පැවිද්ද හා උපසම්පදාව ක්‍රමික ව විකාශය වූ බව පෙන්වා දෙයි.
- සංඝ සමාජය ආදර්ශනය කරයි.
- පොදු සම්පත් ආරක්ෂා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සංඝ සමාජයේ පරමාර්ථ අධ්‍යයනය කර පොදු සම්පත් ආරක්ෂා කරමින් සාමූහික ව ජීවත් වීමට සිසුන්ට මඟපෙන්වාදීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ සමාජය**

- ''ශ්‍රම්'' ධාතුවෙන් උපන් ශ්‍රමණ ශබ්දයෙන් උත්සාහ දරන්නා, පරිශ්‍රමයෙහි යෙදෙන තැනැත්තා යන අරුත් යෙදෙන බව. (P.T.S පාලි ශබ්දකෝෂය)
- කර්ම මාර්ගය බැහැර කරමින් ඥාන මාර්ගය අනුගමනය කළ පිරිස ශ්‍රමණයන් වූ බව.
- ජටිල, නිගණ්ඨ, අචේලක, ඒකසාටක, පරිබ්‍රාජක ආදි වශයෙන් ශ්‍රමණ කණ්ඩායම් පහක් පිළිබඳ ව පෙළ සාහිත්‍යයේ දක්වා ඇති බව. (සත්ත ජටිල සූත්‍රය - කෝසල සංයුක්තය)
- ෂට් ශාස්තෘවරුන් සමකාලීන ප්‍රකට ශ්‍රමණයන් වූ බව.
- ශ්‍රමණයන් පොදුවේ දෙවියන් පිළිබඳ විශ්වාසය ප්‍රතික්ෂේප කළ බව. (සාමඤ්ඤඵල සූත්‍රය- දී.නි.)
- භක්තිය හා විශ්වාසය වෙනුවට තර්කණය, විමර්ශනය, විචාරය, යෝග භාවනා වැඩීම මඟින් සත්‍ය සෙවීම හා සත්‍ය අවබෝධ කර ගැනීමට ප්‍රයත්න දැරීම ශ්‍රමණයන්ගේ ප්‍රකට ලක්ෂණයක් වූ බව.
- වර්ණ ධර්ම, ස්වධර්ම, ආපද් ධර්ම ආදි නිර්මාණවාදී බ්‍රාහ්මණ ඉගැන්වීම් ශ්‍රමණයන් විසින් ප්‍රතික්ෂේප කරන ලද බව.
- ස්ත්‍රීන්ට ද ශ්‍රමණ ජීවිත ගත කිරීමට අවස්ථාව ලබාදුන් බව.
- බොහෝ ශ්‍රමණයන් ආත්මවාදය පිළිගත් ශාස්වතවාදීන් වූ අතර උච්ඡේදවාදය පිළිගත් ශ්‍රමණයන් ද සිටි බව. (බ්‍රහ්මජාල සූත්‍රය- දී.නි. )
- ශ්‍රමණයන් පොදුවේ විවිධ ව්‍රත හා තපශ්චර්යා අනුගමනය කරමින් කෙලෙස් තැවීම් කළ බව.
- බොහෝ ශ්‍රමණයන් අත්තකිලමථානුයෝගය වැඩූ බව.

- ශ්‍රමණ සම්ප්‍රදායයට අයත් ගුරු කුලයක් වූ ආජීවකයන් නිරුවත් සාධුවරුන් වූ අතර ව්‍රත සමාදානයෙහි යෙදුණු බව. (මජ්ඣිමනිකායට්ඨකථා)
- මක්ඛලීගෝසාල ඇතුළු ඔහුගේ ශ්‍රාවකයන් ආජීවකයන් ලෙස හඳුන්වා ඇති බව.
- උපක, ජම්බුක වැනි ආජීවකයන් පිළිබඳ ව බෞද්ධ මූලාශ්‍රයවල තොරතුරු දැක්වෙන බව.
- ආජීවකයන් ප්‍රධාන වශයෙන් අකිරියවාදී ඉගැන්වීම් ඉදිරිපත් කළ බව.
(මජ්ඣිමනිකායට්ඨකථා)
- විවිධාකාර වූ දාර්ශනික ප්‍රස්තුත ගවේෂණය කළ පිරිස පරිබ්‍රාජකයන් වශයෙන් හැඳින්විය හැකි බව.
- ගිහිගෙය හැර දමා තැන තැන ඇවිදිමින් සංචාරක පැවිදි දිවියක් ගත කළ පිරිසක් ලෙස ද පරිබ්‍රාජකයන් හැඳින්විය හැකි බව. (P.T.S පාලි ශබ්දකෝෂය)
- ඇතැම් පරිබ්‍රාජකයන් කයට දුක් දෙන ව්‍රත සමාදන් වූ අතර ඇතැම් පරිබ්‍රාජකයන් පසිඳුරන් පිනවීම මඟින් විමුක්තිය අපේක්ෂා කළ බව. (මාගන්දිය සූත්‍රය, සුත්ත නිපාත)
- වච්ඡගොත්ත, පොට්ඨපාද, මහා සකුලුදායි, නිග්‍රෝධ, පෝතලීපුත්‍ර, අග්ගිවච්ඡගොත්ත, දීඝනඛ, චූළ සකුළුදායි ආදි පරිබ්‍රාජකයන් පිළිබඳ ව බෞද්ධ මූලාශ්‍රයවල තොරතුරු දැක්වෙන බව.
- විවිධ ව්‍රත අනුගමනය කළ නිරුවත් සාධුවරුන් ලෙස අචේලකයන් හැඳින්විය හැකි බව.
- අචේලක යන්නෙන් පොදුවේ ආජීවක, පරිබ්‍රාජක, නිගණ්ඨ ඇතුළු ඇඳුම් ඇඳීමෙන් වැළකී සිටි සියලු ශ්‍රමණයන් හැඳින්විය හැකි බව. (දීඝ නිකාය අටුවාව)
- ජටාවක් දැරූ ශ්‍රමණ තාපස පිරිස් ජටිල නමින් හැඳින්වූ බව. (බුද්ධවංස අට්ඨකථා)
- ඇතැම් ජටිලයන් විවිධාකාරයෙන් ගංගා ජලයෙහි හැසිරෙමින්, කිමිදෙමින්, එමඟින් විමුක්තිය ලද හැකි යැයි විශ්වාස කළ බව.
- උරුවේල කාශ්‍යප, ගයා කාශ්‍යප හා නදී කාශ්‍යප යන තුන් බෑ ජටිලයන්ගේ තොරතුරුවලින් ජටිල දහමේ ව්‍යාප්තිය ප්‍රමාණ කරගත හැකි බව.
- නිගණ්ඨ නම් ශ්‍රමණ කණ්ඩායම කිරියවාදීන් වූ අතර ඔවුන් ජෛන සම්ප්‍රදායය ට අයත් වූ බව.
- නිගණ්ඨනාතපුත්ත හෙවත් ජෛන මහාවීර නිගණ්ඨ සම්ප්‍රදායයේ බුද්ධකාලීන නායකයා වූ බව.
- නිගණ්ඨයන් ද නිරුවත් ශ්‍රමණයන් වූ බව.
- ඔවුන් කිරියවාදීන්, අත්තකිලමථානුයෝගීන් සහ ආත්මවාදීන් වූ බව.
- ශ්වේතාම්බර, දිගම්බර වශයෙන් ඔවුන් පසුකාලීන ව නිකාය දෙකකට බෙදුණු බව.

**භික්ඛු සංඝ සමාජයේ ප්‍රභවය**

- සමකාලීන ශ්‍රමණ සම්ප්‍රදායයේ ආභාසය බෞද්ධ පැවිද්දට ලැබුණු බව.
- පස්වග භික්ෂූන්ගෙන් බෞද්ධ පැවිද්ද ආරම්භ වූ බව හා අනුක්‍රමයෙන් එය විකාශයට පත් වූ බව.
- ''එහි භික්ඛු පබ්බජ්ජාව'' පස්වග භික්ෂූන්ගෙන් ඇරඹුණු බව. (මහාවග්ගපාළි)
- බුදු රජාණන් වහන්සේ පමණක් ඒහි භික්ඛු පැවිද්ද සිදු කළ බව.
- ප්‍රථම රහත් හැට නම හා භද්දවග්ගිය කුමාරවරුන් ශාසනගත වීමෙන් භික්ෂු සංඝ සමාජය කෙටි කලක දී බෙහෙවින් සංවර්ධනය වූ බව.
- බුදු රජාණන් වහන්සේ ප්‍රථම රහත් හැට නම අමතා බොහෝ ජනයාට හිත සැප පිණිස ලෝකානුකම්පාව පිණිස දෙව්මිනිසුන්ට හිත පිණිස සැප පිණිස පරාර්ථ චර්යාවේ යෙදීමට අනුශාසනා කළ බව. (මහාඛන්ධකය මහාවග්ගපාළි)
- ප්‍රථම සම්බෝධි සමයට අයත්, ඒහි භික්ෂුභාවයෙන් පැවිදි වූ අය එක්දහස් තුන්සිය හතළිස් එකක් බව. (සමන්තපාසාදිකාව)
- සරණාගමන පැවිද්ද පසු ව ඇති වූ බව. (මහාවග්ගපාළි)
- සරණාගමන පැවිද්ද හා උපසම්පදාව ප්‍රදේශීය වශයෙන් භික්ෂූන් විසින් ද සිදු කළ හැකි යැයි බුදු රජාණන් වහන්සේ අනුදැන වදාළ බව.
- මුල් යුගයේ බෞද්ධ භික්ෂූන් සංචාරක ජීවිතයක් ගත කළ බව.
- බෞද්ධ පැවිද්දෙහි පිරිපුන්, පිරිසිදු, බඹසර ඉගැන්වෙන බව.

**භික්ෂුණී සංඝ සමාජයේ ප්‍රභවය**

- බෞද්ධ භික්ෂු සමාජය ආරම්භ වී වසර පහකට පමණ පසු භික්ෂුණී සංඝ සමාජය ආරම්භ වූ බව.
- භික්ෂුණී සංඝ සමාජයේ ප්‍රථමයෙන් පැවිද්ද හා උපසම්පදාව ලැබූ කාන්තාව මහා ප්‍රජාපතී ගෝතමිය බව.
- විශේෂ හේතු මත භික්ෂුණීන්ගේ පැවිද්ද පිළිබඳ ව බුදු රජාණන් වහන්සේ එතරම් උනන්දු නොවූ බව.
- ආනන්ද තෙරුන්ගේ බලවත් මැදිහත් වීම මත භික්ෂුණී සංඝ සමාජය ප්‍රභවය වූ බව.
- එහි ලා අෂ්ටගරු ධර්ම පදනම් වූ බව.
- ආරම්භයේ දී කුල කාන්තාවන් පන්සියයක් මහා ප්‍රජාපතී ගෝතමිය සමඟ පැවිද්ද හා උපසම්පදාව ලැබූ බව.
- සසුන් බඹසර චිරස්ථිතික වීම සඳහා කාන්තාවන්ට පැවිද්ද ලබාදීමේ දී අෂ්ටගරු ධර්ම පැනවූ බව.
- මහාප්‍රජාපතී ගෝතමිය භික්ෂූන්ට මෙන් ම භික්ෂුණීන්ට ද වැඩිමහලු පිළිවෙළින් වැඳීම, දැක හුනස්නෙන් නැගිටීම, ඇඳිලි බැඳීම, සාමීචිකර්ම යන මේ දෑ පනවන්නේ නම් යහපතැයි බුදු රජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටිය ද උන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළ අතර භික්ෂු නමක් භික්ෂුණියට වැඳීම ආදිය කළ හොත් දුකුළා ඇවතක් සිදු වන්නේ යැයි දේශනා කළ බව.
- බුදු රජාණන් වහන්සේ භික්ෂූන්ට මෙන් ම භික්ෂුණීන්ට ද සමාන පිළිගැනීමක් ලබාදුන් ආකාරය තනතුරු ප්‍රදානයෙන් ප්‍රකට වන බව.

පැවිද්ද හා උපසම්පදාව

- භවභෝග සම්පත්, ඥාති පිරිස් ආදී ගිහි ජීවිතයට අදාළ සියල්ල හැරදමා ගිහිගෙයින් ඉවත් වීමෙන් පැවිද්ද ඇරඹෙන බව. (සුඛවග්ගය, පළමු සූත්‍රය අ.නි.)
- භික්ෂුව යනු ' සිඳුණු බිඳුණු වස්ත්‍ර දරන්නා ය' එනම් සිවුරු දරන්නා ය, භික්ෂුව යනු 'ගමෙහි පිඬු පිණිස හැසිරෙන්නා ය', භික්ෂුව යනු ' සසර බිය දකින්නා ය', ආදි වශයෙන් භික්ෂුව පිළිබඳ නිර්වචන පෙළෙහි දක්නට ඇති බව
- 'භික්ඛු' යන වචනය භික්ෂාටන අර්ථයෙන් ප්‍රභවය වී ඇති අතර බුදුදහම එම වචනය භාවිත කරන්නේ සාම්ප්‍රදායික සන්දර්භයෙහි සිටිමින් නොව, ආධ්‍යාත්මික අර්ථයෙන් බව. (''න තෙන භික්ඛකො හොති යාවතා භික්ඛතෙ පරෙ ....'') (භික්ඛක සූත්‍රය- ස.නි.)
- ශාස්තෘ ප්‍රසාදයට පත් වන පුද්ගලයා ගිහි ජීවිතය කෙරෙහි කලකිරී සියලු සැපසම්පත් හැර දමා කෙස් රැවුළු කපා පැවිදි බිමට පත් වන බව. (සාමඤ්ඤඵල සූත්‍රය- දී.නි.)
- ගිහිගෙය බාධක සහිත, කෙලෙස්වලට ආයතනයක් බව දැක එයින් මිදීම උදෙසා පැවිදි වන බව. (පබ්බජ්ජා සූත්‍රය - සුත්ත නිපාතය)
- සියලු දුක් දුරු කර නිර්වාණය සාක්ෂාත් කිරීම බෞද්ධ භික්ෂුවගේ වගකීම හා පරමාර්ථය බව.
- බෞද්ධ භික්ෂුව සිවුපසයෙන් තෘප්තිමත් වෙමින් සැහැල්ලු, චාම්, සරල, අල්පේච්ඡ, නිදහස්, සුභරතාවෙන් යුතු ජීවන ප්‍රතිපදාවක් අනුගමනය කරන අතර, පියාපත් බරින් පමණක් යුක්ත වන පක්ෂියකු හා සමාන වන බව. (මහාතණ්හාසංඛය සූත්‍රය - ම.නි.)
- සාමණේර දස සීලය, උපසම්පදා සීලය, සතර සංවර සීලය ආදි සීලයන්ගෙන් ශික්ෂණය වන බෞද්ධ භික්ෂුව පරාර්ථය පිණිස කැප කළ ජීවිතයකින් යුක්ත බව.
- දසධම්ම සූත්‍රයේ දැක්වෙන පරිදි භික්ෂුවක් මනා සිහි බුද්ධියෙන් ක්‍රියා කරන පරමාදර්ශී චරිතයක් ප්‍රකට කරන බව.
- බෞද්ධ පැවිද්ද සාමණේර හා උපසම්පදාව යනුවෙන් දෙයාකාර වන බව.
- මුල් කාලයේ දී පැවිද්දත්, උපසම්පදාවත් එකවර ලබා දුන් අතර පසු ව අවස්ථා දෙකක දී ලබා දුන් බව.
- භික්ෂු සමාජයේ පූර්ණ සාමාජිකත්වය උපසම්පදාවෙන් ලැබෙන බව.
- උප හා සං පූර්ව පද් ධාතු මූලයෙන් නිපන් (උප + සං + පද්) උපසම්පදාව යන වචනයේ දළ අදහස 'නිසි තැනට මනා ව පත් වීම' යන්න බව.
- සාමණේර බවින් ඔසවා තැබීම, ' මහලු පැවිද්ද ' 'අධිශීලයට පත් වීම' උපසම්පදාව නමින් හැඳින්වෙන බව.
- භික්ෂු සංඝ සමාජයේ ආරම්භයේ දී බුදු රජාණන්වහන්සේ විසින් ම ඒහි භික්ඛු ක්‍රමයට නවකයන් පැවිදි උපසම්පදා කරන ලද බව.
- සාමණේර සරණාගමන පැවිද්ද පසු ව ඇති වූ අතර එම පැවිද්දට දස සිඛ, දස පරිජි, දස නාසනා ආදිය එක් වූ බව.
- මුල් යුගයේ දී පැවිද්ද සඳහා දෙමාපිය අවසරය, වයස් සීමා, නියමිත ආචාර්ය උපාධ්‍යායවරුන් අවශ්‍ය නොවූ අතර පසු ව උපන් ගැටලු නිසා ඒ සියල්ල අනුදන්නා ලද බව.

- ආරම්භයේ දී ඕනෑ ම අයකුට පැවිද්ද හා උපසම්පදාව ලැබුණු අතර කලින් කල උපන් ගැටලු හේතුවෙන් පැවිද්ද හා උපසම්පදාව සඳහා සීමා පනවන ලද බව.
- උපසම්පදා භික්ෂුවකට අදාළ වගකීම් චුල්ලවග්ගපාළිය, මහාවග්ගපාළිය ආදි විනය මූලාශ්‍රයවල දැක්වෙන අතර නො කළ යුතු දේ පාරාජික හා පාචිත්තිය පාලියේ දක්නට ලැබෙන බව.
- උපසම්පන්න භික්ෂූන්ට අදාළ විනය ශික්ෂා 227ක් භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ දැක්වෙන අතර, භික්ෂුණීන්ට අදාළ විනය ශික්ෂා 311ක් භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයේ දැක්වෙන බව.

**උපසම්පදා ක්‍රම**

- උපසම්පදා ක්‍රම අටක් විනය පිටකයේ දක්නට ඇති බව.

1. **''ඒහි භික්ඛු'' පැවිදි උපසම්පදාව**

- බුදු රජාණන් වහන්සේට පමණක් කළ හැකි පැවිදි කිරීමේ ක්‍රමය බව.
- පැවිදි වීමට අපේක්ෂිත පුද්ගලයා දෙසට බුදු රජාණන් වහන්සේගේ දක්ෂිණ හස්තය දික් කර, ''මහණ; එව ධර්මය මනා ව දෙසන ලදදේ ය. මනා කොට දුක් කෙළවර කිරීම පිණිස මාර්ග බ්‍රහ්මචර්යාවේ හැසිරෙව'' යි ආමන්ත්‍රණය කළ විට එය ම පැවිද්ද හා උපසම්පදාව වන බව. (මහාඛන්ධකය - මහාවග්ගපාළි)
- මුල් කාලයේ පැවිදි වූ පස්වග භික්ෂූන් ආදි සියලු දෙනා මෙම ක්‍රමය යටතේ පැවිදි උපසම්පදාව ලද බව

2. **සරණාගමන උපසම්පදාව**

- මතු වූ ප්‍රායෝගික ගැටලු නිසා භික්ෂූන්ට ඒ ඒ දිසාවල දී ඒ ඒ ජනපදවල දී තිසරණයෙහි පිහිටුවීමෙන් පැවිදි උපසම්පදා කිරීමට බුදු රජාණන් වහන්සේ විසින් අවසර ලබා දෙන ලද බව. (මහාඛන්ධකය - මහාවග්ගපාළි)
- පළමු කොට හිසකේ රැවුළු බා, කසාවත් අන්දවා, උත්තරාසංගය එකස් කරවා, භික්ෂූන්ගේ පා වන්දවා, උක්කුටියෙන් හිඳුවා, ඇඳිලි බඳවා, තිසරණය තෙවරක් කියවීමෙන් පැවිදි උපසම්පදාව ලබාදෙන බව. (මහාඛන්ධකය - මහාවග්ගපාළි)

3. **''ඔවාදපටිග්ගහණ '' උපසම්පදාව**

- බුදු රජාණන් වහන්සේගේ අවවාද පිළිගැනීමෙන් සිදු කරන උපසම්පදාව ඕවාදපටිග්ගහණ උපසම්පදාව බව.
- ''භික්ෂූන් කෙරෙහි හිරි ඔතප් දෙකින් යුතු ව හික්මිය යුතු ය. ධර්මය අසන විට අර්ථ වශයෙන් දැන ගැනීමට යොමු කළ කන් ඇති ව හික්මිය යුතු ය. කායගතා සතියෙන් යුතු ව වාසය කරමින් හික්මිය යුතු ය'' යන අවවාද දුන් විට ඒවා පිළිගැනීමෙන් සිදු කරනු ලබන පැවිදි උපසම්පදාව මේ නමින් වූ බව.
- මහා කාශ්‍යප හිමියන් පැවිදි උපසම්පදා ලැබීමේ දී මෙම ක්‍රමය අනුගමනය කළ බව.

**4. දූතේන උපසම්පදාව**

- දූතයකු මාර්ගයෙන් උපසම්පදාව ලබාදීම දූතේන උපසම්පදාව බව.
- අඩ්ඪකාසි පැවිදි වීමට අපේක්ෂා කළ අවස්ථාවේ දූත භික්ෂුවක් ලවා බුදු රජාණන් වහන්සේ විසින් උපසම්පදාව අනුමත කොට යවන ලද බව.

**5. අට්ඨගරුධර්ම පටිග්ගහන උපසම්පදාව**

- අෂ්ටගරුධර්ම පිළිගැනීමට සලස්වා සිදු කෙරෙන උපසම්පදාව මෙය බව.
- ගරුධර්ම අටක් පිළිගත් මහාප්‍රජාපතී ගෝතමියට ලබාදුන් උපම්පදාව අට්ඨගරුධර්ම උපසම්පදාව බව.

**6. පඤ්හව්‍යාකරණ උපසම්පදාව**

- අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් ලබාදෙන උපසම්පදාව මෙය බව.
- 'ඒකනාම කිං ....' ආදි ප්‍රශ්න විසඳූ සෝපාක හිමියන්ට එය ම උපසම්පදාව ලෙස පිළිගත් බව.

**7. අට්ඨවාචික උපසම්පදාව**

- භික්බු -භික්බුණී උභතො සංඝයා ඉදිරියේ සිදු කරනු ලබන උපසම්පදාව මෙය බව.
- භික්ෂුණියක උපසම්පදා කිරීමේ දී භික්ෂුණී සංඝයා මධ්‍යයෙහි ඤත්ති චතුත්ථ කර්මයත් භික්ඛු සංඝයා ඉදිරියේ ඤත්ති චතුත්ථ කර්මයත් යන ක්‍රම අට ප්‍රකාශ වන නිසා ''අට්ඨවාචික'' යැයි කියන ලද බව.

**8. ඤත්තිචතුත්ථකර්ම උපසම්පදාව**

- ඤත්තිය තබා කර්ම වාක්‍යය (අනුශ්‍රාවණය) තෙවරක් කීමෙන් සිදු කරන ලද උපසම්පදාව බව.
- සංඝයා රැස් වී අන්තරාය ධර්ම ලෙස බුදු රජාණන් වහන්සේ දක්වූ කරුණු දහතුනකින් පාරිශුද්ධත්වය විමසා සිදු කරන ලද බව.
- උපාධ්‍යායවරයකු ඇති ව ම උපසම්පදාව සිදු කරන බව.
- බුදු රජාණන් වහන්සේ මීට පෙර අනුදන වදාළ සරණාගමන උපසම්පදා ක්‍රමය ප්‍රතික්ෂේප කරමින් ඤත්ති චතුත්ථකම්ම උපසම්පදාව සිදු කරන ලෙස අනුමත කළ බව.
- රාධ බමුණාගේ උපසම්පදාව අරබයා මෙය අනුදත් බව.
- වර්තමානයේ පැවැත්වෙන උපසම්පදා ක්‍රමය මෙය බව.

සතර පාරාජිකා සහ නිස්සය ධර්ම

- උපසපත් භික්ෂූන් වහන්සේ විසින් ආරක්ෂා කළ යුතු ශීලය පාතිමෝක්ඛය ශීලය බව.
- උදෙසනු ලබන ප්‍රාතිමෝක්ෂය ''ඕවාද පාතිමෝක්ඛය'' ලෙසත් පනවන ලද ශික්ෂාවන්ගෙන් සමන්විත වූයේ ''ආණාපාතිමෝක්ඛය'' ලෙස හඳුන්වා ඇති බව.
- භික්ෂු ප්‍රාතිමෝක්ෂය ලෙස පිළිගන්නා විනය ශික්ෂා සංග්‍රහය ක්‍රමයෙන් සංවර්ධනය වී ඇති අතර එහි ශික්ෂා පද ගණනින් 220ක් බව. (අධිකරණ සමථ හැර)
- ප්‍රාතිමෝක්ෂයේ දැක්වෙන විනය ශික්ෂා ආපත්තිවල ස්වභාවය අනුව පාරාජිකා 4, සංඝාදිසේස 13, අනියත 2, නිස්සග්ගිය පාචිත්තිය 30, පාචිත්තිය 92, පාටිදේසනීය 4, සේඛියා 75 ලෙසින් වර්ග කර දක්වා ඇති බව.
- මෛථුන ධර්මයෙහි යෙදීම, අදත්තාදානය, මිනිස් ජීවිතයක් නැති කිරීම, නැති ආර්ය ගුණ වංක සිතින් ඇති බව පළ කිරීම යන කරුණු සතර පාරාජිකා වන බව.
- පාරාජිකාපත්තියකට පත් වුවහොත් ආයති සංවරයට ඉඩක් නැති බව.
- පාරාජිකා ඡෙජ්ජගාමිණී ඇවැත් වන අතර, ගරුකාපත්ති ගණයට ගැනෙන බව.
- පාරාජිකාපත්තියට පත් භික්ෂුව උපෝසථ පවාරණාදි සංඝ කර්මයන්ට සහභාගිවීමට, සඟසතු සෙනසුන්වල විසීමට, සංඝ ලාභය පිළිගැනීමට නුසුදුසු වන බව.
- උපසම්පදාවෙන් අනතුරු ව එම අවස්ථාවේ දී ම පාරාජිකා හතර සහ නිස්සය ධර්ම කියාදීමට විනයෙහි නියම කර ඇති බව.

නිස්සය ධර්ම

- උපසපත් භික්ෂුවට නිස්සයධර්ම හතරක් කියාදිය යුතු යැයි අනුදැන වදාළ බව.
- නිස්සය යන්නෙහි වචනාර්ථය ''මැනවින් ආශ්‍රය කිරීම'' යන්න බව.
- මේ පැවිද්ද සිඟා ලත් බත් පිඩු නිසා ය. ( පිණ්ඩියාලොප භොජනං නිස්සාය පබ්බජ්ජා) පැවිද්දා විසින් පිණ්ඩපාත භෝජනයෙන් දිවි පැවැත්මෙහි දිවි හිමියෙන් උත්සාහ කළ යුතු බව (මහාවග්ගපාළිය).
- ආරාධනා කොට දෙනු ලබන සඟසතු දානාදිය ද බාර ගැනීමට ඉඩ ලබා දී ඇති බව.
- පැවිද්ද පංසුකූල චීවර නිසා ය (පංසුකූල චීවරං නිස්සාය පබ්බජ්ජා). පැවිද්දා විසින් පංසුකූල චීවරයෙන් දිවි පැවැත්මෙහි දිවි හිමියෙන් උත්සාහ කළ යුතු බව (මහාවග්ගපාළිය)
- අතිරේක චීවර පිළිගැනීමට ද නිදහස ඇති බව.
- පැවිද්ද රුක්මුල් සෙනසුන නිසා ය (රුක්ඛමූල සේනාසනං නිස්සාය පබ්බජ්ජා). පැවිද්දා විසින් වෘක්ෂමූල සේනාසනය ඇසුරු කිරීමට දිවි හිමියෙන් උත්සාහ කළ යුතු බව (මහාවග්ගපාළිය).
- අතිරේක ලාභ ලෙස වෙනත් සෙනසුන් ද පිළිගැනීමට නිදහස ඇති බව.
- පැවිද්ද පූතිමුත්ත භේසජ්ජය නිසා ය (පූතිමුත්තභේසජ්ජං නිස්සාය පබ්බජ්ජා). පැවිද්දා විසින් පූතිමුත්ත භේසජ්ජයෙන් දිවි පැවැත්මට දිවි හිමියෙන් උත්සාහ කළ යුතු බව. (මහාවග්ගපාළිය)
- තල තෙල්, මී පැණි, උක් සකුරු යන මේවා අතිරේක ලාභ වශයෙන් පරිභෝග කළ හැකි බව
- සතර නිස්සය ධර්මවලින් තෘප්තියට පැමිණීම ශ්‍රමණ ගුණයක් ලෙස සන්තුට්ඨි සූත්‍රයේ දැක්වෙන බව.

**ශික්ෂාපද පැනවීමේ පරමාර්ථ :**

- ප්‍රථමාභිසම්බෝධි යුගයේ පැවිදි වූ බුද්ධ ශ්‍රාවකයන් නිර්වාණය ප්‍රමුඛ අරමුණ කොට ශාසන බ්‍රහ්මචර්යාවෙහි හැසිරුණු බව.
- භික්ෂු සංස්ථාවේ පාලනය සඳහා නීතිරීති පැනවීමට මුල් යුගයේ දී බුදු රජාණන් වහන්සේට අවශ්‍ය නොවූ බව.
- දීඝ නිකායේ සීලක්ඛන්ධ වග්ගයේ ද මජ්ඣිම නිකායේ බොහෝ සූත්‍රවල ද චූල සීල, මජ්ඣිම සීල, මහා සීල යනුවෙන් දැක්වෙන සීලය හුදෙක් ප්‍රඥප්තියක්, රීතියක්, නීතියක් නොවන අතර කායික සහ වාචසික ශික්ෂණයට උපයෝගී වන චර්යා ධර්ම පද්ධතියක් පමණක් වන බව.
- ප්‍රථමාභිසම්බෝධියට අයත් භික්ෂූන්ගේ පැවැත්ම පිළිබඳ බුදුන් වහන්සේ සතුට පළ කළ බව. (කකචූපම සූත්‍රය- ම.නි. )
- එම යුගයේ භික්ෂූන්ගෙන් නො ගැළපෙන ක්‍රියා සිදු වූ විට බුදු රජාණන් වහන්සේ නීති නො පැනවූ අතර ධර්මය යටතේ ම සංග්‍රහ වන අනුශාසනාවක් පමණක් සිදු කළ බව.
- ශික්ෂාපද පැනවීමට පෙර භික්ෂූන්ගේ ශික්ෂණය සඳහා ඕවාද ප්‍රාතිමෝක්ෂය ප්‍රමාණවත් වූ බව.
- ධර්මයෙහි අන්තර්ගත වූ සීලය යටතේ ශික්ෂණය වූ භික්ෂු ජීවිතයේ යහපත් තත්ත්වය ප්‍රථමාභිසම්බෝධියෙන් පසු ක්‍රමයෙන් වෙනස් වූ බව.
- භික්ෂු ජීවිතයේ අරමුණුවලට නො ගැළපෙන හැසිරීම් වැළැක්වීම සඳහා විනය නීති පැනවීමේ අවශ්‍යතාව අනුක්‍රමයෙන් ඇති වූ බව.
- ශාසන චිරස්ථිතිය පිණිස ශික්ෂාපද පැනවීමේ අවශ්‍යතාව පාරාජිකපාළියේ දැක්වෙන බව
- භික්ෂු සංස්ථාව තුළ ඇති වූ සංකීර්ණත්වය ශික්ෂාපද පැනවීමට හේතු වූ බව.
- සත්ත්වයාගේ පිරිහීම ද ඔවුන් වෙතින් සද්ධර්මය අතුරුදන් වීම ද ශික්ෂා පද පැනවීමට හේතු වේ යැයි සඳහන් වන බව. (භද්දාලි සූත්‍රය- ම.නි.)
- නිර්වාණ මාර්ගයට ප්‍රතිපක්ෂ ධර්මයෙහි හැසිරෙන පිරිස් නිර්වාණ මාර්ගයට නතු කිරීම සඳහා ශික්ෂාපද පනවන ලද බව.
- පඨමාභිසම්බෝධිය ගෙවී යද්දී භික්ෂු සමාජයේ ආසවට්ඨානීය ධර්ම පහළ වූ නිසා ශික්ෂාපද පනවන ලද බව.

  (1) රත්තඤ්ඤු මහත්තතා

  (2) වේපුල්ල මහත්තතා

  (3) ලාභග්ග මහත්තතා

  (4) බාහුසච්ච මහත්තතා

  යන කරුණු නිසා ආසවට්ඨානීය ධර්ම පහළ වන අතර ඒවා නැති කිරීමට ශික්ෂාපද පනවන ලද බව.

- භද්දාලි සූත්‍රයේ 'යසග්ග මහත්තතා ' යනුවෙන් ද ආසවට්ඨානීය ධර්ම පහළ වීමට සාධක වන තවත් කරුණක් සඳහන් වන බව.

- විනය ශික්ෂා පැනවීමේ අරමුණු දහයක් පාරාජික, පාළියේ දැක්වෙන බව.

  සංඝසුට්ඨුතාය (සංඝයාගේ යහපත හිතසුව පිණිස)

  සංඝඵාසුතාය (සංඝයාගේ පහසුව පිණිස)

  දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය (දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහ පිණිස)

  පේසලානං භික්ඛූනං ඵාසුවිහාරාය (ශික්ෂාකාමී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස)

  දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය

  (මෙලොව දී පැමිණිය හැකි ආශ්‍රවයන්ගේ සංවරය පිණිස)

  සම්පරායිකානං ආසවානං පටිඝාතාය

  (පරලොව පැවැත්මට මුල් වන ආශ්‍රවයන් නසාලීම පිණිස)

  අප්පසන්නානං පසාදාය (නො පැහැදුණු අයගේ පැහැදීම පිණිස)

  පසන්නානං භියොෘභාවාය (පැහැදුණවන්ගේ ප්‍රසාදය වැඩිදියුණු වනු පිණිස)

  සද්ධම්මට්ඨිතියා (සද්ධර්මයෙහි චිරපැවැත්ම පිණිස)

  විනයානුග්ගහාය (ශික්ෂණයට අනුග්‍රහය පිණිස)

**වස්විසීම හා පවාරණය :**

- අන්‍ය සාමයික ආභාසය හා බුද්ධ ශාසනය ආශ්‍රිත පසුකාලීන තත්ත්වයන් ද, සාමාජික අවශ්‍යතාවන් ද අනුව වස්සාවාසයේ ආරම්භය සිදු වූ බව.
- උග්‍ර තාපස චර්යා ප්‍රගුණ කළ ශ්‍රමණ කණ්ඩායම්, විශේෂයෙන් ජෛන පැවිද්දන් වර්ෂා කාලය තුළ සංචාරක ජීවිත අතහැර ආරාමික ව වාසය කොට ඇති අතර බෞද්ධ භික්ෂූන් ද එම පිළිවෙත අනුව ක්‍රියා කළ යුතු යැයි මහජනයා විසින් කරන ලද ඉල්ලීම බුදු රජාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද බව. (මහාවග්ගපාළිය)
- වස් විසීමට හා පවාරණයට අදාළ නීතිරීති හා සීමා නියමයන් මහාවග්ගපාළියෙහි සවිස්තර ව දැක්වෙන බව
- වස්සාන, හේමන්ත, ගිම්හාන යන ඍතු භික්ෂූන් වහන්සේලාට දුෂ්කර වකවනුවක් වූ අතර වස් විසීම අනුදැනීමෙන් උන් වහන්සේලාට පහසුවක් වූ බව.
- පෙර වස් හා පසු වස් යනුවෙන් වස් එළඹීම දෙයාකාර වන බව.
- වස් කාලය තුළ වස් නොවැස චාරිකාවේ යෙදෙන භික්ෂුවට දුකුළා ඇවැතක් වන බව.
- වස් එළඹෙන දිනයෙහි ආවාසයේ සිටින සැම උපසපන් භික්ෂූන් වහන්සේ නමක් ම වස් සමාදන් විය යුතු බව.
- වස් සමාදන් වූ භික්ෂුවට, අත්‍යවශ්‍ය කරුණක් මත සත්තාහකරණයෙන් වස් විසූ ස්ථානයෙන් පිට ව යාමට අවසර ඇති බව.
- වස් විසූ භික්ෂුවට වස් සමාදන් වූ ස්ථානයේ සොර සතුරු ආදි උවදුරු ඇති කල්හි වෙනත් ස්ථානයකට යාමට අවසර දී ඇති බව.
- සිවුපසය නො ලැබීම, බ්‍රහ්මචරියාවට අන්තරාය කරවීම, සංඝභේදයකට කරුණු යෙදීම ආදිය නිසා වස් විසූ ස්ථානය අතහැර වෙනත් සුදුසු ස්ථානයකට යාමට ද අනුමතිය ලබා දී ඇති බව.
- ගාල, ගැල, නැව, ගස් සිදුර, රුක් බෙන ආදියෙහි වස් විසීම සඳහා අනුමත කර ඇති අතර, එළිමහන සොහොන් කිළිය, ඡත්‍රය, සැළිය යන ස්ථානයන්හි වස් විසීම අනුමත කර නොමැති බව.
- සෙනසුනක් නොමැති නම් වස් නො එළඹ සිටිය හැකි බව.

- කිසියම් වෙහෙරක වස් විසීමට ආරාධනා ලැබ වෙනත් වෙහෙරක වස් විසීමෙන් දුකුළා ඇවතක් වන බව.
- ඇසළ අව පැලවිය දින වස් සමාදන් වන භික්ෂුව වප් පුර පසළොස්වක පෝදා පවාරණය කළ යුතු බව.
- වස් කාලය තුළ එක ම ස්ථානයක වැඩ සිටින භික්ෂූන් වහන්සේ දායක කාරකාදීන්ගේ ආගමික කාර්යයන්ට සහාය වන අතර, තමාගේ ශාසනික ජීවිතය වර්ධනය කර ගන්නට ද අවශ්‍ය පසුබිම සකසා ගන්නා බව.
- පවාරණය යනු තුන් මසක් එකට ජීවත් වූ පිරිස වෙන් ව යාමේ දී එකිනෙකා අතින් වූ යම් වැරදි වේ නම් ඒවා දන පිළියම් කර සතුටින් හා සමගියෙන් වෙන් වීමට ඇති කළ ප්‍රතිපත්තියක් බව.
- වස් විසීමට හා පවාරණයට අදාළ කාර්ය සංසිද්ධිය පිළිබඳ සංවර්ධනය මෑත අවධිය දක්වා ම සිදු වී තිබෙන බව.
- වස් සමාදන් වීම, පවාරණය හා දායක පක්ෂය මඟින් සංවිධානය කරන කඨින චීවර පූජාව පිළිබඳ ව ද බොහෝ ශාසනික නියමයන් පනවා තිබෙන බව.

**සඞ්ඝික ක්‍රමය**

- සඞ්ඝික යන්නෙහි වචනාර්ථය සඟ සතු, සංඝයාට අයිති යන්න බව.
- යම් කෙනෙක් තමාට අයත් දෙයක් එක් භික්ෂු නමකට පෞද්ගලිකව නො ව පොදුවේ සංඝයාට පිරිනම යි ද එය සඞ්ඝික වන බව.
- භික්ෂු සමාජයේ සාමූහිකත්වය ආරක්ෂා කරලීම සඳහා සඞ්ඝික ක්‍රමය බුදු රජාණන් වහන්සේ විසින් පනවා වදාරන ලද බව.
- සඞ්ඝික දේපළ ක්‍රමය ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ ප්‍රකට කරන බව.
- පෞද්ගලික ව කරනු ලබන පූජාවට වඩා සඟ සතු පූජාව ආනිසංස දායක යැයි මහා ප්‍රජාපතී ගෝතමියට උපදෙස් දුන් බව. (දක්ඛිණා විභංග සූත්‍රය- ම.නි.)
- රජගහනුවර සිටුතුමා විහාර හැටක් කරවා පූජා කරන විට ඒවා සතර දිසාවෙන් වඩින භික්ෂූන්ගේ පරිහරණය සඳහා සංඝයාට පූජා කරන්නට අනුශාසනා කළ බව. (චුල්ලවග්ගපාළිය)
- සඟ මහලු පිළිවෙළ සසුනේ වැදගත් කොට සැලකුව ද සඞ්ඝික දේපළ පරිභෝජනයේ දී පුද්ගල අවශ්‍යතා අනුව ක්‍රියා කිරීමට අනුශාසනා කර ඇති බව. (චුල්ලවග්ගපාළිය)
- සඞ්ඝික ලාභයන් ආවාසික භික්ෂූන්ගේ අවශ්‍යතා ඉටු වන පරිදි ආරක්ෂා කිරීමට හා සංඝයා වෙත බෙදාදීමට අදාළ තනතුරු රාශියක් ඇති කර ඇති බව. (සේනාසනක්ඛන්ධකය-චුල්ලවග්ගපාළි)
- සංඝයා විසින් සඞ්ඝික දේපළ සුරක්ෂිත ව වගකීම් සහිත ව පරිභෝජනය කළ යුතු බව. (සේනාසනක්ඛන්ධකය- චුල්ලවග්ගපාළි)
- සඟ සතු දේපළ පෞද්ගලික අයිතියට ගැනීම හෝ සංඝ අනුමතියකින් තොර ව දීම කළ නො හැකි බව. (චුල්ලවග්ගපාළිය)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. අගසවු තනතුරු ප්‍රදානය තෙක් සංඝ සමාජයේ විකාශය විස්තර කරන්න.
2. සතර පාරාජිකා පැනවීමට හේතු වූ නිදානයන් පන්තියේ ඉදිරිපත් කරන්න.
3. භික්ෂු සංඝ සමාජයේ සාමූහිකත්වයට හා චිරස්ථිතියට විනය ප්‍රඥප්ති හේතු වූ ආකාරය විග්‍රහ කරන්න.
4. විනය ශික්ෂාපද පැනවීමේ පරමාර්ථ ඇතුළත් ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
5. වස්සාවාසයේ ආරම්භය කෙසේ සිදු වූයේ ද යන්න වස්සුපනායිකක්ඛන්ධකය ඇසුරින් පැහැදිලි කරන්න.
6. සඞ්ඝික දේපළ පරිභෝජනයෙහි දක්නට ලැබෙන ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ පැහැදිලි කරන්න.

**නිපුණතාව 3.0 :** සංඝ සමාජයේ පරමාර්ථ සහ ප්‍රතිපත්ති විමර්ශනය කර, එහි චිරස්ථිතියට යහ ආකල්පවලින් යුක්ත ව දායක වෙයි.

**නිපුණතා මට්ටම 3.2 :** සඟ ගුණ පිළිබඳ සැදැහැ සිතින් සංඝ සමාජයේ විශිෂ්ට ලක්ෂණ ආදර්ශ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 43 යි.

**ඉගෙනුම් පල :**

- සඟගුණ විස්තර කරයි.
- සාමූහික සහජීවනය අගයයි.
- විහාර කාර්ය සාධක සමිතියක් පිහිටුවීමට දායක වෙයි.
- සංඝ සමාජයේ චිරපැවැත්මට කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සාමූහික සහජීවනය පිණිස සංඝ සමාජයෙන් ලැබිය හැකි ආදර්ශ පෙන්වාදීම හා සංඝ සමාජය පෝෂණය කර, ආරක්ෂා කිරීමට මඟ පෙන්වීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**ගුරු ශිෂ්‍ය සම්බන්ධය**

- ප්‍රථම සම්බෝධි යුගයේ බුදු රජාණන් වහන්සේ විසින් ම තම ශ්‍රාවකයන් හික්මවන ලද බව. (මහාවග්ගපාළිය)
- පසු කාලීන ව පැවිදි වූ ඇතැම් භික්ෂූන්ගේ නො මනා ආකල්ප හා හැසිරීම් පාලනය කිරීමට උපාධ්‍යායවරයකු අනුදැන වදාළ බව. (මහාවග්ගපාළිය)
- උපාධ්‍යායවරයා නොමැති කල්හි අනාකල්ප සම්පන්න ව හැසිරෙන පිරිස් හික්මවීම සඳහා ආචාර්යවරයකු අනුදැන වදාළ බව. (මහාවග්ගපාළිය)
- උපාධ්‍යායවරයාගේ ශිෂ්‍යයා සද්ධිවිහාරික නාමයෙන් ද ආචාර්යවරයාගේ ශිෂ්‍යයා අන්තේවාසික යන නාමයෙන් ද හැඳින්වෙන බව. (මහාවග්ගපාළිය)
- උපාධ්‍යාය - සද්ධිවිහාරික, ආචාර්ය - අන්තේවාසික සම්බන්ධතා පිය පුතු ආකල්පය පදනම් කොට ගොඩනැඟී ඇති බව.
- ගුරුවරයාගේ මූලික කාර්යය ශිෂ්‍යයාට අවවාද, අනුශාසනා ලබාදීම බව. (සමන්තපාසාදිකාව)
- බුදු රජාණන් වහන්සේ විසින් උපාධ්‍යාය, සද්ධිවිහාරික, ආචාර්ය අන්තේවාසික වත් මහාවග්ගපාළියේ දේශනා කර ඇති බව.
- නවක උපසපන් භික්ෂුව ගුරුවරයකු යටතේ පුහුණුව ලැබිය යුතු අතර, එය 'නිස' සමාදන් වීම යනුවෙන් හැඳින්වෙන බව. (මහාවග්ගපාළිය)
- නවක භික්ෂුව 'නිස' සමාදන් විය යුත්තේ භික්ෂු ජීවිතයේ එළඹන අන්තරායකර ධර්මවලින් ආරක්ෂා වීම සඳහා බව. (මහාවග්ගපාළිය)
- ව්‍යක්ත, ප්‍රතිබලසම්පන්න භික්ෂුවට පස් වසකින් පසු නිසෙන් මිදිය හැකි බව. (මහාවග්ගපාළිය)

**සුපටිපන්නාදී නව වැදෑරුම් සඟ ගුණ**

- බුද්ධශ්‍රාවක සංඝයා සුවිශේෂ ගුණ නවයකින් යුක්ත බව.

(උපෝසථ සූත්‍රය, අ.නි.)

**1. සුපටිපන්න**

- 'සුපටිපන්න' යන්න 'මැනවින් පිළිපන්', මනා වූ ප්‍රතිපත්ති, 'මනා පිළිවෙත්හි යෙදී සිටින' යන අරුත් දෙන බව. (විශුද්ධි මාර්ගය)
- භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂු සංඝයා අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤා ආදි මනා ප්‍රතිපත්තිවලින් යුක්ත යැයි ඉන් කියවෙන බව.
- සීලයෙන් යුක්ත වීම, ඉන්ද්‍රිය සංවරය, භෝජනයේ පමණ දැනීම, නිදිවර්ජිත වීම ආදිය ඇතුළත් සේඛ ප්‍රතිපදාවෙන් යුක්ත වීම ඉන් අදහස් වන බව.
- විදර්ශනා භාවනාව වැඩීමෙහි කැමති භික්ෂුව විසින් සුපටිපන්න වීම පිණිස තෙළෙස් ධුතාංග පිරිය යුතු බව.
- සංඝයාගේ සුපටිපන්න බව පිළිබඳ ව වච්ඡගොත්ත පරිබ්‍රාජකයා විසින් සිදු කරනු ලැබූ ඇගයීමක් මජ්ඣිම නිකායේ වච්ඡගොත්ත සූත්‍රයේ දැක්වෙන බව.

**2. උජුපටිපන්න**

- ඍජු ප්‍රතිපත්තියක පිහිටා සිටීම මෙයින් අර්ථවත් වන බව.
- ඍජු ප්‍රතිපත්තිය යනු කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගය යන අන්ත දෙකෙන් මිදී මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්යඅෂ්ටාංගික මාර්ගයේ ගමන් කිරීම බව.

(විශුද්ධි මාර්ගය)

- බුදු රජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා කය, වචනය, සිත යන තුන් තැන්හි ඇද-කුද දුරු කිරීම පිණිස (කුහක පිළිවෙත්හි නොයෙදී) පිළිපන් බැවින් උජුපටිපන්න යැයි විශුද්ධි මාර්ගයේ සඳහන් වන බව.

**3. ඤායපටිපන්න**

- සත්‍ය පිළිවෙත්හි පිහිටා සිටීම මෙයින් අර්ථවත් වන බව.
- 'ඤාය' යනුවෙන් නිර්වාණය, විදර්ශනා මාර්ගය, ආර්යඅෂ්ටාංගික මාර්ගය අදහස් කෙරෙන අතර එම මාර්ගයට අවතීර්ණ වීම ඤායපටිපන්න වන බව. (විශුද්ධි මාර්ගය)
- ශාස්වත, උච්ඡේද දෘෂ්ටිවලින් මිදී ධර්මයන්ගේ ප්‍රතීත්‍යසමුත්පන්නතාව දකින්නා වූ ආර්ය න්‍යායයට පිළිපන් බව. (මනෝරථපූරණී අටුවාව)

**4. සාමීචිපටිපන්න**

- ධම්මානුධම්මපටිපදාවට යෝග්‍ය වූ සුදුසු වූ ස්වභාවය 'සාමීචි' නම් වන බව.

(විශුද්ධි මාර්ගය)

- ආර්ය නිවැරදි පිළිවෙත්හි පිහිටා සිටින, සසර දුකින් මිදීමට සමර්ථ ප්‍රතිපදාවට ප්‍රවිෂ්ට ව සිටින බැවින් සංඝයා ''සාමීචිපටිපන්න'' වන බව. (සුමංගල විලාසිනී අටුවාව)

- අනුන් විසින් කරනු ලබන උපස්ථානාදී බුහුමන් ලැබීමට සුදුසු වීම ද සාමීචිපටිපන්න යන්නෙන් අර්ථවත් වන බව.
- ශීලාදී ගුණධර්මවල හැසිරෙන පුද්ගලයන්ට කරන උපස්ථානාදිය සාමීචිකර්ම ලෙස හැඳින්වෙන බව.
- අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤ යන ත්‍රිශික්ෂාවෙහි යෙදෙමින් ප්‍රතිපත්ති පුරන නිසා ශ්‍රාවක සංඝයා සාමීචිපටිපන්න වන බව.

**5. ආහුනෙය්‍ය**

- පූජාවලට යෝග්‍ය ය යන්න මෙයින් අර්ථවත් වන බව.
- දුර බැහැර සිට වුව ද ගෙන ගොස් සිවුපසය පිළිගැන්වීමට සුදුසු වන බැවින් ආහුනෙය්‍ය වන බව. (පරමත්ථදීපනි අටුවාව)

**6. පාහුනෙය්‍ය**

- පූජාවලට යෝග්‍ය ය යන්න මෙයින් අදහස් වන බව.
- දිශා අනුදිශාවන්ගෙන් පැමිණෙන ඥාති මිත්‍රාදීන් උදෙසා උසස් අන්දමින් පිළියෙළ කළ ආගන්තුක භෝජනය 'පාහුන' නමින් හැඳින්වෙන බව. (පරමත්ථදීපනී අටුවාව)
- ආගන්තුක සත්කාර වශයෙන් ඥාතීන්ට පිළිගැන්වීමට පිළියෙළ කරන ලද ප්‍රත්‍යය අනෙකකුට දීම සුදුසු නො වූව ද සංඝයාට දීමට සුදුසු බැවින් සංඝයා පාහුනෙය්‍ය වන බව. (පරමත්ථදීපනී අටුවාව)

**7. දක්ඛිණෙය්‍ය**

- දක්ෂිණාව පිළිගැනීමට සුදුසු ය යන්න මෙයින් අදහස් වන බව. (මනෝරථපූරණී අටුවාව)
- දක්ෂිණාව යනු පරලොව සැප පතා දෙනු ලබන දානය වන අතර එය ලැබීමට සංඝයා අතිශයින් ම සුදුසු වන බැවින් දක්ඛිණෙය්‍ය නම් වන බව. (පරමත්ථදීපනී අටුවාව)

**8. අංජලිකරණීය**

- වැඳුම් ලැබීමට සුදුසු ය යන්න මෙයින් අදහස් වන බව. (මනෝරථපූරණී අටුවාව)
- සියලු දෙව් මිනිසුන් දොහොත් මුදුන් තබා ඇඳිලි බැඳ කරන නමස්කාරය පිළිගැනීමට සුදුසු බැවින් අංජලිකරණීය නම් වන බව. (පරමත්ථදීපනී අටුවාව)

**9. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස**

- ලෝකයාට අනුත්තර වූ පින් කෙතක් වේ යන්න මෙයින් අදහස් වන බව.
- දීමෙන්, පුදසත්කාර කිරීමෙන්, දායකයාට මහත් ආනිසංස ලැබෙන හෙයින් ශ්‍රාවක සංඝයා අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වන බව. (පරමත්ථදීපනී අටුවාව)

**බ්‍රහ්මචරියාව හා අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා ගුණ**

**බ්‍රහ්මචරියාව**

- බ්‍රහ්මචරියාව යන්නෙහි බඹසර විහරණය, සාසනය, මෛථුන විරතිය, ආර්යමාර්ගය, උපෝසථ සීලය යන වචනාර්ථ ඇති බව. (පාලි සිංහල ශබ්දකෝෂය)
- බ්‍රහ්මචරියාව භික්ෂු ජීවිතයේ පදනම බව.
- බඹසරින් යුක්ත ව සියලු දේ නුවණින් විමසා හැසිරෙන්නා නිශ්චය වශයෙන් ම භික්ෂුවක් බව. (ධම්මපද-ධම්මට්ඨ වග්ග)
- බ්‍රහ්මචරියාව සංවරය පිණිස, ක්ලේශ ප්‍රහාණය පිණිස, විරාගය පිණිස, රාගාදීන්ගේ නිරෝධය පිණිස වන බව. (බ්‍රහ්මචරිය සූත්‍රය.අ.නි.)
- සැක කටයුතු සේ පවත්නා බ්‍රහ්මචර්යාව මහත් ඵල නො වන බව. (ධම්මපදය - නිරයවග්ගය)

**අප්පිච්ඡතා**

- අල්පේච්ඡතාව යන්නෙන් අල්ප ඉච්ඡා ඇතැයි අදහස් වන බව.
- අත්‍රිච්ඡතා (අධික තෘෂ්ණාව) පාපිච්ඡතා (නැති ගුණ පෙන්වා ලාභ අපේක්ෂා කිරීම), මහිච්ඡතා (මහත් බලාපොරොත්තු) යන පද මෙයට විරුද්ධ අදහස් පළ කරන බව.
- පාපිච්ඡතාවෙන් යුතු භික්ෂුව තුළ ශ්‍රද්ධා, සීල, සමාධි ගුණ නො පිහිටන බව.
- අල්පේච්ඡතාව පුද්ගලයා චාම්, සරල, සැහැල්ලු අයකු කරන අතර සමාජ විෂමතා නැති කිරීමට උපකාරී වන බව.
- රහතන් වහන්සේ අප්පිච්ඡතා ගුණයෙහි පරමාදර්ශය වන බැවින් 'අප්පිච්ඡ' යනුවෙන් හැඳින්වෙන බව.
- භික්ෂු ජීවිතයට අදාළ අපිස් පැවැත්ම චතුර්විධ නිශ්‍රය ධර්ම මගින් ප්‍රකට කරන බව. (මහාවග්ගපාළිය)
- තණ්හාවෙන් මැඬුණු පැවිද්දා මහවැස්සෙන් මැඩුණ තණකොළ හා සමාන ව ශෝකයෙන් මැඬෙන බව.

**සන්තුට්ඨිතා**

- ලද පමණින් සතුටු වීම 'සන්තුට්ඨිතා' යන්නෙන් අදහස් වන බව.
- මෙත්ත සූත්‍රයේ, සන්තුස්සකෝ යන්නෙන් එය කියවෙන බව. (සුත්තනිපාතය)
- දැහැමි සතුට පරම ධනයක් යැයි ''සන්තුට්ඨී පරමං ධනං '' යනුවෙන් බුදු රජාණන් වහන්සේ දේශනා කර ඇති බව. (ධම්මපදය -සුඛවග්ගය)
- සන්තුට්ඨිය, යථාලාභ සන්තුට්ඨිය (සිවුපස වශයෙන් ලැබුණු දෙය පිළිබඳ සතුට) යථාබල සන්තුට්ඨිය (බලය ඇති පමණ සතුටු වීමේ පිළිවෙත) යථාසාරුප්ප සන්තුට්ඨිය (තමා සතු උසස් දෙයක් තව කෙනෙකුට ලබා දී සතුටු වීම) යනුවෙන් තුන්ආකාර වන බව. (සාරත්ථදීපනී - සන්තුට්ඨ සුත්ත වණ්ණනා ස.නි.)
- සන්තුට්ඨී ගුණය නොමැතිකම අධි තරගකාරීත්වය, සමාජ විරෝධි ක්‍රියා, තරුණ අසහනය ආදිය ඇති වීමට හේතු වන බව.

**සුභරතා**

- 'සුභරතා' යන්නෙන් පහසුවෙන් පෝෂණය කළ හැකි ය යන්න අදහස් වන බව.
- අප්පිච්ඡතා සන්තුට්ඨිතා ඇති තැනැත්තා පහසුවෙන් පෝෂණය කළ හැකි බව.
- විනය ශික්ෂාවන් මඟින් සුභරතා ගුණය ප්‍රගුණ කිරීමට අනුබල ලැබෙන බව.
- බුදු රජාණන් වහන්සේ මහාවග්ගපාළියේ භේසජ්ජක්ඛන්ධකයේ හා චම්මක්ඛන්ධකයේ සුභරතා ගුණයට අදාළ වැදගත් අනුශාසනා රැසක් පවත්වා ඇති බව.

**අත්තහිත පරහිත බව**

- තමාගේ දියුණුව, යහපත, අභිවෘද්ධිය, සැනසුම, කැමති වීම - අත්තහිත ලෙසත්, අන්‍යයන්ගේ දියුණුව, යහපත, අභිවෘද්ධිය, සැනසුම, කැමති වීම - පරහිත ලෙසත් හැඳින්වෙන බව.
- දෙවි මිනිසුන් සහිත ලෝකයාගේ හිතසුව පිණිස දහම් දෙසන්නැයි බුදු රජාණන් වහන්සේ පළමු රහත් හැට නම අමතා කළ අනුශාසනයෙන් පරහිතකාමී වීමට මඟ සලසා ඇති බව.
- පඤ්චනීවරණ ධර්මයන්ගෙන් මැඩුණු මනසක් ඇති පැවිද්දා ස්වාර්ථය හා පරාර්ථය පිළිබඳ නිවැරදි අවබෝධයෙන් කටයුතු නො කරන බව. (නීවරණ සූත්‍රය-අ.නි. )
- ස්වාර්ථයෙහි හා පරාර්ථයෙහි නො යෙදෙන පුද්ගලයා
  ස්වාර්ථයෙහි යෙදෙන පරාර්ථයෙහි නො යෙදෙන පුද්ගලයා
  ස්වාර්ථයෙහි නො යෙදෙන පරාර්ථයෙහි යෙදෙන පුද්ගලයා
  ස්වාර්ථයෙහි හා පරාර්ථයෙහි යෙදෙන පුද්ගලයා
  යනුවෙන් පුද්ගලයන් සතර දෙනෙකු සිටින බව හා භික්ෂූන් වහන්සේලා මෙහි සතර වැනි ආදර්ශය සපයන බව. (ඡවාලාත සූත්‍රය අ.නි. )
- භික්ෂුවක් පරාර්ථකාමී වීමට නම් පළමු ව තමන් ඊට සුදුසු විය යුතු අතර, බුදු සිරිතෙන් එය සනාථ වන බව.
- භික්ෂුවක් ආත්මාර්ථය හා පරාර්ථය මැනවින් තේරුම් ගෙන පරාර්ථය නිසා ආත්මාර්ථය නො පිරිහෙළා ගන්නා බව. (අත්තදත්ථං පරත්ථෙන - බහුනා'පි න හාපයෙ ....... ''
  (ධම්මපද, අත්තවග්ග. ඛු.නි.)
- ''අත්තාන මෙව පඨමං .........'' යන අනුශාසනයෙහි පිහිටා ක්‍රියා කරන බැවින් භික්ෂුව අත්තහිත ජීවිතයක් ප්‍රකට කරන බව. (ධම්මපදය-අත්තවග්ගය. ඛු.නි.)
- ''මඩෙහි ගිලී සිටින්නකු මඩෙහි ගිලී සිටින වෙනත් අයකු ගොඩගැනීමට ක්‍රියා කිරීම අනුවණ අසාර්ථක ප්‍රයත්නයකි. සිදු නො විය හැක්කකි. එබැවින් පළමු ව තමන් මඩෙන් ගොඩට පැමිණ දෙවනු ව මඩෙහි ගිලී සිටින්නවුන් නිදහස් කර ගැනීමට උත්සාහ කළ යුතුය'' යන අනුශාසනය භික්ෂුව පිළිපදින බව. (සල්ලේඛ සූත්‍රය .ම.නි. )
- යම් කායික, වාචසික, මානසික ක්‍රියාවක් කරන කල්හි එය උභය පාර්ශ්වයේ ම යහපතට හේතු වන්නේ දැයි විමසා බලා ම සිදු කරන බව. (අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය. ම.නි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. භික්ෂු සමාජයේ ගුරු ශිෂ්‍ය සබඳතාව බිඳ වැටීමට බලපාන හේතු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
2. සසුන් දිවියේ එළඹෙන අන්තරායකර තත්ත්වයෙන් මිදීමට නවක උපසම්පන්න භික්ෂුවට නිස සමාදන් වීම කොතෙක් දුරට පිටිවහලක් වේ දැයි සාකච්ඡා කරන්න.
3. ''ගුරු ශිෂ්‍ය සම්බන්ධය '' යන තේමාව යටතේ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.
4. සුපටිපන්නාදි නව වැදෑරුම් සඟ ගුණ පිළිබඳ පොත්පිංචක් සකස් කරන්න.
5. සංඝ සමාජයේ චිරස්ථිතිය පිණිස ඔබට ඉදිරිපත් කළ හැකි යෝජනා ලැයිස්තුවක් සකස් කරන්න.
6. පැවිදි මෙන් ම ගිහි ජීවිතයේ අභිවෘද්ධිය උදෙසා අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා ආදි ගුණ හේතු වන ආකාරය පැහැදිලි කරන්න.

**පරිශීලනයට :**

| | |
|---|---|
| • බ්‍රහ්මජාල සූත්‍රය | දීඝ නිකාය |
| • සාමඤ්ඤඵල සූත්‍රය | දීඝ නිකාය |
| • සීලක්ඛන්ධ වග්ගය | දීඝ නිකාය |
| • මහාතණ්හාසංඛය සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • වච්ඡගොත්ත සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • සල්ලේඛ සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • කකචූපම සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • භද්දාලි සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • දක්ඛිණ විභංග සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • සත්තජටිල සූත්‍රය -කෝසල සංයුක්තය | සංයුක්ත නිකාය |
| • භික්ඛක සූත්‍රය | සංයුක්ත නිකාය |
| • රජ්ජ සූත්‍රය | සංයුක්ත නිකාය |
| • සුඛවග්ගය, පළමු සූත්‍රය | අංගුත්තර නිකාය |
| • දුතිය පුඤ්ඤාභිසන්ද සූත්‍රය | අංගුත්තර නිකාය |
| • දසධම්ම සූත්‍රය | අංගුත්තර නිකාය |
| • බ්‍රහ්මචරිය සූත්‍රය | අංගුත්තර නිකාය |

| | |
|---|---|
| • දේවදත්ත සූත්‍රය | අංගුත්තර නිකාය |
| • ඡවාලාත සූත්‍රය | අංගුත්තර නිකාය |
| • මහානාම සූත්‍රය | අංගුත්තර නිකාය |
| • සන්තුට්ඨී සූත්‍රය | අංගුත්තර නිකාය |
| • සික්ඛාපදානිසංස සූත්‍රය | අංගුත්තර නිකාය |
| • ධම්මපදපාලි (බුද්ධවග්ගය, ධම්මට්ඨ වග්ගය, නිරය වග්ගය, අත්ත වග්ගය) | ඛුද්දක නිකාය |
| • මහාඛන්ධකය | මහාවග්ගපාළි |
| • වස්සූපනායිකඛන්ධකය | මහාවග්ගපාළි |
| • පවාරණක්ඛන්ධකය | මහාවග්ගපාළි |
| • චම්මක්ඛන්ධකය | මහාවග්ගපාළි |
| • භෙසජ්ජක්ඛන්ධකය | මහාවග්ගපාළි |
| • උපජ්ඣායවත ආචරියවත, සද්ධිවිහාරිකවත | මහාවග්ගපාළි |
| • මහාමංගල සූත්‍රය | සුත්ත නිපාතය |
| • පබ්බජ්ජා සූත්‍රය | සුත්ත නිපාතය |
| • මෙත්ත සූත්‍රය | සුත්ත නිපාතය |
| • භික්ඛුණී ඛන්ධකය | චුල්ලවග්ගපාළිය |
| • මාගන්දිය සූත්‍රය | චුල්ලවග්ගපාළිය |
| • පහාරාද සූත්‍රය, වේරඤ්ජක කාණ්ඩය | පාරාජිකපාළි |

- අන්තේවාසික වත, නිස්සය කථාව,
- දීඝ නිකාය අටුවාව
- මජ්ඣිම නිකාය අටුවාව
- සංයුත්ත නිකාය අටුවාව
- සමන්ත පාසාදිකාව
- පරමත්ථදීපනී අටුවාව
- මනෝරථපූරණී අටුවාව

- උපසම්පදා සීලය — රේරුකානේ චන්දවිමල හිමි, (2014) 12 වන මුද්‍රණය, ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, පොකුණුවිට.

- ශාසනාවතරණය — රේරුකානේ චන්දවිමල හිමි, (2014) 12 වන මුද්‍රණය, ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, පොකුණුවිට.

- භික්ෂු සමාජය — දේවාලේගම මේධානන්ද හිමි, (2004) දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ

- බෞද්ධ සංස්කෘතිය පසුබිම හා මූලධර්ම — දේවාලේගම මේධානන්ද හිමි, තැඹිලේ ධම්මරතන හිමි, ගාමිණී විජයසිංහ

- භික්ෂුව සහ සම්ප්‍රදාය — ලංකානන්ද හිමි, ප්‍රණීත් අභයසුන්දර (සංස්.) එස්. ඇන්ඩ්. එස්. ප්‍රින්ටර්ස්, අංක 33, පාසල් පටුමඟ, කොළඹ 09.

- බෞද්ධ දර්ශනය සහ සමාජ දර්ශනය — උඩගලදෙණියේ සෝමරංසි හිමි
- ත්‍රිවිධ රත්නයෙහි සුවිසි මහ ගුණ — නිවන්දම ධර්මකීර්ති හිමි
- ප්‍රාතිමෝක්ෂ විවරණ — බුජ්ජම්පොල ධම්මපරායන තිස්ස හිමි

- බෞද්ධ විනය කර්ම — මැදගම්පිටියේ විජිතධම්ම හිමි, (2006) සදීපා ප්‍රකාශන, මරදාන

- බෞද්ධ විනය අධ්‍යයනය — කොටපිටියේ රාහුල හිමි (2006) කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව, කෝට්ටේ රාජමහාවිහාරය, කෝට්ටේ.

- බෞද්ධ ශිෂ්ටාචාරය, මූලධර්ම සහ වංශකතාව — චන්ද්‍රිම විජේබණ්ඩාර, එම්.එම්. මොරටුවගම, (1990) ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්, කොළඹ

- ශ්‍රමණ සම්ප්‍රදාය — ආනන්ද විජේරත්න, (2004) කර්තෘ ප්‍රකාශන

**නිපුණතාව 4.0 :** පුද්ගලයා හා සමාජය පිළිබඳ බුද්ධකාලීන ආගමික චින්තා තුලනාත්මක ව හා විචාරාත්මක ව අධ්‍යයනය කර යථාර්ථවාදී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 4.1 :** පුද්ගලයාගේ ස්වාමිත්වය හා ශක්‍යතාව පිළිබඳ ව විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 15 යි.

**ඉගෙනුම් පල :**

- පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් විචාරය කරයි.
- නිර්මාණවාදී සංකල්පවල නිසරු බව වටහා ගනියි.
- ශිෂ්‍ය සමිතියේ දී සමානාත්මතාව අගය කරමින් කතාවක් පවත්වයි.
- උස් මිටිකම් නොතකා ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

නිර්මාණවාදී ආගමික සංකල්ප මඟින් නිර්දේශිත පුද්ගලයා හා සමාජය පිළිබඳ විවිධ වර්ගීකරණවල සාවද්‍යතාව වටහාදීම හා සමානාත්මතාව හා සහජීවනය සඳහා මඟපෙන්වීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම්**

- ඊශ්වර, මහා බ්‍රහ්ම නොහොත් මහා පුරුෂ යනුවෙන් හඳුන්වනු ලබන සර්වබලධාරී මැවුම්කරුවා විසින් විශ්වය, පුද්ගලයා හා සමාජය මවා පාලනය කරනු ලබයි යන්න බ්‍රාහ්මණයන්ගේ පිළිගැනීම බව.
- සමාජ වර්ගීකරණය, වෘත්තීන් නිර්දේශ කිරීම, පුද්ගල ජීවිතය අවධි හතරකට බෙදීම, සෞභාග්‍ය සහ ස්වර්ගපරායනය සඳහා යාගය හෙවත් කර්ම මාර්ගය නිර්දේශ කිරීම ආදි සියලු ක්‍රියා මහා බ්‍රහ්මයාගේ මැවීමට යටත් බව.
- ඊශ්වර කැමැත්තට අනුව සියල්ල සිදුවන්නේ යැයි පිළිගැනීම නිසා මානව ශක්‍යතාව, ස්වච්ඡන්දතාව සචේතනික ක්‍රියා පිළිබඳ වගකීම අභියෝගයකට ලක් වන බව.
- සියල්ල මහා බ්‍රහ්මයාගේ නිර්මාණයට යටත් බව පිළිගැනීම නිසා විශ්වය මෙහෙයවීමේ වගකීම බාහිර බලවේගයකට පැවරෙන බව.
- බ්‍රාහ්මණ ඉගැන්වීම් මඟින් පුද්ගල යුතුකම් හා වගකීම් අවධාරණය කළ ද අයිතිවාසිකම්වලට නිසි තැන හිමි නොවන බව.
- ත්‍රිලක්ෂණ සිද්ධාන්තය, පටිච්ච සමුප්පාද න්‍යායය අනුව බුදුදහම ඊශ්වර නිර්මාණවාදය සහ ආත්මවාදය වැනි නිත්‍යාත්මීය සංකල්ප බැහැර කරන බව.
- බෞද්ධ මූලාශ්‍රය අනුව ලෝකයේ සහ සත්ත්වයාගේ පැවැත්ම හේතුප්‍රත්‍යය න්‍යායයට අනුගත ව සිදු වන අයුරු පැහැදිලි කිරීමෙන් දේව නිර්මාණවාදය ප්‍රතික්ෂේප වන බව.
- බුදුදහම ස්වච්ඡන්දතාව, නිදහස, වගකීම හා කර්ම විපාක සිද්ධාන්තය පිළිගැනීම නිසා බ්‍රාහ්මණ සමාජ ධර්මවල පදනම බිඳ වැටෙන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. වර්ණ ධර්ම, ස්වධර්ම, ආපද්ධර්ම ඉදිරිපත් කෙරෙන සංස්කෘත ශ්ලෝක නිවැරදි ව ලියා දක්වන්න.
2. අදාළ පාලි මූලාශ්‍රය පදනම් කරගෙන වර්ණධර්ම, ස්වධර්ම, ආශ්‍රමධර්ම යාගය වැනි බ්‍රාහ්මණ ඉගැන්වීම්වල නිසරු බවට සාධක රැස් කරන්න.
3. ප්‍රතීත්‍යසමුත්පාද මූලධර්මයට අනුගත ව සත්ත්වයාගේ හා ලෝකයේ පැවැත්ම සිදුවන අයුරු ප්‍රදර්ශන පුවරුවකින් ඉදිරිපත් කරන්න.
4. 'සමානාත්මතාව' අගය කරමින් කවි පන්තියක් නිර්මාණය කරන්න.
5. බ්‍රාහ්මණ ඉගැන්වීම්වල ඇති නිස්සාරවත් බවත් බුදුදහමෙහි ඇති සාරවත් බවත් පැහැදිලි කෙරෙන ලිපියක් ලියන්න.
6. සියල්ල මහා බ්‍රහ්මයාගේ නිර්මාණයට අයත් නොවන බවත් විශ්වය මෙහෙයවීම බාහිර බලයකට පැවරෙන බවත් පැහැදිලි කරමින් පවත්වන කතාවේ සැකිල්ල සකස් කරන්න.

**නිපුණතාව 4.0** : පුද්ගලයා හා සමාජය පිළිබඳ බුද්ධකාලීන ආගමික චින්තා තුලනාත්මක ව හා විචාරාත්මක ව අධ්‍යයනය කර යථාර්ථවාදී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 4.2** : ෂට් ශාස්තෘ ඉගැන්වීම් අධ්‍යයනය කරමින් ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 28 යි.

**ඉගෙනුම් පල** :

- ෂට් ශාස්තෘ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ ආකල්පය විස්තර කරයි.
- ෂට් ශාස්තෘ ඉගැන්වීම්වල ඌනතා ඇති බව පිළිගනියි.
- සදාචාර විරෝධී ක්‍රියා බැහැර කර දෛනික කටයුතුවල යෙදෙයි.
- සමාජ සාරධර්ම ස්ථාපනය කිරීමට දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බෞද්ධ ඉගැන්වීම අනුව ෂට් ශාස්තෘ දර්ශනයෙහි ඌනතා ඇති බව පෙන්වාදීම හා සදාචාර විරෝධි ක්‍රියා බැහැර කොට සමාජ සාරධර්ම ස්ථාපනය කිරීම සඳහා එම ඉගැන්වීම්වලින් ලැබෙන බලපෑම පෙන්වාදීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**අකිරියවාදය**

- කර්ම විපාක නොපිළිගැනීම හෙවත් පින් පව් හා විපාක ප්‍රතික්ෂේප කිරීම අකිරියවාදය බව.
- පූර්ණකාශ්‍යප තුමාගේ ඉගැන්වීම අකිරියවාදය ලෙස හැඳින්වෙන බව.
- කවරාකාරයක කර්මයක් සිදු කළත් ඉන් සිදු වන පිනක් හෝ පවක් හෝ නැතැයි මෙතුමා ඉගැන්වූ බව.
- ''තමා ම කරන්නාට ද, අනුන් ලවා කරවන්නාට ද ...... ''ආදි වශයෙන් තමා විසින් කරන ලද හෝ තමා විසින් අනුන් ලවා කරවන ලද හෝ කිසිදු ක්‍රියාවකින් පිනක් හෝ පවක් හෝ සිදු නොවන්නේ යැයි මෙතුමා ඉගැන්වූ බව. (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)
- කාශ්‍යපතුමාගේ දර්ශනය භාරතයේ පැවැති චාර්වාක දර්ශනයට ද බෙහෙවින් සමාන වන බව.
- මෙතුමා උග්‍ර භෞතිකවාදී චින්තකයකු බව.
- පූර්ණකාශ්‍යප ශාස්තෘවරයා පින - පව මෙන් ම ශීල - ව්‍රත ආදිය ද ප්‍රතික්ෂේප කරන බව.

''ඉධ ඡින්දිතමාරිතෙ - හතජාතීසු කස්සපො
නපාපං සමනුපස්සති - පුඤ්ඤංවා පන අත්තනො
සවෙවිස්සාසමාචික්ඛි - සත්ථා අහරති මානනන්ති''

(සාමඤ්ඤඵල සූත්‍රය දී. නි.)

- කර්ම විපාක පටිච්ච සමුප්පන්න යැයි බුදු දහමේ ඉගැන්වෙන බැවින් කාශ්‍යපතුමාගේ මූලික ඉගැන්වීම එමඟින් ප්‍රතික්ෂේප වන බව.
- සියලු බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාව සියලු පව් බැහැරලීමටත් කුසල් වැඩිදියුණු කිරීමටත් මඟපෙන්වන බැවින් අකිරියවාදය ප්‍රතික්ෂේප වන බව. (ධම්මපදය)
- මිනිසාට අකුසල දුරු කොට කුසලය වැඩිදියුණු කිරීමට හැකියාව ඇත යන බෞද්ධ ඉගැන්වීමෙන් අකිරියවාදය බැහැර කෙරෙන බව. (අකුසල සූත්‍රය අං.නි.)
- තමා විසින් සිදු කරනු ලබන සියලු අකුසල කර්මයන් තමාට දුක් විපාක ලබාදෙමින් පසුපස පැමිණෙන බව. (ධම්මපදය)
- පූර්ණ කාශ්‍යපතුමාගේ ඉගැන්වීම් පුද්ගලයාට මෙන් ම සමාජයට ද සදාචාරාත්මක වශයෙන් හානිකර යැයි බුදු දහමෙන් පෙන්වා දෙන බව.
- බුදු රජාණන් වහන්සේ අකිරියවාදීන් නියත මිථ්‍යා දෘෂ්ටිකයන් වශයෙන් නම් කර ඇති බව.
- බුදු දහමට අනුව ආචාර ධර්ම අර්ථවත් කිරීමට සහ සමාජය විධිමත් ව පවත්වාගෙන යාමට අකිරියවාදය ඉමහත් බාධකයක් වන බව.
- සත්ත්වයාගේ පැවැත්මත්, ස්වච්ඡන්දතාවත්, කර්මවිපාක සිද්ධාන්තයත් ප්‍රතීත්‍යසමුත්පන්න ව සිදු වන්නේ යැයි පිළිගන්නා බුදු දහම අකිරියවාදය සපුරා බැහැර කරන බව.

**නාස්තිකවාදය**

- අජිතකේසකම්බලීතුමා දානාදි පින්කම්වල මෙන් ම ප්‍රාණඝාතාදි පව්කම්වල ඵල විපාක නැතැයි උගන්වන බැවින් නාස්තිකවාදියකු හෙවත් උච්ඡේදවාදියකු වන බව. (නත්ථි සුබට දුක්ඛටානං කම්මානං ඵලං විපාකො ...........) (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)

- අජිතකේසකම්බලීතුමාගේ දර්ශනය උච්ඡේදවාදයට වැටෙන බව. (අජිතො කේසකම්බලි සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො උච්ඡෙදං බ්‍යාකාසි.) (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)

- සතර මහාභූතයන්ගෙන් හටගත් ශරීරය මරණින් පසු අවසන් වේ යැයි ද පරලොවක් නැතැයි ද ඉගැන්වූ බැවින් මෙතුමාගේ දර්ශනය භෞතිකවාදයක් බව.
- පින් පව්, කර්ම විපාක, මෙලොව පරලොව ආදිය ප්‍රතික්ෂේප කළ බැවින් මෙතුමාගේ දර්ශනය ද අකිරියවාදයක් බව.
- මෙතුමාගේ දර්ශනය දසවස්තුක මිථ්‍යා දෘෂ්ටිය නමින් හැඳින්වෙන බව. (මහාචත්තාරීසක සූත්‍රය ම.නි.)
- බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම අනුව මිථ්‍යා දෘෂ්ටිය මහාසාවද්‍ය බව.
- බුදු දහම පටිච්චසමුප්පාදය හෙවත් මධ්‍යම දේශනාව අනුව උච්ඡේදවාදය සපුරා බැහැර කරන බව.
- සසර දිවිය සරු කර ගැනීම මෙන් ම සසරින් එතෙර වීම සඳහා ද දානාදි පින්කම් ඉවහල් වන්නේ ය යන්න බෞද්ධ මතය බව.

(දානං තාණං මනුස්සානං - දානං දුග්ගති වාරණං
දානං සග්ගස්ස සොපාණං - දානං සන්තිකරං පරං)

- ඛන්ධ, ආයතන, ධාතු පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මගින් නාමරූප සන්තතියක අවිච්ඡින්න පැවැත්ම පිළිගන්නා බුදු දහම භෞතිකවාදී, උච්ඡේදවාදී ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරන බව.
- බුදු දහම දසවත්ථුක සම්මා දිට්ඨිය මඟින් දසවස්තුක මිථ්‍යා දෘෂ්ටිය ප්‍රතික්ෂේප කරන බව.
  (මහාචත්තාරීසක සූත්‍රය -ම.නි.)
- අජිතකේසකම්බලීතුමාගේ ඉගැන්වීම් පුද්ගල, සමාජ හා සදාචාර පරිහානියට හේතු වන අතර, බෞද්ධ සමාජ ධර්ම මඟින් පුද්ගලයා මෙන් ම සමාජය ද සදාචාරයට පොලඹවන බව.

**නියතිවාදය**

- සියල්ල පූර්ව නිශ්චිත ය යන්න නියතිවාදය බව.
- ස්වච්ඡන්දතාව ප්‍රතික්ෂේප කිරීම මඟින් නියතිවාදය අවධාරණය වන බව.
- මක්ඛලීගෝසාල සංසාරය පිළිබඳ නියතිවාදයක් ඉදිරිපත් කළ බව.
  (නියතිසංගතිභාවපරිණතා ඡස්සේවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙති)
  (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)
- මක්ඛලීගෝසාලතුමාගේ දර්ශනය අනුව කර්මය, බලය, පුරුෂ වීර්යය, පුරුෂ පරාක්‍රමය ආදිය අර්ථශූන්‍ය බව (නත්ථි අත්තකාරෙ නත්ථි පුරිසකාරේ නත්ථි බලං නත්ථි විරියං)
  (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)
- ලෝකය හා සත්ත්වයා පිළිබඳ කිසිදු සිදුවීමකට හේතුඵල සම්බන්ධයක් නැතැයි ඉගැන්වූ නිසා මෙතුමාගේ දර්ශනය අහේතු අප්පච්චයවාදයක් බව.
  (අහේතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති
  අහේතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති)
  (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)
- හේතුප්‍රත්‍යය සම්බන්ධතාව නො පිළිගන්නා බැවින් මෙතුමාගේ දර්ශනය අධිච්චසමුප්පන්න වාදයක් ලෙස ද නම් කළ හැකි බව.
- අධිච්චසමුප්පන්නවාදය මඟින් ද නියතිවාදය හා අකිරියවාදය තහවුරු කරන අතර කර්ම විපාක ප්‍රතික්ෂේප වන බව.
- හේතුව මෙන් ම විපාකය ද ප්‍රතික්ෂේප කරන මක්ඛලී (උභයම්පි පටිබාහති) අකිරියවාදියකු වන බව.
- සසර සැරිසැරීමෙන් ම එය නිම වන බව පෙන්වා දෙන බැවින් සංසාර ශුද්ධිවාදියකු ලෙස ද හැඳින්විය හැකි බව. (බාලෙච පණ්ඩිතෙච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති)
  (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)
- ද්‍රෝණයකින් මැන අවසන් කරන්නා සේ සුවදුක් කෙළවර වන්නේ යැයි මෙතුමා උගන්වන බව. (දොණමිතෙ සුඛ දුක්ඛෙ පරියන්තකතෙ සංසාරෙ) (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)
- මිනිසා මිථ්‍යා මඟට යොමු කර විපතට හෙළන කෙමනක් ලෙස මොහුගේ ඉගැන්වීම් බුදු රජාණන් වහන්සේ විසින් සලකන ලද බව.

- මක්ඛලි හිස් පුරුෂයා තරම් බොහෝ ජනයාට අනර්ථය පිණිස, අහිත පිණිස, දුක් පිණිස පිළිපන් අනෙක් පුද්ගලයකු නොදකිමි යි බුදු රජාණන් වහන්සේ වදාරා ඇති බව.
(එකක නිපාතය -අ.නි.)
- බුද්ධ දේශනාව පුද්ගල වීර්ය, උත්සාහය, සැපත හා යහපත අගය කරන බව.
(අරුණවතී සූත්‍රය- සං.නි.)
- බෞද්ධ මතය අනුව සත්ත්වයාගේ කෙලෙසීම හා පිරිසිදුවීම හේතුප්‍රත්‍ය සහිත ව ම සිදු වන බව. (මහාලී සූත්‍රය-අ.නි)
- සියලු ක්‍රියාවන්හි හේතුඵල සබඳතාවක් පවත්නේ යැයි බුදු රජාණන් වහන්සේ දේශනා කර ඇති බව (හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති ....) (සේල සූත්‍රය- ස.නි.)
- හේතුඵල දහම, කර්ම විපාක සිද්ධාන්තය ඉදිරිපත් කරන බුදු දහමින් මක්ඛලීගෝසාලගේ සියලු ඉගැන්වීම් ප්‍රතික්ෂේප වන බව.
- බුදු දහම අනුව සත්ත්ව සන්තතියේ පැවැත්ම හේතුඵල සම්බන්ධය අනුව ම සිදු වන බව.
(මහතණ්හාසංඛය සූත්‍රය- ම.නි.)
- සමාජය නියති සංගතිභාවයක් නොව පටිච්චසමුප්පන්න වූ පරිණාමීය ක්‍රියාවලියකැයි බුදු දහම උගන්වන බව. (අග්ගඤ්ඤ සූත්‍රය දී.නි.)
- බුදු දහම අනුව මක්ඛලීගේ ඉගැන්වීම අබ්‍රහ්මචරිය වාසයට අයත් වන බව.
(සන්දක සූත්‍රය -ම.නි.)

අමරාවික්ඛේප වාදය :

- ''අමරාවික්ඛේප'' යන ව්‍යවහාරයෙන් සංශය හෙවත් සැකය අර්ථවත් වන බව.
- වචනයෙන් මිනිසුන් වික්ෂිප්ත බවට පත් කරන බැවින් මෙය ''වාචාවික්ඛේපවාදය'' ලෙස ද හැඳින්වෙන බව. (බ්‍රහ්මජාල සූත්‍රය දී.නි.)
- ආඳකු මෙන් අල්ලා ගැනීමට අපහසු ය යන අදහස නොහොත් ආඳකු මෙන් ලිස්සා යන අදහස අමරාවික්ඛේප වාදය බව. (අටුවා මතය)
- සංජය බෙල්ලට්ඨිපුත්තතුමා කිසි දු ප්‍රශ්නයකට ඍජු පිළිතුරක් නොදී මගහැරීම නිසා අමරාවික්ඛේපවාදියකු වශයෙන් හැඳින්වෙන බව.
- අමරා වික්ඛේපවාදය බිහි වීමට හේතු හතරක් ඇතැයි බුදු දහමේ ඉගැන්වෙන බව.
  i. ''මුසාවාද භයා මුසාවාද පරිජෙගුච්ඡා'' මුසාවාද භයෙන් හා ඊට පිළිකුලෙන් ස්ථිර නිගමනයක් නොදීම.
  ii. ''උපාදාන භයා උපාදාන පරිජෙගුච්ඡා'' උපාදානයට බියෙන් හා ඊට පිළිකුලෙන් ස්ථිර නිගමනයක් නොදීම.
  iii. ''අනුයොග භයා අනුයොග පරිජෙගුච්ඡා'' අනුන් විසින් ප්‍රශ්න කිරීමට බියෙන් හා ඊට පිළිකුලෙන් ස්ථිර නිගමනයක් නොදීම.
  iv. ''මන්දා මොහමුත්තා''අනවබෝධය නිසා ස්ථිර නිගමනයක් නොදීම.

(බ්‍රහ්මජාල සූත්‍රය -දී.නි.)

- සංජයබෙල්ලට්ඨිපුත්තතුමා වචනයෙන් ස්ථිර නිගමනයක් නොදී සිටීමට පංච නිෂේධන ක්‍රමය අනුගමනය කළ බව.

  i. එවංතිපි මෙ නො - මෙසේ යැයි මගේ අදහසක් නැත
  ii. තථාතිපි මෙ නො - එසේ යැයි ද මගේ අදහසක් නැත
  iii. අඤ්ඤථාපි මෙ නො - අන් අයුරක් යැයි ද මගේ අදහසක් නැත
  iv. නො තිපි මෙ නො - නැතැයි ද මගේ අදහසක් නැත
  v. නො නො තිපි මෙ නො - නැත්තේ නැතැයි ද මගේ අදහසක් නැත

  මෙම ක්‍රමයෙන් මෙතුමා ප්‍රශ්නවලට පිළිතුරු නොදී සිටි බව. (සාමඤ්ඤඵල සූත්‍රය දී.නි.)

- එක් ගැටලුවකට පිළිතුරු දීමේ දී කිසිදු අන්තවාදයකට නොවැටුණ බැවින් ඔහුගේ දර්ශනය ''අනේකාන්තවාදයක්'' වන බව.
- මන්දාමොහමුත්තා යන අමරාවික්ඛේප න්‍යායය අනුගමනය කළ බැවින් මෙතුමා අඥෙයවාදියකු ලෙස හැඳින්විය හැකි බව.
- කිසිවක් පිළිබඳ ස්ථිර නිගමනයකට නො පැමිණ සැකය පමණක් ඉතිරි කළ නිසා සංශයවාදියකු ද වන බව.
- බුදු දහමට අනුව සැකය හෙවත් සංශය නීවරණ ධර්මයක් වන බව.
- හුදක් සංශය ම ප්‍රමාණාත්මක පියවරක් ලෙස ගැටලු විසඳීමෙහි ලා භාවිත නො කළ යුතු යැයි බුදු දහම උගන්වන බව.
- ප්‍රශ්න මගහැරීම වෙනුවට ඒවා විසඳා ගනිමින් දෙලොව ජය ගැනීමට බුදු දහම උගන්වා ඇති බව.
- අවශ්‍ය තැනක දී සැක ඉපදීම සාධාරණ නමුත් ධර්මානුකූල ව නිරාකරණය කොටගෙන ඉදිරියට යෑම බෞද්ධ පිළිවෙත බව. (කාලාම සූත්‍රය අ.නි.)

**සප්තපදාර්ථ වාදය :**

- සත්ත්වයා පදාර්ථ හතක සමවායයෙන් නිර්මිත බව පිළිගැනීම සප්තපදාර්ථ වාදය හෙවත් සප්තකාය වාදය ලෙස හඳුන්වන බව.
- පකුධකච්චායනතුමා සියලු සත්ත්වයෝ පඨවි, ආපෝ, තෙජෝ, වායෝ, සුඛ, දුක්ඛ සහ ජීව යන පදාර්ථ සතෙන් නිර්මාණය වී ඇතැයි ඉගැන්වූ බැවින් සප්තපදාර්ථ වාදියකු බව.
- මෙම පදාර්ථ සත කිසිවකු විසින් නො කරන ලද, කිසිවකුගේ විධානයෙන් සිදු නොවූ, කිසිවකුගේ නිර්මාණයක් නොවූ, වෙනත් අයුරකින් නොමවන ලද ස්ථිර වූ ඉන්ද්‍රඛීලයක් වැනි වූ ස්වභාවයක් දරන්නේ යැයි පකුධකච්චායනතුමා උගන්වන බව.
- සප්ත පදාර්ථ තනි තනි ව කේවල වශයෙන් පවත්නා බව.
- කිසි දු ආකාරයකින් වෙනස් නොවන පදාර්ථ හතක් ඇතැයි උගන්වන බැවින් මෙතුමා ''බහුත්වවාදියකු'' වන බව.
- කර්මය හා විපාකය නො පිළිගන්නා බැවින් අකිරියවාදියකු ද වන බව.
- භෞතික වූ සාධක ඇසුරින් පුද්ගලානුබද්ධ ක්‍රියාකාරිත්වය විස්තර කරන බැවින් මෙතුමාගේ දර්ශනය භෞතිකවාදයක් ලෙස ද නම් කරන බව.

- අනෙක් අතට ස්ථිර වූ සප්ත පදාර්ථ පිළිගන්නා බැවින් ආත්මාවාදියකු ලෙස ද හැඳින්විය හැකි බව.
- මරණින් පසු සත්ත්වයාගේ පැවැත්ම ප්‍රතික්ෂේප කෙරෙන නිසා උච්ඡේදවාදියෙකු වශයෙන් ද හැඳින්විය හැකි බව.
- සප්තකායවාදය මනුෂ්‍ය සදාචාරය අර්ථසම්පන්න කිරීමට මහත් බාධකයක් යැයි බුදුදහම අනුව පෙන්වා දිය හැකි බව.
- ''යමෙක් තියුණු අවියක් ගෙන හිස සිඳින්නේ නම් එයින් කිසිවෙක් කිසිවකුගේ ජීවිතය තොර නො කරයි '' යන එතුමාගේ මතය බුදු දහමේ කර්මවාදී, කිරියවාදී ඉගැන්වීම් මඟින් බැහැර කෙරෙන බව.
- බුදු දහම සත්ත්ව, පුද්ගල, සංඥා පරමාර්ථ වශයෙන් නො සලකතත් හටගත් සත්ත්වයාගේ වෙනසක් ඇති නොවන අතර සම්මුතිය බැහැර නො කෙරෙන බව.
- චේතනා පූර්වංගම ක්‍රියාවන් පිළිබඳ වගකීම බුදු දහමින් අර්ථවත් කිරීම නිසා මෙතුමාගේ ඉගැන්වීම් ප්‍රතික්ෂේප වන බව.

පුබ්බේකත හේතුවාදය :

- සියල්ල පෙර කරන ලද කර්ම අනුව සිදුවේය යන්න පුබ්බේකතහේතුවාදය බව.
- සියලු සුව දුක් වින්දන පූර්ව කර්ම හේතුවෙන් සිදු වේ යැයි නිගණ්ඨනාතපුත්තතුමා ඉගැන්වූ බැවින් නියතිවාදයක් ප්‍රකට වන බව.
- සියලු කර්ම ගෙවා අවසන් කිරීමෙන් හා ඥානය වර්ධනය කර ගැනීමෙන් කේවල ඥානය ලබාගත හැකි ය යන්න ජෛන ඉගැන්වීම බව
- චතුයාම සංවරය, පූර්ව කර්මයේ බලපෑම, පරම අවිහිංසාවාදය, ස්‍යාද් වාදය මෙතුමාගේ ඉගැන්වීම් වූ බව.
- එතුමා ඉගැන්වූ පංචවිරතිය, පුරාණ කර්මය ක්ෂය කිරීමට අදාළ දුෂ්කර ව්‍රත සංඛ්‍යාවට ඇතුළත් වන බව.
- ත්‍රිදණ්ඩ ඉදිරිපත් කළ මෙතුමා කාය දණ්ඩය බලවත් වන්නේ යැයි දේශනා කළ බව.
- ඊශ්වරයකුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කළ බව.
- ශරීරය නිසා ආත්මය කර්ම රැස් කරන බව දේශනා කිරීමෙන් ආත්මවාදියකු බව.
- චතුයාම සංවරයෙන් වර්තමාන කර්ම බිහි වීම වළක්වාලීමත් අත්තකිලමථානුයෝගයෙන් අතීත කර්ම ක්ෂය කිරීමත් සිදු වන්නේ යැයි මෙතුමා ඉගැන්වූ බව.
  (පුරාණානං කම්මානං තපසා ව්‍යන්තිභාවා නවානං කම්මානං අකරණං ...)
  (දේවදහ සූත්‍රය -ම.නි.)
- පුද්ගලයා කර්මවලින් ආවරණය වී පවත්නා තුරු සසර ගමන් කරන්නේ යැයි මෙතුමා ඉගැන්වූ බව.
- සියල්ල පූර්ව කර්මය විසින් විනිශ්චය කර ඇත්නම් පුද්ගලයාට අර්ථවත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අවකාශ නො ලැබෙන්නේ ය යන්න බෞද්ධ මතය බව.
- පුබ්බේකතහේතුවාදයෙන් ස්වච්ඡන්දතාව ප්‍රතික්ෂේප වන බව.

- සියල්ල පූර්වකෘත කර්මයෙන් සිදු වන්නේ යැයි සලකා ගත්තවුන්හට ශ්‍රමණවාදයක් නැතැයි බුදු දහමේ ඉගැන්වෙන බව.
- චේතනාව පූර්වංගම වී තිදොරින් කර්ම කරන්නේ ය යන බෞද්ධ අදහසින් කර්මය සඳහා කාය දණ්ඩ ප්‍රමුඛ වේ යන්න නිෂේධනය වන බව.
- අත්තකිලමථානුයෝගය දුක්ඛ, අනරිය, අනත්ථ සංහිතා යන යෙදුම්වලින් බුදු දහම විචාරයට ලක් වන බව (ධම්මචක්කප්පවත්තන සූත්‍රය -ස.නි.)
- පරම අවිහිංසාවාදය පිළිගැනීම හා අනුගමනය කිරීම ව්‍යාවහාරික ජීවිතයේ දී ප්‍රායෝගික නොවන බව.
- පංච නියාම ධර්ම පිළිබඳ ඉගැන්වීම අනුව සියල්ල කර්මයෙන් සිදු වේ යැයි බුදු දහම නො පිළිගන්නා බව.
- රෝග කාරක හේතු අතුරින් කර්මය එකක් පමණක් ලෙස දක්වා තිබීමෙන් කර්මය එක ම හේතුව යැයි නො පිළිගන්නා බව.
- ලෞකික ලෝකෝත්තර සැප ළඟා කර ගැනීමට උත්සාහය, වීර්යය, අධිෂ්ඨානය පෙරදැරි ව අප්‍රමාදී ව කායික, වාචසික සහ මානසික ශික්ෂණයෙහි යෙදිය යුතු යැයි අවධාරණය කරන බුදු දහම පුබ්බේකත හේතුවාදය බැහැර කරන බව.
- පුද්ගලයාගේ දෙලොව දියුණුවට උපකාරී වන අටතිසක් මංගල කරුණු උගන්වන බුදු දහමේ ''පෙර කරන ලද පින'' එක් කරුණක් ලෙස පමණක් දක්වා ඇති බව.
- සියල්ල පූර්වකෘත කර්මය නිසා සිදු වන්නේ නම් ජෛනයන්ගේ දුෂ්කර ව්‍රත සමාදානය, පූර්වකෘත කර්ම නිසා ම සිදු වන්නේ යැයි බුදු දහම උගන්වන බව.
(දේවදහ සූත්‍රය -ම.නි.)
- පෙර සිටි භව හෝ කරන ලද කර්ම ප්‍රමාණය හෝ ගෙවා දැමූ කර්ම ප්‍රමාණය හෝ ගෙවීමට ඇති කර්ම ප්‍රමාණය හෝ නොදන කර්ම ගෙවා දැමීමට තපස් රැකීම අර්ථ විරහිත යැයි බුදු දහමේ ඉගැන්වෙන බව. (දේවදහ සූත්‍රය- ම.නි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. ෂට් ශාස්තෘවරුන්ගේ මූලික ඉගැන්වීම් දැක්වෙන වගුවක් පිළියෙළ කරන්න.
2. ෂට් ශාස්තෘ දර්ශන සහ සමාජ සදාචාරය මැයෙන් රචනාවක් ලියන්න.
3. විවිධ ආගමික මතවාද පිළිබඳ කරුණු සම්පිණ්ඩනය කරමින් අත්පොතක් සකසන්න.
4. මක්ඛලිගෝසාලගේ නියතිවාදය පිළිබඳ බෞද්ධ මතය යන මැයෙන් ශිෂ්‍ය සමිතියේ කතාවක් පවත්වන්න.
5. ෂට් ශාස්තෘවරුන් හඳුන්වා ඔවුන්ගේ දහම පැහැදිලි කරමින් පුවත්පතකට ලිපියක් ලියන්න.
6. බුදු රජාණන් වහන්සේ නිර්මාණවාදය පිළිබඳ ව දැක්වූ මතය පැහැදිලි කරන ලිපියක් ලියන්න.

**නිපුණතාව 4.0 :** පුද්ගලයා හා සමාජය පිළිබඳ බුද්ධකාලීන ආගමික චින්තා තුලනාත්මක ව හා විචාරාත්මක ව අධ්‍යයනය කර යථාර්ථවාදී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 4.3 :** සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි බුද්ධි ගෝචර බව පිළිගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 26 යි.

**ඉගෙනුම් පල :**

- සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විවරණය කරයි.
- සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි බුද්ධි ගෝචර බව අගය කරයි.
- මනුෂ්‍යත්වය අගය කරමින් ජීවත් වෙයි.
- වාද භේද බැහැර කර සහයෝගයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ලෝකයේ හා සමාජයේ ප්‍රභවය හා විකාශය (ඊශ්වර) කාර්යයක් නොව විවිධ හේතු ප්‍රත්‍යයයන් නිසා ඇති වී පරිණාමයට පත් වූවක් බවත්, එහි වෙසෙන සියල්ලන් සාමූහික සහජීවනයෙන් එකිනෙකාගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන ලෙස ජීවත් වීම අත්‍යවශ්‍ය කරුණක් බවත් තහවුරු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්**

- බුදු දහමට අනුව ලෝකය හා සමාජය ඊශ්වරයකුගේ හෝ මහාබ්‍රහ්මයාගේ හෝ වෙනත් සර්වබලධාරියකුගේ හෝ නිර්මාණයක් නොවන බව.
- ලෝකයත්, සමාජයත් ප්‍රභව වීම මෙන් ම විකාශය ද හේතුප්‍රත්‍යය න්‍යායය හෙවත් ප්‍රතීත්‍යසමුත්පාද සිද්ධාන්තයට අනුව සිදුවන බව.
- පුද්ගලයාගේ මෙන් ම සමාජ සංස්ථාවේත් සමස්ත භෞතික පරිසරයේත් විකාශය ක්‍රමික පරිණාමීය ක්‍රියාවලිය මඟින් ප්‍රකට කෙරෙන බව.
- සත්ත්වයාගේ මානසික පරිණාමය භෞතික පරිණාමය කෙරෙහි බලපාන බව.
- සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යත්වය බිහි වූ බව.
- පාරිසරික, මානසික, ආර්ථික, දේශපාලනික, ආචාරධර්මීය සාධක මිනිස් සමාජයේ පරිණාමය කෙරෙහි බලපා ඇතැයි අග්ගඤ්ඤ සූත්‍රයේ පෙන්වා දෙන බව.
- මිනිස් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස විවිධ සමාජ සංස්ථා, සමාජ පන්ති, කුල, ජාති, ආගම් සහ වෘත්තීය තත්ත්වයන් ආදිය බිහි වී විකාශයට පත් වූ බව.
- පරිණාමවාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මඟින් නිර්මාණවාදය හා අහේතුවාදය ප්‍රතික්ෂේප වන බව.

- සමාජය තුළ මිනිසා ප්‍රමුඛ වුව ද සත්ත්ව ප්‍රජාව ද ගංගා ඇළදොළ ද ගස්වැල් ආදිය ද අහස සහ මහ පොළොව අතර සියල්ල ද ආරක්ෂා කළ යුතු බව.
- විවිධ හේතු නිසා විෂමතා පැවතිය ද උස් පහත්කම්, වාද භේද බැහැරලා මිනිසත්කම අගයමින් සහයෝගයෙන් කටයුතු කිරීම නිසා ස්වාර්ථ හා පරාර්ථ සාධනය සිදුවන බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. සමාජ ප්‍රභවය පිළිබඳ නිර්මාණවාදී ආගමික මතවාද එකතු කර වාර්තාවක් සකසන්න.
2. ''සමාජ පරිණාමය බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් '' යන මැයෙන් කතාවක් පැවැත්වීමට අවශ්‍ය තොරතුරු එකතු කරන්න.
3. ''ලෝකයේ අනාගතය උදෙසා මිනිසාගේ වගකීම්'' යන මැයෙන් රචනාවක් ලියන්න.
4. අග්ගඤ්ඤ සූත්‍රයට අනුව ලෝකයේ පැවැත්ම පරිණාමීය ක්‍රියාවලිය අනුව සිදුවන අයුරු පැහැදිලි කෙරෙන ලිපියක් ලියන්න
5. පටිච්ච සමුප්පාද ධර්මයට අනුව විශ්වයේ පැවැත්ම සිදු වන ආකාරය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
6. ස්වාර්ථ හා පරාර්ථ සාධනය සිදු වන ආකාරය සූත්‍රගත දේශනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

**පරිශීලනයට :**

| | |
|---|---|
| • බ්‍රහ්මජාල සූත්‍රය | දීඝ නිකාය |
| • අග්ගඤ්ඤ සූත්‍රය | දීඝ නිකාය |
| • සාමඤ්ඤඵල සූත්‍රය | දීඝ නිකාය |
| • සන්දක සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • වාසෙට්ඨ සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • මධුර සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • අස්සලායන සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • උපාලි සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • දේවදහ සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • අපණ්ණක සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • පාථික සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • මහාසකුළුදායී සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • චූළසකුළුදායී සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • අන්ධකාර සූත්‍රය | සංයුක්ත නිකාය |

- අරුණවතී සූත්‍රය — සංයුක්ත නිකාය
- සත්තසුරියුග්ගමන සූත්‍රය — අංගුත්තර නිකාය
- අචින්තෙය්‍ය සූත්‍රය — අංගුත්තර නිකාය
- මහාලී සූත්‍රය — අංගුත්තර නිකාය
- ඒකක නිපාතය — අංගුත්තර නිකාය
- ඍග්වේදය x-90 පුරුෂ සූක්තය
- උසස් පෙළ බුද්ධ ධර්මය — කොස්වත්තේ අරියවිමල හිමි (1996) සමයවර්ධන ප්‍රකාශකයෝ, කොළඹ 10.
- බෞද්ධ සංස්කෘතිය පසුබිම හා මූලධර්ම — දේවාලේගම මේධානන්ද හිමි (2006) කර්තෘ ප්‍රකාශන
- බුදු සමයේ උදාව — රත්නපුරේ රාහුල හිමි (2015) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.
- වෛදික සාහිත්‍යය — ජයදේව තිලකසිරි (1967), ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්, කොළඹ
- භාරතීය දර්ශන ඉතිහාසය — ජිනදාස කළුපහන (2002) තිමිර ප්‍රකාශන, නුගේගොඩ.
- ශ්‍රමණ සම්ප්‍රදාය — ආනන්ද විජේරත්න(2004) කර්තෘ ප්‍රකාශන
- භාරතීය දර්ශන — බලදේව උපාධ්‍යාය
- බෞද්ධ ශිෂ්ටාචාරයේ මූලධර්ම හා වංශකථාව — චන්ද්‍රිම විජේබණ්ඩාර, එච්. එම්. මොරටුවගම (1990) ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්, කොළඹ.

**නිපුණතාව 5.0** : බුදු රජාණන් වහන්සේ සහ භාරතීය භික්ෂූන් වහන්සේ විසින් ධර්ම විනයේ ආරක්ෂාව සඳහා යොදන ලද විධිවිධාන අධ්‍යයනය කරමින් ශාසනික උන්නතියට හා ආරක්ෂාවට කැප වෙයි.

**නිපුණතා මට්ටම 5.1** : ධර්ම විනයේ ආරක්ෂාව හා චිර පැවැත්ම පිණිස බුදු රදුන් විසින් යොදන ලද විධිවිධාන හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20 යි.

**ඉගෙනුම් පල** :

- ධර්ම විනයේ ආරක්ෂාව හා චිර පැවැත්ම පිණිස බුදු රජාණන් වහන්සේ විසින් යොදන ලද ක්‍රියාමාර්ග අධ්‍යයනය කරයි.
- බුදු සසුනේ චිර පැවැත්මට අදාළ ක්‍රියාමාර්ග අගයයි.
- ධර්ම විනයේ චිර පැවැත්මට දායක වෙයි.
- නූතන තාක්ෂණය භාවිත කරමින් ධර්ම සන්නිවේදනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු රජාණන් වහන්සේ සහ භාරතීය භික්ෂූන් වහන්සේ විසින් ධර්ම විනය ආරක්ෂා කිරීම උදෙසා යෙදූ විධිවිධාන අධ්‍යයනය කොට එහි ආරක්ෂාවට කැප වීම හා නූතන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ධර්ම සන්නිවේදනයට හා ග්‍රන්ථ සංරක්ෂණයට සිසුන් නැඹුරු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**ශික්ෂාපද හා විනය නීති පැනවීම**

- ප්‍රථමාභිසම්බෝධි සමයේ සසුන්ගත වූ භික්ෂූන්ගේ ඒකායන පරමාර්ථය සසර දුකින් අත්මිදීම වූ බැවින් ශික්ෂාපද පැනවීමේ අවශ්‍යතාවක් පැන නොනැගි බව

(සීලක්ඛන්ධ වග්ගය - දී.නි.)

- මුල් විසි වස ඉක්මයද්දී ආසවට්ඨානීය ධර්ම පහළ වූ බව
  1. රත්තඤ්ඤු මහත්තතා - චිරරාත්‍රඥ බවට පැමිණීම
  2. වේපුල්ල මහත්තතා - සංඝයා පිරිස් වශයෙන් බහුල වීම
  3. ලාභග්ග මහත්තතා - ලාභ ප්‍රයෝජනවල මහත්වයට පැමිණීම
  4. බාහුසච්ච මහත්තතා - බහුශ්‍රැත බව වැඩි වීම
  5. යසග්ග මහත්තතා - කීර්තියේ අගතැන් වීම

(භද්දාලි සූත්‍රය - ම. නි.)

- විනයේ අපේක්ෂාව භික්ෂුවගේ චරිත සංවර්ධනය බව.

(භද්දාලි සූත්‍රය - ම. නි.)

- ශික්ෂාපද පැනවීමේ හා සංශෝධනය කිරීමේ බලය බුදු රජාණන් වහන්සේ විසින් ම දරන ලද බව. (වේරඤ්ජ කාණ්ඩය - පාරාජික පාළි)
- උදායි, සුදින්න, ඡබ්බග්ගිය, සුනක්ඛත්ත, අරිට්ඨ, සාති ආදි භික්ෂූන්ගේ ශ්‍රමණ සාරූප්‍ය නොවූ හැසිරීම් පාලනය කරනු පිණිස විනය ශික්ෂා පැනවූ බව.

(පාරාජික කාණ්ඩය - පාරාජික පාළි)

- දුර්මත දුරු කිරීම් මෙන් ම අන්‍යයන්ට කන් දීම් වශයෙන් ද ශික්ෂා පැනවූ බව.

(වස්සූපනායිකක්ඛන්ධක - මහාවග්ග පාළි)

- විනය අනුග්‍රහ පිණිස භික්ෂූන් වහන්සේලාට ශික්ෂාපද - 227ක් ද (සප්ත අධිකරණ සමථ ද ඇතුළත් ව) භික්ෂුණීන් වහන්සේලාට ශික්ෂාපද 311ක් ද පැනවූ බව.

(උපෝසථක්ඛන්ධකය - මහාවග්ග පාළි)

- භික්ෂුවගේ ආයති සංවරයත්, මහජන ප්‍රසාදයත්, ධර්මයේ චිර පැවැත්මත් සලකා විනය නීති පැනවූ බව. (භද්දාලි සූත්‍රය - ම. නි.)
- ධර්ම විනයේ පැවැත්ම පිණිස, අර්ධ මාසික ව රැස්වීම, ප්‍රාතිමෝක්ෂ උද්දේසය, ආපත්ති ආරෝචනය, වත්මානත් පිරීම ආදි ශාසනික ක්‍රියා අනුදත් බව.

(උපෝසථක්ඛන්ධකය - මහාවග්ගපාළි)

- විනය කඩ කළ විට ඊට දඬුවම් ලෙස, තජ්ජනීයකම්ම, නිස්සයකම්ම, පබ්බාජනීයකම්ම, පටිසාරණීයකම්ම, උක්ඛේපනීයකම්ම පනවා ඇති බව.

**ශ්‍රාවක - ශ්‍රාවිකාවන් ධර්මදූත කාර්යයෙහි යෙදවීම**

- ප්‍රථම ධර්මදූත සේවාවෙන් ධර්ම ප්‍රචාරය ඇරඹී බව (මහාඛන්ධක - මහාවග්ගපාළි)
- ධර්ම ප්‍රචාරය නිසා සමාජයට බුදු සසුන හඳුන්වාදීමට හැකියාව ලැබුණු බව
- සාර්ථක ධර්ම ප්‍රචාරයක් අරමුණු කරගෙන විශේෂ තනතුරු ප්‍රදානය කළ බව
  ධර්ම කථිකයන් අතර අග්‍රස්ථානය - පුණ්ණමන්තානිපුත්ත තෙරුන් වහන්සේ
  කෙටියෙන් දෙසූ දහම් සවිස්තර ව කීමේ අග්‍රස්ථානය - මහාකච්චාන තෙරුන් වහන්සේ
  විචිත්‍රධර්ම කථිකයන් අතර අග්‍රස්ථානය - කුමාරකාශ්‍යප තෙරුන් වහන්සේ
  ධර්ම භාණ්ඩාගාරික ධූරය හා බහුශ්‍රැත භික්ෂූන් අතර අග්‍රස්ථානය - ආනන්ද තෙරුන් වහන්සේ
  විචිත්‍ර ධර්ම කථික භික්ෂුණිය - ධම්මදින්නා තෙරණිය
  විචිත්‍ර ධර්ම කථික උපාසක - චිත්ත ගෘහපති (ඒතදග්ගපාළි - අ.නි.)
- සැරියුත්, මුගලන් හිමිවරුන්ගේ හැකියාවන් අගය කළ බව (සච්චවිභංග සූත්‍රය ම.නි.)
- නන්දක හිමියන් සිදු කළ ධර්ම දේශනය අසා සිට බුදු රජාණන් වහන්සේ එය අගය කළ බව

(නන්දක සූත්‍රය අ.නි.)

- කපිලවස්තු පුර ශාක්‍යයන්ට අනඳ හිමියන් විසින් සේඛ පටිපදාව පැහැදිලි කළ අවස්ථාවේ බුදු රජාණන් වහන්සේ එය අගය කළ බව (සේඛ සූත්‍රය ම.නි.)

- විශාඛ ගෘහපතියා ඇසූ ප්‍රශ්නවලට ධම්මදින්නා තෙරණිය ලබාදුන් පිළිතුරු ඉතා සාර්ථක යැයි බුදු රජාණන් වහන්සේ විසින් ඇගයීමට ලක් කරන ලද බව. (චූල්ලවේදල්ල සූත්‍රය ම.නි.)
- ධර්මය දේශනා කිරීමේ දී ශ්‍රාවකයා කෙරෙහි කරුණාවෙන්, දයාවෙන්, අනුකම්පාවෙන්, නිවැරදි වූ ධර්මය වහා අවබෝධ වන අයුරින් ධර්මයේ සුධර්මතාව ප්‍රකට කරමින් ක්‍රියා කළ යුතු යැයි අනුදැන වදාළ බව. (ඛුද්දකවත්ථුක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- සකාය නිරුක්තියෙන් ධර්මය පිරිවහන්නට බුදු රජාණන් වහන්සේ අවසර දුන් බව. (ඛුද්දකවත්ථුක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)

### තනතුරු පිරිනැමීම

- විවිධ හැකියා, දක්ෂතා හා කැප කිරීම් පදනම් කරගෙන සිවුවනක් පිරිසට ම ශාසනික තනතුරු රැසක් ප්‍රදානය කොට ඇති බව. (ඒතදග්ගපාළි - අ.නි.)
- ධර්මධර විනයධර ආදි භික්ෂූන් පත් කළ බව
- සේනාසන පඤ්ඤාපක, භාණ්ඩාගාරික ආදි විශේෂ තනතුරු ද පත් කළ බව (සේනාසනක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)

### ගිහි ශ්‍රාවක - ශ්‍රාවිකා අනුග්‍රහය

- ගිහි ශ්‍රාවක - ශ්‍රාවිකාවන් බුදු සසුනේ පැවැත්මට, රැකවරණයට දැක්වූ අනුග්‍රහ ලබා ගැනීම බුදු රජාණන් වහන්සේ විසින් ඉවසා වදාරන ලද බව (සේනාසනක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාගේ සුවපහසුව පිණිස වෙහෙර විහාර තනවා පූජා කළ බව (සේනාසනක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- සසුනට අනුග්‍රහය හා දායකත්වය දැක්වූ පිරිස අගයමින් ගිහි ශ්‍රාවක - ශ්‍රාවිකා පිරිසට ද විවිධ තනතුරු ප්‍රදානය කළ බව (ඒතදග්ග පාළි අ.නි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. ධර්මවිනයේ ආරක්ෂාව උදෙසා බුදු රජාණන් වහන්සේ ගත් ක්‍රියාමාර්ග සහ එහි සාධනීය බව ධර්මවිනයේ රැකවරණයට හේතු වූ අයුරු දැක්වෙන සටහනක් පිළියෙළ කරන්න.
2. විනය ශික්ෂා පැනවීමට තුඩුදුන් හේතු ලැයිස්තුවක් ලෙස සකසන්න.
3. ශ්‍රාවක- ශ්‍රාවිකාවන් ධර්මදූත සේවයේ යෙදවීම සහ එහි ප්‍රතිඵල දැක්වෙන වගුවක් නිර්මාණය කරන්න.
4. ශාසනයේ පැවැත්ම උදෙසා ශ්‍රාවක පිරිසගේ දායකත්වය අගයමින් පුවත්පතකට ලිපියක් ලියන්න.
5. ශ්‍රාවක පිරිස ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය දැක්වෙන ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
6. ශ්‍රාවිකා පිරිස ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය දැක්වෙන ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

**නිපුණතාව 5.0** : බුදු රජාණන් වහන්සේ සහ භාරතීය භික්ෂූන් වහන්සේ විසින් ධර්ම විනයේ ආරක්ෂාව සඳහා යොදන ලද විධිවිධාන අධ්‍යයනය කරමින් ශාසනික උන්නතියට හා ආරක්ෂාවට කැප වෙයි.

**නිපුණතා මට්ටම 5.2** : බෞද්ධ චින්තනයේ පෝෂණයට හා ව්‍යාප්තියට ධර්ම සංගායනාවලින් සැලසුණු සේවය අධ්‍යයනය කර ශාසන චිරස්ථිතියට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 26 යි.

**ඉගෙනුම් පල** :

- ථෙරවාදී සංගායනාවල පසුබිම හා ප්‍රතිඵල අධ්‍යයනය කරයි.
- අභියෝග හමුවේ ධර්ම විනය සංරක්ෂණය කළ යුතු ආකාරය පෙන්වා දෙයි.
- ශාසනය වෙනුවෙන් ඉටු කළ යුතු කාර්ය භාරය මැනවින් ඉටු කරයි.
- සාමූහික තීරණ ක්‍රියාත්මක කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු රජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ධර්ම විනය සංරක්ෂණය උදෙසා භාරතීය භික්ෂූන් වහන්සේ විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග අධ්‍යයනය කොට, ධර්ම විනය සංරක්ෂණයට ශිෂ්‍යයන් පෙලඹවීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**ප්‍රථම ධර්ම සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල**

- ථෙරීය සංගායනා පැවැත්වීමට අවශ්‍ය පසුබිම ශාසනය තුළින් ම පැන නැගුණු බව.
(පඤ්චසතිකක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයේ සිදුවූ ධර්මය විධිමත් ව පෙළගැසීම උන් වහන්සේ විසින් ම අනුමත කරන ලද බව. (සංගීති - දසුත්තර - පාසාදික සූත්‍ර - දී.නි.)
- සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශය හා ඊට පක්ෂපාත පිරිසක් ද සිටි බව.
(පඤ්චසතිකක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- දේවදත්ත, කෝකාලික, සමුද්දදත්ත, අරිට්ඨ, සාති, යමක, අස්සජි, පුනබ්බසුබ ආදි භික්ෂූන්ගේ අධර්මවාදී ක්‍රියා සංගායනාවකට අවශ්‍ය පසුබිම නිර්මාණය කළ බව.
- ධර්ම විනයවාදීන් සුරැකීම, ආනන්ද හිමියන්ට එල්ල වූ චෝදනාවලට පිළිතුරු දීම හා විසිර පැවැති ධර්මය එක්රැස් කිරීම ආදිය නිසා ධර්ම සංගායනාවක අවශ්‍යතාව මතුවූ බව.
(පඤ්චසතිකක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- සංගායනාවක අවශ්‍යතාව අවබෝධ කරගත් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ 500ක් රහතන් වහන්සේගේ සහභාගිත්වයෙන්, අජාසත් රජුගේ දායකත්වයෙන්, රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයේ සප්තපණ්ණි ගුහාවේ දී ''පඤ්චසතිකා'' නම් වූ ප්‍රථම සංගීතිය පැවැත්වූ බව.

(පඤ්චසතිකක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)

- මහාකාශ්‍යප මහරහතන් වහන්සේ උපාලි තෙරුන්ගෙන් විනය විචාරා ආනන්ද තෙරුන්ගෙන් ධර්මය ද විචාරා ධර්ම විනය සංගායනා කළ බව.
- බුද්දානුබුද්දක ශික්ෂාපද සමූහනය නො කිරීමටත් පනවන ලද ශික්ෂාපද ආරක්ෂා කිරීමටත් සංගායනාවේ දී එකඟ වූ බව. (පඤ්චසතිකක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- ආනන්ද තෙරුන්ට එල්ල වූ චෝදනා විමර්ශනය කළ බව. (පඤ්චසතිකක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- ප්‍රථම ධර්ම සංගායනාවෙන් ධර්ම විනයේ ආරක්ෂාවට අවශ්‍ය පියවර ගනිමින් දුර්මත දුරු කළ බව. (පඤ්චසතිකක්ඛන්ධක - චුල්ලවග්ගපාළි)
- ධර්ම විනය කොටස්වලට බෙදා එක් එක් භික්ෂු පරම්පරාවන්ට වගකීම් පවරා භාණක ක්‍රමයෙන් ධර්ම විනය සංරක්ෂණය කළ බව. (පඤ්චසතිකක්ඛන්ධකය - චුල්ලවග්ගපාළි)
- ඡන්න හිමියන්ට බ්‍රහ්මදණ්ඩනය පැනවූ බව. (පඤ්චසතිකක්ඛන්ධකය-චුල්ලවග්ගපාළි)

## ද්විතීය ධර්ම සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල

- බුද්ධ පරිනිර්වාණයෙන් සියවසක් ඉක්ම ගිය පසු සබ්බකාමී, යස, රේවත හිමිවරුන්ගේ ප්‍රධානත්වයෙන් හත්සිය නමකගේ සහභාගිත්වයෙන් කාලාශෝක රජුගේ අනුග්‍රහයෙන් විශාලා මහනුවර වාලුකාරාමයේ දී අටමසක් පුරා ''සත්තසතිකා'' නම් වූ දෙවන සංගීතිය පැවැත්වූ බව. (සත්තසතිකක්ඛන්ධක -චුල්ලවග්ගපාළි)
- ද්විතීය සංගීතිය පිළිබඳ තොරතුරු චුල්ලවග්ගපාළි සත්තසතිකක්ඛන්ධකය, දීපවංසය, මහාවංසය, සමන්ත පාසාදිකාව හා සංස්කෘත, චීන, තිබ්බත මූලාශ්‍රයවල ද දක්වෙනබව.
- විශාලා මහනුවර විසූ වජ්ජිපුත්තක භික්ෂූහු විනය තිබ්බත අකැප දස වස්තුවක් කැප යැයි පිළිගැනීම නිසා මෙම ද්විතීය සංගීතිය පැවැත්වූයේ යැයි ථෙරවාද මූලාශ්‍රයවල සඳහන් වන බව.
- ථෙරවාද නොවන මූලාශ්‍රයවල ද්විතීය සංගීතිය පැවැත්වීමේ හේතු ලෙස වෙනත් කරුණු සඳහන් වන බව.
- කාකණ්ඩපුත්ත යස හිමියන් මෙම දස වස්තුව දැන හඳුනාගෙන එය විනය විරෝධී යැයි දැන්වූ පසු වජ්ජිපුත්තක භික්ෂූන් විසින් උන් වහන්සේට පටිසාරණීය හා උක්ඛෙපනීය කර්ම සිදු කරන ලද බව. (සත්තසතිකක්ඛන්ධක-චුල්ලවග්ගපාළි)
- වජ්ජිපුත්තක භික්ෂූන්ට නිවැරදි වන ලෙස දැන්නුව ද එය ප්‍රතිඵල විරහිත වූ බැවින් අධර්ම-අවිනයවාදීන් බලවත් වීමට පෙර මේ සඳහා පිළියම් යෙදීමේ අරමුණෙන් පාවා නුවර, අවන්ති, දක්ෂිණාපථ ප්‍රදේශවලින් භික්ෂූන් කැඳවා සබ්බකාමී ආදි ථෙරවරුන්ගේ මූලිකත්වයෙන් උබ්බාහිකාවකින් (කමිටුවකින්) දස වස්තුව විනිශ්චය කොට ඒවා අකැප යැයි තීරණය කළ බව. (සත්තසතිකක්ඛන්ධකය -චුල්ලවග්ගපාළි)
- දස වස්තුව විනය විරෝධී යැයි විනයානුකූල ව තීරණය කොට සසුන නිර්මල ව ආරක්ෂා කරගත් බව.

- වජ්ජි භික්ෂූන් ප්‍රදේශීය පාලකයෙකුගේ අනුග්‍රහයෙන් වෙන ම සංගීතියක් පවත්වා ''මහාසාංඝික'' නමින් නිකායයක් පිහිටුවාගත් අතර එතැන් සිට ''ථෙරීය සම්ප්‍රදායය'' හා ''මහාසාංඝික සම්ප්‍රදායය'' යැයි භික්ෂු සම්ප්‍රදාය දෙකක් බිහිවී නිකාය මතභේදවලට මඟ පෑදුණු බව.

**තෙවන ධර්ම සංගායනාවේ පසුබිම හා ප්‍රතිඵල**

- බුද්ධ පරිනිර්වාණයෙන් පසු වසර දෙසියතිස්හය (236) වැන්නෙහි මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්, ධර්මාශෝක රජතුමාගේ අනුග්‍රහයෙන් පැළලුප් නුවර අශෝකරාමයේ දී දහසක් භික්ෂූන් වහන්සේගේ සහභාගිත්වයෙන් නව මසක් පුරා ''සාහස්සිකා'' නම් වූ තෙවන සංගීතිය පැවැත්වූ බව. (මෙහි වර්ෂ ප්‍රමාණය පිළිබඳ විවිධ මත පවතින බව)
- භික්ෂූන් විවිධ නිකායවලට බෙදීම, ධර්ම කරුණු පිළිබඳ විවිධ අර්ථකථන ඉදිරිපත් කිරීම, අධර්මවාදීන්, තීර්ථකයන් සසුනට ඇතුළු වීම, පොහෝ පැවුරුණු ආදි විනය කටයුතු පිළිබඳ ගැටලු මතු වීම ආදිය තෙවන සංගායනාවට මඟ පෑදූ බව.
- අශෝක රජතුමා දුසිල් මහණුන් සසුනෙන් නෙරපා හැරීම හා ශාසන පාරිශුද්ධිය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ සමඟ සාකච්ඡා කර අවශ්‍ය දැනුම ලබාගත් බව.
- දුසිල් මහණුන් සසුනෙන් නෙරපා හැර පුනරුත්ථාපනය කළ බව.
- ද්විතීය සංගීතියෙන් පසු නිකායික හා ආචාර්යවාද ලෙස සසුනට පැමිණි පරවාදයන් මර්ධනය කිරීමත් සකවාද 500ක් පමණ සමර්ථනය කිරීමත් සඳහා මොග්ගලීපුත්තතිස්ස හිමියන් කථාවත්ථුප්පකරණය සංග්‍රහ කිරීම නිසා අභිධර්ම පිටකය සම්පූර්ණ වූ බව.
- ථෙරවාද බුදු දහම භාරතය තුළ සහ ආසන්න රාජ්‍යවල ව්‍යාප්ත කිරීම පිණිස පියවර ගත් බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අනුව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීම පිණිස සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදාගත හැකි ය.

1. ප්‍රථම ධර්ම සංගායනාවට හේතු වූ පසුබිම පිළිබඳ වාර්තාවක් සකසන්න.
2. සංගායනාවේ විස්තර ඇතුළත් සටහනක් නිර්මාණය කරන්න.
3. ද්විතීය සංගායනාවට හේතු වූ දස වස්තුව ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කරන්න.
4. දෙවන සංගායනාව පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් සහිත ලිපියක්, බිත්ති පුවත්පතට නිර්මාණය කර දෙන්න.
5. තෘතීය සංගායනාවේ පසුබිම පිළිබඳ ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
6. තෙවන සංගායනාව සිදු කළ අයුරු පිළිබඳ ව ලිපියක් ලියන්න.

**පරිශීලනයට**

| | |
|---|---|
| • සීලක්ඛන්ධ වග්ගය | දීඝ නිකාය |
| • මහා පරිනිබ්බාන සූත්‍රය | දීඝ නිකාය |
| • පාසාදික සූත්‍රය | දීඝ නිකාය |
| • සංගීති සූත්‍රය | දීඝ නිකාය |
| • දසුත්තර සූත්‍රය | දීඝ නිකාය |
| • භද්දාලි සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • වත්ථූපම සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • චූල්ලවේදල්ල සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • අලගද්දූපම සූත්‍රය | මජ්ඣිම නිකාය |
| • සද්ධම්ම සම්මෝස සූත්‍රය | අංගුත්තර නිකාය |
| • නන්දක සූත්‍රය | අංගුත්තර නිකාය |
| • ඒතදග්ගපාළිය | අංගුත්තර නිකාය |
| • වේරඤ්ජකාණ්ඩය | පාරාජික පාළි |
| • පාරාජික කාණ්ඩය | පාරාජික පාළි |
| • සංඝාදිසේස කාණ්ඩය | පාරාජික පාළි |
| • සමථක්ඛන්ධකය | චුල්ලවග්ග පාළි |
| • ඛුද්දකවත්ථුක්ඛන්ධකය | චුල්ලවග්ග පාළි |
| • සේනාසනක්ඛන්ධකය | චුල්ලවග්ග පාළි |
| • පඤ්ච සතිකක්ඛන්ධකය | චුල්ලවග්ග පාළි |
| • සත්තසතිකක්ඛන්ධකය | චුල්ලවග්ග පාළි |
| • මහඛන්ධකය | මහාවග්ගපාළි |
| • බාහිරනිදානවණ්ණනා | සමන්තපාසාදිකාව |

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගැයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍යය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවර්ධනාත්මක සැලැස්මක් යොදාගත යුතු ය.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩිදියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. තව ද මෙය ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමක් වශයෙන් ද හැඳින්විය හැකි ය. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක් විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරුණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මඟින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුභවතාගේ වගකීමකි. ඇගයීමේ (තක්සේරු කිරීමේ ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයෙන් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයක් ලබාදීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම්

වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශ්වවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතුය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලිය සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන /ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්ව නිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම්
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, නිපුණතා මට්ටමට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශවල ගුරවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්වීම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මඟ හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

## ඇගයීම

වාරය : 1
උපකරණ අංක : 1
නිපුණතාව : 1.0
නිපුණතා මට්ටම : 1.1
උපකරණයේ ස්වභාවය : බුද්ධි මණ්ඩල සාකච්ඡාවක්

ක්‍රියාවලිය : බුදු රජාණන් වහන්සේගේ ගුණකායේ විශේෂතා පිළිබඳ මූලාශ්‍ර අධ්‍යයනයෙන් කරුණු සොයන්නට සිසුන්ට පවරා රැස් කරගත් කරුණු ආශ්‍රය කොටගෙන 'සමකාලීන මහණ බමුණන් අතර බුදු රජාණන් වහන්සේගේ විශේෂත්වය' යන මැයෙන් බුද්ධි මණ්ඩල සාකච්ඡාවක්

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ඉගෙනුම් ක්‍රියාවලියට අදාළ ව | සාකච්ඡා මණ්ඩලයට සහභාගිවීම හා කාල කළමනාකරණයෙන් කටයුතු කිරීම | සංවර්ධනාත්මක සාකච්ඡාව ඉවසීමෙන් ගැනීම හා යහපත් ව කටයුතු කිරීම | ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණශීලීත්වය හා අදාළ ව | සමාලෝචනය, නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 1
උපකරණ අංක : 2
නිපුණතාව : 1.0
නිපුණතා මට්ටම : 1.2
උපකරණයේ ස්වභාවය : සාකච්ඡා මණ්ඩල

**ක්‍රියාවලිය :** සිසුන් කණ්ඩායම් 4කට බෙදා පහත සඳහන් පරිදි මාතෘකා ලබා දෙන්න.

- බුදුරජාණන් වහන්සේගේ සමානාත්මතාව, සහජීවනය සහ සහනශීලීත්වය
- යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ගුණය
- තාදි ගුණය හා පද්මාකාර ජීවිතය
- බුදුරජාණන් වහන්සේ පිළිබඳ සමකාලීනයන්ගේ ඇගයීම්

- මූලාශ්‍රය අධ්‍යයනයෙන් කරුණු ගවේෂණයට සිසු කණ්ඩායම් මෙහෙයවන්න.
- රැස් කළ කරුණු කණ්ඩායම් නායකයන් මඟින් පන්තියට ඉදිරිපත් කරවා එම තොරතුරු කණ්ඩායම් අතර සංවාදාත්මකව සාකච්ඡාවක් කරන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | තෝරාගත් තොරතුරුවල තේමාවට ඇති අදාළ බව | තේමාවට ගැළපෙන තොරතුරු ඉදිරිපත් කිරීම හා කාල කළමනාකරණය | නිවැරදිව මූලාශ්‍රය දැක්වීම | තාර්කිකව හා නිරවුල්ව කරුණු ඉදිරිපත් කිරීම | ඉදිරිපත් කරන ලද කරුණුවලින් ප්‍රස්තුතය තහවුරු කිරීම | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

# ඇගයීම

වාරය : 1
උපකරණ අංක : 3
නිපුණතාව : 2.0
නිපුණතා මට්ටම : 2.1, 2.2, 2.3
උපකරණයේ ස්වභාවය : ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක්

ක්‍රියාවලිය : 2.0 නිපුණතාවට අදාළ 2.1, 2.2, 2.3 නිපුණතා මට්ටම් ආශ්‍රය කරගෙන එක් කණ්ඩායමකට කෙටි ප්‍රශ්න 20 බැගින් සකස් කිරීමට උපදෙස් දෙන්න.ඒවා එකතුකර ගෙන වඩාත් සුදුසු ප්‍රශ්න 50ක් තෝරාගෙන සිසුන් කණ්ඩායම් 2කට බෙදා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පවත්වන්න

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | සුදුසු පරිදි කණ්ඩායම් සංවිධානය කර ගැනීම | විෂය අන්තර්ගතයට අදාළ වන පරිදි ප්‍රශ්න සකස් කර ගැනීම | ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ කුසලතාව | පිළිතුරු ඉදිරිපත් කිරීමේ කුසලතාව හා ඉදිරිපත් කිරීමට දක්වන දක්ෂත්වය | නිර්මාණාත්මකව වැඩසටහන සංවිධානය කිරීමේ කුසලතාව | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

**වාරය** : 2
**උපකරණ අංක** : 4
**නිපුණතාව** : 3.0
**නිපුණතා මට්ටම** : 3.1
**උපකරණයේ ස්වභාවය** : ක්ෂේත්‍ර චාරිකා

**ක්‍රියාවලිය** : සිසුන් කණ්ඩායම් 03 ට බෙදා වාර්ෂිකව පවත්වන උපසම්පදා පිංකමකට සහභාගිවීමට සංවිධානය කරවන්න. එම විනය කර්මය සිදුවෙන පිළිවෙල පියවරෙන් පියවර ඡායාරූප ගත කරවන්න. ලබාගත් අත්දැකීම් පිළිබඳ ඡායාරූප භාවිත කරමින් වාර්තාවක් නිර්මාණය කරවන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ක්ෂේත්‍ර චාරිකාව නිවැරදි ව සංවිධානය කිරීම | නියමිත වේලාවට සහභාගි වීම හා විනයානුකූලව කටයුතු කිරීම | නියමිත කාර්යයන් නිවැරදිව ඉටු කිරීම | සංවිධානාත්මක බව | කරුණු ඉදිරිපත් කිරීමේ කුසලතාව | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ (10 න්) $\frac{\text{මුළු ලකුණු}}{2}$ |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 2

උපකරණ අංක : 5

නිපුණතාව : 3.0

නිපුණතා මට්ටම : 3.2

උපකරණයේ ස්වභාවය : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ( අසරණ සරණ සේවාවක්)

ක්‍රියාවලිය : අසරණ සරණ සේවාවක්, ප්‍රදේශයේ ඇති රෝහලකට තම දායකත්වය ලබාදීම, රෝහල් කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කොට දින වකවානු තීරණය කර ගැනීම, සිදු කළ යුතු සේවය නිශ්චිත කර ගැනීම, සැලසුම් කොට අදාළ සේවය ලබාදීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම | සංවිධාන ජාලයක් නිර්මාණය කිරීම | සහභාගීත්ව කුසලතාව | නායකත්ව හැකියාව | සමස්ත දායකත්වය හා ක්‍රමවත්බව තම කටයුතු නිම කිරීම | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 2
උපකරණ අංක : 6
නිපුණතාව : 4.0
නිපුණතා මට්ටම : 4.1
උපකරණයේ ස්වභාවය : ගවේෂණ

ක්‍රියාවලිය : පුස්තකාලය භාවිත කොට බුද්ධ ජයන්ති මුද්‍රණයට අයත් ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ දීඝ නිකාය හා මජ්ඣිම නිකාය ඇසුරෙන් 'පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් හා ඒ පිළිබඳ බෞද්ධ විචාරයට' ඇතුළත් සාධක රැස් කිරීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | මාතෘකාවට අදාළ බව | කරුණු රැස් කිරීම | ඉදිරිපත් කරන ලද කරුණුවල නිවැරදි බව | සංවිධානාත්මක බව හා ක්‍රමානුකූල බව | ක්‍රමවත්ව නියමිත කාලයට ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 3
උපකරණ අංක : 7
නිපුණතාව : 4.0
නිපුණතා මට්ටම : **4.2**
උපකරණයේ ස්වභාවය : සාකච්ඡා මණ්ඩල

**ක්‍රියාවලිය** : නිපුණතා මට්ටම 4.2ට අදාළ කරුණු මූලාශ්‍රය පරිශීලනයෙන් තහවුරු කරගෙන අකිරිවාදය පිළිබඳ 'ෂට් ශාස්තෘ ඉගැන්වීම හා ඒ පිළිබඳ බෞද්ධ විචාර' යන්න මාතෘකා කොට සාකච්ඡා මණ්ඩලයක් පවත්වන්න.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ප්‍රවේශය, මාතෘකාව හැඳින්වීම හා එහි උචිත බව | මාතෘකාවට අදාළව කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානාත්මක බව | අදහස් නිර්මාණශීලීව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීම | ප්‍රායෝගික බව හා කාල කළමනාකරණය | සම්පිණ්ඩනය, නිගමන හා නිගමන වලට හේතු ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

## ඇගයීම

වාරය : 3

උපකරණ අංක : 8

නිපුණතාව : 4.0

නිපුණතා මට්ටම : 4.3

උපකරණයේ ස්වභාවය : බිත්ති පුවත්පතක් සැකසීම

ක්‍රියාවලිය : දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරවීම. එම සූත්‍රය ඇසුරෙන් විවිධ මාතෘකා ලබා දී ඒ පිළිබඳ ලිපි නිර්මාණය කිරීමට උපදෙස් ලබාදීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති සම්බන්ධතාව | සංවිධානාත්මක බව හා නිර්මාණාත්මක බව | අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ යෝග්‍ය බව | අන්තර්ගතයේ නිවැරදි බව, නිර්මාණශීලී බව හා තර්කානුකූල බව | බිත්ති පුවත්පතේ නිර්මාණාත්මක බව | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

# ඇගයීම

වාරය : 3
උපකරණ අංක : 9
නිපුණතාව : 5.0
නිපුණතා මට්ටම : 5.2
උපකරණයේ ස්වභාවය : ප්‍රශ්න හා පිළිතුරු පොත්

ක්‍රියාවලිය : ථේරීය සංගායනාවල පසුබිම ප්‍රතිඵල ශාසනික වැදගත්කම ආශ්‍රය කර ගනිමින් කෙටි ප්‍රශ්න 50ක් සහ ඒවාට පිළිතුරු ඇතුළත් පොතක් නිර්මාණය කරවීම

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | මාතෘකාවට අදාළ පරිදි ප්‍රශ්න සකස් කිරීම | නිවැරදි පිළිතුරු සකස් කිරීම | ලේඛන කුසලතාව | අන්තර්ගතයේ නිර්මාණශීලී බව | කාලානුකූල බව හා නිමාව | ලකුණු එකතුව (20 න්) | $\frac{\text{මුළු ලකුණු}}{2}$ අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |